# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනත

---

[සහතිකය සටහන් කළේ 2000 අගෝස්තු මස 09 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2000 අගෝස්තු මස 11 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

# 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනත

[සහතිකය සටහන් කළේ 2000 අගෝස්තු මස 09 වන දින.]

එල්.ඩී.-ඕ. 84/93.

**රක්ෂණ කර්මාන්තය සංවර්ධනය කිරීමේ, අධීක්ෂණය කිරීමේ හා විධිමත් කිරීමේ කාර්යය සඳහා රක්ෂණ මණ්ඩලයක් පිහිටුවීම පිණිස ද, 1962 අංක 25 දරන රක්ෂණ පාලන පනත ඉවත් කිරීම පිණිස ද, ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද, වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :-

1. මේ පනත 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන (මෙහි මින් මතු "නියමිත දිනය" යනුවෙන් සඳහන් කරනු ලබන) යම් දිනයක එය ක්‍රියාත්මක විය යුතු ය. ලුහුඬු නාමය.

## I වන කොටස

### ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය පිහිටුවීම හා එහි සංයුතිය

2. (1) (මෙහි මින් මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය යනුවෙන් හඳුන්වනු ලබන මණ්ඩලයක් පිහිටුවනු ලැබිය යුතු අතර, ඒ මණ්ඩලය ශ්‍රී ලංකාවේ රක්ෂණ කර්මාන්තය සංවර්ධනය කිරීම, අධීක්ෂණය කිරීම හා විධිමත් කිරීම සම්බන්ධයෙන් වග කිව යුතු ය. ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය පිහිටුවීම.

(2) මණ්ඩලය, (1) වන උපවගන්තියෙන් ඊට දී ඇති නාමයෙන් සංස්ථාවක් විය යුතු අතර, එයට අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් තිබිය යුතු ය. තවද මණ්ඩලය විසින්, ඒ නාමයෙන් නඩු පැවරීම ද මණ්ඩලය විසින් නඩු පවරනු ලැබීම ද කරනු ලැබිය හැකි ය.

3. ශ්‍රී ලංකාවේ රක්ෂණ ව්‍යාපාරය, ගෞරවාන්විතව ද රක්ෂණ සහතික දරන්නන්ගේ හා අනාගත රක්ෂණ සහතික දරන්නන්ගේ සම්බන්ධතා ආරක්ෂා වන වෘත්තියමය හා විචක්ෂණ ආකාරයෙන් ද, කර ගෙන යනු ලබන බවට වගබලා ගැනීම, මණ්ඩලයේ අරමුණ හා වගකීම වන්නේ ය. මණ්ඩලයේ අරමුණ හා වගකීම.

4. (1) මණ්ඩලය පහත සඳහන් සාමාජිකයන්ගෙන්, එනම්- මණ්ඩලයේ සංයුතිය.

(අ) භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයාගෙන් ;

(ආ) මුදල් මණ්ඩලය විසින් නම් කරනු ලබන ශ්‍රී ලංකා මහ බැංකුවේ නියෝජ්‍ය අධිපතිවරයකුගෙන් ;

(ඇ) ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගෙන් ;

(ඈ) රක්ෂණ, වාණිජ, මූල්‍ය කළමනාකරණය, ව්‍යාපාර කළමනාකරණය, ආර්ථික විද්‍යාව, නීතිය යන ක්ෂේත්‍රයන්හි හෝ වෙනත් යම් අදාළ ක්ෂේත්‍රයක ශාස්ත්‍රීය හෝ වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද ලබා ඇති තැනැත්තන් අතුරෙන් අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන (මේ පනතේ "පත් කළ සාමාජිකයන්" යනුවෙන් සඳහන් කරනු ලබන) සාමාජිකයන් හතර දෙනකුගෙන්

සමන්විත විය යුතු ය.

(2) අමාත්‍යවරයා විසින් මණ්ඩලයේ සාමාජිකයන් අතුරෙන් එක් සාමාජිකයකු, මණ්ඩලයේ සභාපතිවරයා ලෙස නම් කරනු ලැබිය යුතු ය.

(3) මණ්ඩලයේ පත් කළ සාමාජිකයන්ගේ ධුර කාලය, මණ්ඩලයේ සාමාජිකයන්ට ගෙවිය යුතු පාරිශ්‍රමික, මණ්ඩලයේ රැස්වීම් සහ මුද්‍රාව යන කාරණා සම්බන්ධයෙන් මේ පනතේ උපලේඛනයෙහි ඇතුළත් විධිවිධාන බලාත්මක විය යුතු ය.

මණ්ඩලයේ බලතල, කාර්ය හා කර්තව්‍ය.

**5.** මණ්ඩලය විසින්, එහි අරමුණු හා වගකීම් ඉටු කිරීමේ කාර්යය සඳහා, පහත සඳහන් බලතල, කාර්ය හා කර්තව්‍ය සියල්ල ම හෝ ඉන් කිසිවක්, ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම හා කිරීම කළ හැකි ය :-

(අ) ශ්‍රී ලංකාව තුළ රක්ෂණ ව්‍යාපාරය කර ගෙන යන තැනැත්තන් රක්ෂණකරුවන් වශයෙන් ලියාපදිංචි කිරීම ;

(ආ) රක්ෂණ තැරැව්කරුවන් වශයෙන් තැනැත්තන් ලියාපදිංචි කිරීම ;

(ඇ) රක්ෂණ කර්මාන්තය සංවර්ධනය කිරීම හා විධිමත් කිරීම සම්බන්ධයෙන් ආණ්ඩුවට උපදෙස් දීම ;

(ඈ) රක්ෂණ කර්මාන්තය සම්බන්ධයෙන් ආණ්ඩුවේ ප්‍රතිපත්ති හා වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම ;

(ඉ) මණ්ඩලයේ බලතල ක්‍රියාත්මක කිරීමේ, කාර්ය ඉටු කිරීමේ හා කර්තව්‍ය කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය යම් නිලධරයන් හා සේවකයන් සේවයෙහි නියුක්ත කිරීම ;

(ඊ) නිශ්චල වූ හෝ චංචල වූ හෝ දේපළ කිසිවක් අත්කර ගැනීම හා දැරීම, ඒ දේපළ විකිණීම, බද්දට දීම, උකස් කිරීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම ;

(උ) මණ්ඩලයේ බලතල ක්‍රියාත්මක කිරීම, කාර්ය ඉටු කිරීම හා කර්තව්‍ය කිරීම සඳහා අවශ්‍ය යම් ගිවිසුම්වලට ඇතුළත් වීම ; සහ

(ඌ) මේ පනත යටතේ යථා පරිදි මණ්ඩලයේ බලතල ක්‍රියාත්මක කිරීම, කාර්ය ඉටු කිරීම හා කර්තව්‍ය කිරීම සඳහා අවශ්‍ය වෙනත් සියලු ක්‍රියා කිරීම.

6. (1) මණ්ඩලයට එහි ම අරමුදලක් තිබිය යුතු ය. මණ්ඩලයේ අරමුදල.

(2) මණ්ඩලයේ අරමුදලට–

(අ) මණ්ඩලයේ ප්‍රයෝජනය සඳහා පාර්ලිමේන්තුව විසින් කලින් කල සම්මත කරනු ලබන සියලු මුදල් ;

(ආ) මේ පනතේ 14 වන 81 වන, සහ 83 වන වගන්ති යටතේ ලියාපදිංචි කිරීමේ ගාස්තු වශයෙන් ගෙවනු ලබන සියලු මුදල් ;

(ඇ) මේ පනතේ 16 වන වගන්තිය යටතේ වාර්ෂික ගාස්තුව ලෙස රක්ෂණකරුවන් විසින් ගෙවනු ලබන සියලු මුදල් ;

(ඈ) මණ්ඩලය විසින් එහි බලතල, කාර්ය, කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, ඉටු කිරීමේ දී, කිරීමේ දී මණ්ඩලයට ලැබෙන සියලු මුදල් ;

(ඉ) ශ්‍රී ලංකාව ඇතුළත හෝ ඉන් පිටත කවර හෝ ප්‍රභවයකින් ණය, ත්‍යාග, පරිත්‍යාග සහ ප්‍රදාන වශයෙන් මණ්ඩලයට ලැබෙන සියලු මුදල්

ගෙවනු ලැබිය යුතු ය.

(3) මණ්ඩලයේ බලතල ක්‍රියාත්මක කිරීමේ දී, කාර්ය ඉටු කිරීමේ දී හා කර්තව්‍ය කිරීමේ දී මණ්ඩලය විසින් දැරීමට සිදුවන වියදම් පියවීමෙහි ලා අවශ්‍ය සියලු මුදල්, මණ්ඩලයේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

ශුද්ධ වාරික ආදායම මත සෙස් බද්ද අය කිරීම.

7. (1) සෑම රක්ෂණකරුවකුගේ ම වාර්ෂික ශුද්ධ වාරික ආදායම මත කලින් කල ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් මණ්ඩලයේ එකඟත්වය ඇතිව කලින් කල නිශ්චය කරනු ලබන අනුප්‍රමාණ අනුව සෙස් බද්දක් අය කරනු ලැබිය යුතු ය ; පනවනු ලැබිය යුතු ය ; ගෙවනු ලැබිය යුතු ය. එසේ වුවද, ඒ අනුප්‍රමාණය, වාර්ෂික ශුද්ධ වාරික ආදායමෙන් සියයට භාගයක් නොඉක්මවිය යුතු ය.

(2) අමාත්‍යවරයා විසින් මේ වගන්තිය යටතේ කරන ලද සෑම නියමයක් ම, එය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබූ දිනයෙහි හෝ එහි නිශ්චිතව සඳහන් යම් පසු දිනයක හෝ බලාත්මක විය යුතු අතර, එය එසේ පළ කරනු ලැබූ දින සිට මාස හතරක් ඇතුළත අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ අනුමත කරනු නොලැබූ එවැනි යම් නියමයක් එහි අනනුමතයේ දින සිට ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු නමුත් ඒ යටතේ කලින් කරන ලද කිසිවක වලංගු භාවය කෙරෙහි ඉන් හානියක් නොවිය යුතු ය.

(3) මේ වගන්තිය යටතේ නියම කරනු ලබන සෙස් බද්ද, වෙනත් යම් බද්දකට හෝ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ පනවනු ලැබූ සෙස් බද්දකට අතිරේකව විය යුතු ය.

(4) (1) වන උපවගන්තියේ කාර්යය සඳහා, වාර්ෂික "ශුද්ධ වාරික ආදායම" යන්නෙන්, ප්‍රතිරක්ෂණ වාරිකය අඩු කළ, දළ රක්ෂණ වාරික ආදායම අදහස් වේ.

මණ්ඩලයේ මුදල් වර්ෂය සහ ගිණුම් විගණනය කිරීම.

8. (1) මණ්ඩලයේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(2) මණ්ඩලය විසින් එහි ආදායම, වියදම, වත්කම් හා බැරකම් සහ මණ්ඩලයේ වෙනත් සියලු ගනුදෙනු සම්බන්ධයෙන් නිසි ගිණුම් පොත් තබා ගැනීමට සලස්වනු ලැබිය යුතු ය.

(3) රාජ්‍ය සංස්ථාවල ගිණුම් විගණනය කිරීමට අදාළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ විධිවිධාන, මණ්ඩලයේ ගිණුම් විගණනය කිරීම සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

9. (1) අමාත්‍යවරයා විසින්, මණ්ඩලය විමසා, මණ්ඩලයට අධ්‍යක්ෂ ජනරාල්වරයකු පත් කරනු ලැබිය යුතු අතර, ඔහු එහි ප්‍රධාන විධායක නිලධරයා විය යුතු ය. අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ පාරිශ්‍රමිකය ඇතුලුව, සේවා නියුක්ති කොන්දේසි අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලැබිය යුතු ය. අධ්‍යක්ෂ ජනරාල්වරයා.

(2) මණ්ඩලයේ රැස්වීම්වලට සහභාගි වන ලෙස මණ්ඩලය විසින් ආරාධනය කරනු ලැබීමේ දී, අධ්‍යක්ෂ ජනරාල්වරයා මණ්ඩලයේ රැස්වීම්වලට සහභාගි විය යුතු නමුත්, ඒ රැස්වීම්වල දී ඡන්දය දීමට ඔහු හිමිකම් නොලබන්නේ ය.

(3) අධ්‍යක්ෂ ජනරාල්වරයා මණ්ඩලයේ සාමාන්‍ය විධානයට හා පාලනයට යටත්ව මණ්ඩලයේ කටයුතු මෙහෙයවීම සහ සියලු ව්‍යාපාර කිරීම ද, මණ්ඩලයේ බලතල ක්‍රියාත්මක කිරීම, කාර්ය ඉටු කිරීම හා කර්තව්‍ය කිරීම ද, මණ්ඩලයේ නිලධරයන් හා සේවකයන් පරිපාලනය කිරීම හා පාලනය කිරීම ද, භාරව සිටිය යුතු ය.

(4) මේ පනතින් අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත පවරා ඇති, නියම කර ඇති හෝ වෙන් කර දී ඇති යම් බලයක්, කර්තව්‍යයක් හෝ කාර්යයක් මණ්ඩලයේ යම් නිලධරයකුට හෝ සේවකයකුට පැවරීම අවශ්‍ය යයි අධ්‍යක්ෂ ජනරාල්වරයා සලකන කවර හෝ විටක, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, මණ්ඩලයේ අනුමතය ඇතිව එසේ පවරනු ලැබිය හැකි අතර, ඒ නිලධරයා හෝ සේවකයා විසින් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ සාමාන්‍ය හෝ විශේෂ විධානයට යටත්ව, ඒ බලය ක්‍රියාත්මක කිරීම, කර්තව්‍ය කිරීම හා කාර්ය ඉටු කිරීම කළ යුතු ය.

(5) අමාත්‍යවරයා විසින් මණ්ඩලයේ නිර්දේශ මත, (1) වන උපවගන්තිය යටතේ පත් කරන ලද අධ්‍යක්ෂ ජනරාල්වරයා, හේතු දැක්වීමෙන් ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

10. (1) මණ්ඩලයේ කර්තව්‍ය කාර්යක්ෂම ලෙස කිරීම සඳහා අවශ්‍ය යයි මණ්ඩලය සලකන යම් නිලධරයන් හා සේවකයන් මණ්ඩලය විසින් පත් කරනු ලැබිය හැකි ය. මණ්ඩලයේ කාර්ය මණ්ඩලය.

(2) (1) වන උපවගන්තිය යටතේ පත් කරනු ලැබූ නිලධරයන්ට හා සේවකයන්ට මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන යම් ආකාරයකින් හා යම් අනුප්‍රමාණ අනුව පාරිශ්‍රමික ගෙවනු ලැබිය යුතු අතර, මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන සේවා කොන්දේසිවලට ඒ නිලධරයන් හා සේවකයන් යටත් විය යුත්තාහ.

(3) මණ්ඩලයේ ඉල්ලීම පිට, රාජ්‍ය සේවයේ යම් නිලධරයකු, ඒ නිලධරයාගේ සහ රාජ්‍ය පරිපාලන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ කැමැත්ත ඇතිව, සහ එවැනි ම කැමැත්ත ඇතිව මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන යම් කාලයක් සඳහා මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය ; නැතහොත් එවැනි ම කැමැත්ත ඇතිව ඒ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබිය හැකි ය.

(4) රාජ්‍ය සේවයේ යම් නිලධරයකු මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබූ අවස්ථාවක, 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඒ නිලධරයාට හෝ ඔහු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(5) රාජ්‍ය සේවයේ යම් නිලධරයකු මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට ස්ථිර වශයෙන් පත් කරනු ලැබූ අවස්ථාවක, 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඒ නිලධරයාට හා ඔහු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(6) යම් නිශ්චිත කාලයක් සඳහා ආණ්ඩුවට සේවය කිරීමට එකඟ වී ඇති යම් තැනැත්තකු මණ්ඩලය විසින් සේවයෙහි නියුක්ත කරනු ලබන අවස්ථාවක, ඒ තැනැත්තා විසින් මණ්ඩලය වෙත කරන ලද යම් සේවා කාලයක් ඒ ගිවිසුම යටතේ වූ ඒ තැනැත්තාගේ බැඳීම් ඉටු කිරීමේ කාර්යය සඳහා ආණ්ඩුවට කරන ලද සේවයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

රාජ්‍ය සංස්ථාවල නිලධරයන් හා සේවකයන් මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට පත් කිරීම.

11. (1) මණ්ඩලයේ ඉල්ලීම පිට, රාජ්‍ය සංස්ථාවක යම් නිලධරයකු හෝ සේවකයකු ඒ නිලධරයාගේ හෝ සේවකයාගේ සහ ඒ සංස්ථාවේ පාලක මණ්ඩලයේ කැමැත්ත ඇතිව, මණ්ඩලය විසින් එවැනි ම කැමැත්ත ඇතිව නිශ්චය කරනු ලබන යම් කාලයක් සඳහා මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය ; නැතහොත් එවැනි ම කැමැත්ත ඇතිව, මණ්ඩලය හා ඒ රාජ්‍ය සංස්ථාවේ පාලක මණ්ඩලය විසින් එකඟ වනු ලබන විශ්‍රාම වැටුප හෝ අර්ථසාධක අරමුදල හෝ පිළිබඳ අයිතිවාසිකම්වලට අදාළ නියම හා කොන්දේසි ද ඇතුළුව, යම් නියම හා කොන්දේසි මත මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබිය හැකි ය.

(2) යම් තැනැත්තකු (1) වන උපවගන්තිය යටතේ මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව හෝ ස්ථිරව හෝ පත් කරනු ලැබූ අවස්ථාවක, මණ්ඩලයේ යම් නිලධරයකු හෝ සේවකයකු යටත් වන විනය පාලනයට ම, ඒ තැනැත්තා ද යටත් විය යුතු ය.

II වන කොටස

රක්ෂණකරුවන් ලියාපදිංචි කිරීම

**12.** (1) මේ පනතේ විධිවිධානවලට යටත්ව, නියමිත දිනයේ සිට හා ඉන් පසුව, යම් තැනැත්තකු ශ්‍රී ලංකාවේ රක්ෂණ ව්‍යාපාරය කරගෙන යාමට මේ පනත යටතේ තත් කාලයේ ලියා පදිංචි කර ඇත්නම් හෝ ලියාපදිංචි කර ඇතැයි සලකනු ලබන්නේ නම් මිස, ඒ තැනැත්තා විසින් ශ්‍රී ලංකාවෙහි රක්ෂණ ව්‍යාපාර කර ගෙන යනු නොලැබිය යුතු ය.

රක්ෂණ ව්‍යාපාර මේ පනත යටතේ ලියාපදිංචි කරනු ලැබූ සමාගම් මගින් පවත්වා ගෙන යා යුතු බව.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ ලියාපදිංචි කිරීමක්, සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර සඳහා හෝ දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාර සඳහා හෝ සාමාන්‍ය හා දීර්ඝ කාලීන යන දෙවර්ගයේ ම රක්ෂණ ව්‍යාපාර සඳහා හෝ විය හැකි ය.

(3) (1) වන උපවගන්තියේ විධිවිධාන නොතකා, 1999 අංක 20 දරන කෘෂිකාර්මික සහ ගොවිජන රක්ෂණ පනත මගින් පිහිටුවන ලද කෘෂිකාර්මික සහ ගොවිජන රක්ෂණ මණ්ඩලය සම්බන්ධයෙන් ද, 1978 අංක 15 දරන ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථා පනත මගින් පිහිටුවන ලද, ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව සම්බන්ධයෙන් සහ 1996 අංක 17 දරන සමාජ ආරක්ෂණ මණ්ඩලය පනත මගින් පිහිටුවන ලද සමාජ ආරක්ෂණ මණ්ඩලය සම්බන්ධයෙන් ද මේ පනතේ විධිවිධාන අදාළ නොවිය යුතු ය.

(4) (1) වන උපවගන්තිය යටතේ ලියාපදිංචි කරනු ලැබූ තැනැත්තකු විසින්, රක්ෂණ ව්‍යාපාරය නොවන වෙනත් ආකාරයක ව්‍යාපාරයක් කර ගෙන යනු නොලැබිය යුතු ය :

එසේ වුවද, යම් තැනැත්තකු විසින්, මණ්ඩලයේ පූර්ව ලිඛිත කැමැත්ත ඇතිව මේ පනත යටතේ ලියාපදිංචි කිරීමක් ලබා ගන්නා ලද්දේ යම් රක්ෂණ ව්‍යාපාරයක් සඳහා ද, ඒ රක්ෂණ ව්‍යාපාරයට අනුයාත හෝ ඒ හා සම්බන්ධ යම් මූල්‍ය සේවා ව්‍යාපාරයක් කර ගෙන යනු ලැබිය හැකි ය.

ලියාපදිංචි කිරීම සඳහා සුදුසුකම්.

**13.** (1) යම් තැනැත්තකු –

(අ) ශ්‍රී ලංකාවෙහි ලියාපදිංචි කරනු ලැබූ හා 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි කරනු ලැබූ සංස්ථාගත කරන ලද පොදු සමාගමක් වන්නේ නම් ;

(ආ) නියමිත මුදලට අඩු නොවන ගෙවා නිමි කොටස් ප්‍රාග්ධනයක් ඒ තැනැත්තාට ඇත්නම් ;

(ඇ) තැන්පතු වශයෙන් රීති මගින් මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන යම් මුදලක් ඒ තැනැත්තා විසින් භාණ්ඩාගාරයට ගෙවනු ලබන්නේ නම් ;

(ඈ) නියමිත ගාස්තුව ගෙවනු ලබන්නේ නම් ; සහ

(ඉ) රක්ෂණකරුවන්ගේ නිසි පැවැත්ම සහතික කිරීමේ, රක්ෂණය කරන ලද මහජනතාවගේ යහපත ආරක්ෂා කිරීමේ කාර්යය සඳහා සහ රක්ෂණ කර්මාන්තය සංවර්ධනය කිරීම සඳහා මණ්ඩලය විසින් සාදනු ලැබූ රීති මගින් පනවා ඇති වෙනත් යම් නියමයන් ඒ තැනැත්තා විසින් ඉටු කරනු ලබන්නේ නම්

මිස, ඒ තැනැත්තා ශ්‍රී ලංකාව තුළ එක් රක්ෂණ ව්‍යාපාරයක් හෝ රක්ෂණ ව්‍යාපාර පංති දෙකම හෝ ශ්‍රී ලංකාව තුළ කර ගෙන යාම සඳහා ලියාපදිංචි කරනු නොලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ (ආ) (ඇ) සහ (ඈ) ඡේදවල කාර්යය සඳහා, රක්ෂණ ව්‍යාපාරයේ විවිධ පන්ති සඳහා වෙනස් මුදල් ප්‍රමාණයන් නියම කරනු ලැබිය හැකි ය :

ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලුම් කිරීම.

**14.** (1) 12 වන වගන්තිය යටතේ ලියාපදිංචි කිරීම සඳහා වූ සෑම ඉල්ලීමක් ම, තත් කාර්ය සඳහා මණ්ඩලය විසින් සපයනු ලබන යම් ආකෘති පත්‍රයක මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතු අතර –

(අ) 13 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඇ) ඡේදය යටතේ තැන්පත් කරන ලද මුදල දැක්වෙන භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයා විසින් නිකුත් කරන ලද සහතිකයක් ද සමග ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) සහ (ඈ) ඡේදවල විධිවිධානවලට අනුකූලව ක්‍රියා කර ඇති බවට ඉල්ලුම්කරුගේ ලිඛිත ප්‍රකාශයක් ;

(ආ) ලියාපදිංචි කිරීම සඳහා වූ ඉල්ලීම ඉදිරිපත් කරනු ලබන්නේ රක්ෂණ ව්‍යාපාරයේ යම් පන්තියක් සඳහා ද, ඒ පන්තිය සම්බන්ධයෙන් නියම කර ඇති ගාස්තුව ;

(ඇ) ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලුම් කරන සමාගමේ සංස්ථා පත්‍රයේ සහ සාංගමික ව්‍යවස්ථාවලියේ සහතික පිටපතක් ;

(ඈ) ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලුම් කරන සමාගමේ සංස්ථාගත කිරීමේ සහතිකයේ සහතික පිටපතක් ;

(ඉ) ව්‍යාපාර කටයුතු ආරම්භ කිරීම සඳහා සමාගම් රෙජිස්ට්‍රාර්වරයා විසින් නිකුත් කරන ලද සහතිකයේ සහතික පිටපතක් ;

(ඊ) (i) සමාගමේ කොටස් හිමියන්ට,

(ii) සමාගමේ අධ්‍යක්ෂවරයන්ට, සහ

(iii) 32, 46 සහ 94 වන වගන්තිවල සඳහන් නිලධරයන්ට,

අදාළ නියමිත විස්තර දැක්වෙන ප්‍රකාශයක් ;

(උ) ඉල්ලුම්කරු විසින් කර ගෙන යාමට යෝජිත රක්ෂණ ව්‍යාපාරයේ පන්තිය හා අවශ්‍ය අවස්ථාවක රක්ෂණ ව්‍යාපාරයේ අනු පන්තිය දැක්වෙන ප්‍රකාශයක් ;

(ඌ) 13 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඉ) ඡේදය යටතේ මණ්ඩලය විසින් පනවා ඇති නියම කිරීම් කිසිවක් ඇත්නම්, ඒ නියම කිරීම් ඉටු කරන ලද බවට විස්තර දැක්වෙන ප්‍රකාශයක් ; සහ

(එ) අවුරුදු තුනක කාලයක් සඳහා වැඩ යෝජනා ක්‍රමයක් හෝ ව්‍යාපාර සැලැස්මක්

ඒ ඉල්ලීම සමග ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(2) මේ වගන්තිය යටතේ කරනු ලබන සෑම ඉල්ලීමක් ම, ඒ ඉල්ලීම සමග ඇති ප්‍රකාශ සැබෑ හා නිවැරදි බවට ඉල්ලීම කරන තැනැත්තා විසින් අත්සන් තැබූ ප්‍රකාශයක් මගින් සහතික කරනු ලැබිය යුතු ය. එවැනි සෑම ප්‍රකාශයක් ම මුද්දර ගාස්තුවෙන් නිදහස් විය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ කරන ලද ඉල්ලීමක ඇතුළත් යම් විස්තරවල නිරවද්‍යතාව සැබෑදැයි පරීක්ෂා කිරීම සහ ඉල්ලුම්කරු මේ පනත යටතේ රක්ෂණකරුවකු වශයෙන් ලියාපදිංචි කරනු ලැබීම සඳහා ඔහුගේ යෝග්‍යතාව නිශ්චය කිරීම සඳහා, අවශ්‍ය යයි මණ්ඩලය සලකන යම් විමර්ශන, මණ්ඩලය විසින් පවත්වනු ලැබිය හැකි ය.

ලියාදිංචි කිරීම හා බලපත්‍රය නිකුත් කිරීම.

**15.** (1) 14 වන වගන්තිය යටතේ ලියාපදිංචි කිරීම සඳහා වූ ඉල්ලීමක් ඉදිරිපත් කරන යම් සමාගමක් විසින්, මේ පනතේ 13 වන වගන්තියේ විධිවිධානවලට අනුකූලව ක්‍රියා කර ඇති බවට මණ්ඩලය සෑහීමට පත්වන අවස්ථාවක, සහ 14 වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ පවත්වන ලද විමර්ශනයක දී ලියාපදිංචි කරනු ලැබීම පිණිස ඉල්ලුම්කරුගේ යෝග්‍යතාව පිළිබඳව මණ්ඩලය සෑහීමට පත්වන අවස්ථාවක, මණ්ඩලය විසින් ඒ සමාගම රක්ෂණකරුවකු වශයෙන් ලියාපදිංචි කර, ඒ රක්ෂණකරුට බලපත්‍රයක් නිකුත් කරනු ලැබිය යුතු ය. ඒ බලපත්‍රයෙහි ඒ රක්ෂණකරුට කර ගෙන යාමට බලය දී ඇති රක්ෂණ ව්‍යාපාරයේ පන්තිය සහ අවශ්‍ය අවස්ථාවක රක්ෂණ ව්‍යාපාරයේ අනුපන්තිය දක්වනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ රක්ෂණකරුවකු වෙත නිකුත් කරන ලද, බලපත්‍රය, රක්ෂණකරුගේ ප්‍රධාන කාර්යාලයෙහි හෝ ප්‍රධාන ව්‍යාපාර ස්ථානයෙහි හෝ සියලු අවස්ථාවල දී තබා ගනු ලැබිය යුතු අතර, එය, මණ්ඩලයේ යම් සාමාජිකයකු හෝ එහි අධ්‍යක්ෂ ජනරාල්වරයා හෝ තත් කාර්ය සඳහා මණ්ඩලය විසින් බලය පවරන ලද යම් තැනැත්තකු හෝ විසින් පරීක්ෂා කර බැලීම සඳහා ලබා ගැනීමට සැලැස්විය යුතු ය.

වාර්ෂික ගාස්තුව.

**16.** (1) නියම කරනු ලැබිය හැකි යම් මුදල් ප්‍රමාණයක්, සෑම රක්ෂණකරුවකු විසින් ම වාර්ෂික ගාස්තුවක් වශයෙන් මණ්ඩලයට ගෙවනු ලැබිය යුතු ය.

(2) මණ්ඩලය විසින්, රක්ෂණ ව්‍යාපාරයේ විවිධ පන්ති සම්බන්ධයෙන් වාර්ෂික ගාස්තුව වශයෙන් විවිධ මුදල් ප්‍රමාණ නියම කරනු ලැබිය හැකි ය.

ඉදිරිපත් කරන ලද විස්තර වෙනස් කිරීම.

**17.** 15 වන වගන්තිය යටතේ සමාගමක් ලියාපදිංචි කිරීමෙන් පසුව 14 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ ලියාපදිංචි කිරීම සඳහා වූ ඉල්ලීම සමග ඉදිරිපත් කරන ලද හෝ ලියාපදිංචි

කිරීම සඳහා වූ ඉල්ලීම සමග ඉදිරිපත් කිරීමට නියම කර තිබූ යම් ලේඛනයකට හෝ විස්තරයකට බලපාන පරිදි, යම් වෙනස් කිරීමක් හෝ වෙනසක් සිදු වී ඇති හෝ සිදු කර ඇති කවර හෝ විධාන, රක්ෂණකරු විසින් ඒ වෙනස් කිරීම හෝ වෙනස පිළිබඳව සැබෑ බවට සහතික කරන ලද සම්පූර්ණ ප්‍රකාශයක් මණ්ඩලය වෙත වහාම ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

රක්ෂණකරුවකු වෙත නිකුත් කරන ලද බලපත්‍රයක් අවලංගු කිරීම හෝ අත්හිටුවීම.

18. (1) රක්ෂණකරුවකුගේ ලියාපදිංචි කිරීම පහත දැක්වෙන එක් කරුණක් හෝ හේතුවක් නැතහොත් ඊට වැඩි කරුණු හෝ හේතු, එනම් රක්ෂණකරු විසින් –

(අ) ලියාපදිංචි කරනු ලැබීමෙන් පසු මාස දොළහක් ඇතුළත ව්‍යාපාරය ආරම්භකර නොමැති වීම ;

(ආ) රක්ෂණ ව්‍යාපාරය එහි යම් පන්තියක් සම්බන්ධයෙන් කර ගෙන යාම නතර කර තිබීම ;

(ඇ) රක්ෂණකරුගේ ණයහිමියන් සමග යම් සමථයකට හෝ එකඟත්වයකට පැමිණීමට යෝජනා කර තිබීම හෝ එසේ සමථයකට හෝ එකඟත්වයකට පැමිණ තිබීම නැතහොත් රක්ෂණකරු ඈවර කර තිබීම හෝ ගණන් බේරා වසා දමා තිබීම හෝ අන්‍යාකාරයකින් විසුරුවා හැර තිබීම ;

(ඈ) රක්ෂණ ඔප්පු දරන්නන්ගේ යහපතට හෝ රක්ෂණ කර්මාන්තයේ සංවර්ධනයට හෝ ජාතික යහපතට හානිකර වීමට ඉඩ ඇති ආකාරයකින් රක්ෂණ ව්‍යාපාරය කර ගෙන යාම ;

(ඉ) ස්වකීය බැඳීම් ඉටු කිරීමට නොහැකි වීම ;

(ඊ) 26 වන වගන්තිය යටතේ මණ්ඩලය විසින් නිශ්චය කරන ලද පරිදි ණය ගෙවීමේ හැකියාව පිළිබඳ සීමාව පවත්වා ගෙන යාමට අසමත් වීම ;

(උ) මේ පනතේ යම් විධිවිධානයක් හෝ එය යටතේ සාදන ලද යම් නියෝගයක් හෝ රීතියක් හෝ මේ පනත යටතේ මණ්ඩලය විසින් පනවන ලද යම් කොන්දේසියක් හෝ දෙන ලද යම් විධානයක් කඩ කර තිබීම ;

(ඖ) ලියාපදිංචි කිරීම සඳහා වූ ස්වකීය ඉල්ලීමෙහි අසත්‍ය, නොමඟ යවන සුළු හෝ වැරදි සහගත තොරතුරු ඉදිරිපත් කර තිබීම හෝ වැදගත් කරුණු හෙළිදරව් කිරීම පැහැර හැර තිබීම ;

(ඔ) යහපත් මූල්‍ය ස්ථාවරයක පැවතීම අවසන්ව තිබීම ;

(ඒ) බලපත්‍රය ප්‍රදානය කරනු ලැබීමෙන් පසුව, බලපත්‍රය ප්‍රදානය කිරීම සඳහා නුසුදුසු බවට පත්ව තිබීම ; හෝ

(ඔ) ස්වකීය කටයුතු කළමනාකරණයෙහි ලා යම් අයථා ක්‍රියාවක් හෝ අක්‍රමිකතාවක් සම්බන්ධයෙන් වරදකරු බවට තීරණය කර තිබීම

නිසා සම්පූර්ණයෙන් ම හෝ රක්ෂණ ව්‍යාපාරයේ එක්තරා පන්තියක් හෝ අනුපන්තියක් සම්බන්ධයෙන් අවලංගු කරනු ලැබිය හැකි ය.

(2) මණ්ඩලය විසින් (1) වන උපවගන්තියෙහි සඳහන් කවර හෝ කරුණක් හෝ හේතුවක් නැතහොත් ඊට වැඩි කරුණු හෝ හේතු නිසා සහ තත් කාර්යය සඳහා යවනු ලබන දැන්වීමක් මගින් රක්ෂණකරුවකු වෙත ප්‍රදානය කරන ලද ලියාපදිංචි කිරීම, දැනටමත් නිකුත් කර ඇති රක්ෂණ ඔප්පු යටතේ යම් රක්ෂණකරුවකුට ඇති බැඳීම් ඉටු කිරීමට ඒ රක්ෂණකරුට ඇති වගකීමට හානියක් නොමැතිව, සති තුනක් නොඉක්මවන කාලයක් සඳහා අත්හිටුවනු ලැබිය හැකි අතර ඉන් අනතුරුව ඒ අත්හිටුවීම ඉවත් කරනු ලබන තෙක්, රක්ෂණකරු විසින් අලුත් රක්ෂණ ඔප්පු නිකුත් කිරීම රක්ෂණකරුට තහනම් විය යුතු ය.

(3) (2) වන උපවගන්තියෙහි සඳහන් දැන්වීමක, අත්හිටුවා ඇති කාලය සහ ඒ අත්හිටුවීම ඉවත් කළ යුතු වන්නේ මක්නිසා ද යන වග පිළිබඳව රක්ෂණකරු විසින් මණ්ඩලයට හේතු දැක්විය යුත්තේ යම් දිනයකට පෙර ද ඒ දිනය, නිශ්චිතව දක්වනු ලැබිය යුතු ය.

(4) (2) වන උපවගන්තිය යටතේ යවන ලද දැන්වීමකට රක්ෂණකරුවකුගේ ප්‍රතිචාරය ලැබුණු විට, මණ්ඩලය විසින් –

(අ) අත්හිටුවීම ඉවත් කළ යුතු වන්නේ මක්නිසාද යන වග පිළිබඳව රක්ෂණකරුවකු විසින් ප්‍රමාණවත් හේතු දක්වා ඇති අවස්ථාවක, ඒ අත්හිටුවීම වහාම ඉවත් කරනු ලැබිය හැකි ය ; නැතහොත්

(ආ) රක්ෂණකරු විසින් දක්වා ඇති ප්‍රතිචාරය සම්බන්ධයෙන් මණ්ඩලය සෑහීමට පත් නොවන අවස්ථාවක, අවස්ථාවෝචිත පරිදි, දැනටමත් පනවා ඇති අත්හිටුවීමේ කාලය දීර්ඝ කිරීම හෝ ලියාපදිංචි කිරීම අවලංගු කිරීම හෝ, කළ හැකි ය.

(5) රක්ෂණකරුවකුගේ ලියාපදිංචි කිරීම (4) වන උපවගන්තිය යටතේ අවලංගු කිරීමට හෝ වැඩිදුර කාලයක් සඳහා අත්හිටුවීමට මණ්ඩලය විසින් තීරණය කරනු ලබන අවස්ථාවක, අවස්ථාවෝචිත පරිදි, ඒ අවලංගු කිරීම හෝ අත්හිටුවීම පිළිබඳව රක්ෂණකරු වෙත වහාම දැනුම් දීම මණ්ඩලයේ යුතුකම විය යුතු අතර, අත්හිටුවීම වැඩිපුර කාලයක් සඳහා දීර්ඝ කරනු ලැබූ විටක–

(අ) අත්හිටුවීම දීර්ඝ කරනු ලබන්නේ යම් කාලයකට ද ඒ කාලය ;

(ආ) අත්හිටුවීම පැනවීමට හේතු වූ කරුණ හෝ හේතුව නිවැරදි කිරීම හෝ ඉවත් කිරීම අරභයා ගැනීමට අවශ්‍ය ක්‍රියා මාර්ගය ; සහ

(ඇ) (ආ) ඡේදයෙහි සඳහන් නිවැරදි කිරීමේ පියවර ගනු ලැබිය යුතු කාලය

පිළිබඳව, මණ්ඩලය විසින් රක්ෂණකරු වෙත වැඩිදුරටත් දැනුම් දෙනු ලැබිය යුතු ය.

(6) ලියාපදිංචි කිරීමක් (4) වන උපවගන්තිය යටතේ අවලංගු කරනු ලැබූ හෝ අත්හිටුවනු ලැබූ අවස්ථාවක බලපත්‍රය වහාම මණ්ඩලය වෙත භාර දීම අවස්ථාවෝචිත පරිදි, බලපත්‍රය අවලංගු කරන ලද හෝ අත්හිටුවන ලද බලපත්‍ර දරන්නාගේ යුතුකම විය යුතු අතර, මණ්ඩලය විසින් ඉන් අනතුරුව –

(අ) ලියාපදිංචි කිරීම අවලංගු කිරීමක් සම්බන්ධයෙන් වන විට, බලපත්‍රය අවලංගු කරනු ලැබිය යුතු ය ; නැතහොත්

(ආ) ලියාපදිංචි කිරීම නිශ්චිත කාලයක් සඳහා අත්හිටුවීමක් සම්බන්ධයෙන් වන විට, බලපත්‍රයෙහි ඒ බවට පිටසනක් කර බලපත්‍රය දරන්නා වෙත බලපත්‍රය ආපසු භාර දෙනු ලැබිය යුතු ය.

(7) මේ වගන්තියේ (1) වන හා (2) වන උපවගන්තිවල විධිවිධාන නොතකා, මේ පනත යටතේ රක්ෂණකරුවකු වෙත නිකුත් කරන ලද බලපත්‍රයක් (1) වන උපවගන්තියෙහි සඳහන් කවර හෝ එක් හේතුවක් හෝ ඊට වැඩි හේතු ගණනක් මත අවලංගු කිරීමක් හෝ අත්හිටුවීමක් කිරීම වෙනුවට, සහ (1) වන උපවගන්තියෙහි සඳහන් හා ඒ රක්ෂණකරු විසින් සිදු කරන ලද ක්‍රියාවේ හෝ නොකර හැරීමේ ස්වභාවය, බලපත්‍රය අවලංගු කිරීමට හෝ අත්හිටුවීමට තුඩුදෙන ස්වභාවයේ ක්‍රියාවක් හෝ නොකර හැරීමක් නොවන අවස්ථාවක –

(අ) ඒ ක්‍රියාව හෝ නොකර හැරීම පැවතීම වැළැක්වීම ; සහ

(ආ) ඒ ක්‍රියාවේ හෝ නොකර හැරීමේ ප්‍රතිඵලයක් වශයෙන් සිදු වූ විපාක යථාවත් කිරීම හා නිවැරදි කිරීම

පිණිස, මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන යම් පියවර ගන්නා ලෙස රක්ෂණකරුට විධාන කරනු ලැබිය යුතු ය.

අභියාචන.

**19.** (1) 18 වන වගන්තිය යටතේ මණ්ඩලය විසින් කරන ලද තීරණයකින් අතෘප්තියට පත් රක්ෂණකරුවකු විසින්, ඒ තීරණය ඔහු වෙත දැන්වීමෙන් දින දාහතරක් ඇතුළත, ඒ තීරණයට විරුද්ධව අභියාචනාධිකරණය වෙත අභියාචනය කළ හැකි ය.

(2) අභියාචනය කරන ලද්දේ යම් තීරණයකට එරෙහිව ද ඒ තීරණය, මේ වගන්තිය යටතේ කරන ලද අභියාචනයක් මත, අභියාචනාධිකරණය විසින් ස්ථිර කිරීම, ප්‍රතිශෝධනය කිරීම, සුළු වශයෙන් වෙනස් කිරීම හෝ ඉවත දැමීම කරනු ලැබිය හැකි අතර යුක්තියේ යහපත සඳහා අවශ්‍ය විය හැකි පරිදි වූ ආඥාවක් කරනු ලැබිය හැකි ය.

පරිපාලකවරයකු පත් කිරීම.

**20.** (1) මේ පනත යටතේ රක්ෂණකරුවකු වෙත නිකුත් කරන ලද බලපත්‍රයක් 18 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ අවලංගු කරනු ලැබූ හෝ අත්හිටවනු ලැබූ ද, ජාතික හා මහජන අභිවෘද්ධිය උදෙසා ඒ රක්ෂණකරුගේ රක්ෂණ ව්‍යාපාරයේ පරිපාලනය හා කළමනාකරණය පරිපාලකවරයකු විසින් භාර ගනු ලැබිය යුතු යයි මණ්ඩලයේ අදහස වන්නා වූ ද අවස්ථාවක, මණ්ඩලය විසින්, ඒ කරුණ අමාත්‍යවරයාට දැනුම් දෙනු ලැබිය හැකි අතර, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින්, ඒ නියමයෙහි නිශ්චිතව සඳහන් කරනු ලැබිය යුතු යම් කාලයක් සඳහා මණ්ඩලයේ විධානය හා පාලනය යටතේ ඒ ව්‍යාපාරය පරිපාලනය හා කළමනාකරණය කිරීම පිණිස අමාත්‍යවරයා විසින් පරිපාලකවරයකු පත් කරනු ලැබිය හැකි ය. එසේ නිශ්චිතව සඳහන් කරන ලද කාලය, අවශ්‍ය අවස්ථාවක ඒ ආකාරයෙන්ම කලින් කල දීර්ඝ කරනු ලැබිය හැකි ය.

(2) මණ්ඩලය විසින්, දැන්වීමේ පිටපතක් සමාගමේ රෙජිස්ට්‍රාර්වරයා වෙත භාර දෙනු ලැබීමට සැලැස්විය යුතු අතර, ඒ රක්ෂණ සමාගමට අදාළව ඒ රෙජිස්ට්‍රාර්වරයා විසින් පවත්වා ගෙන යනු ලබන වාර්තාවෙහි රෙජිස්ට්‍රාර්වරයා විසින් සටහනක් කළ යුතු ය.

තැන්පතු භාණ්ඩාගාරයට ගෙවනු ලැබිය යුතු බව.

21. (1) මේ පනත යටතේ රක්ෂණකරුවකු වශයෙන් ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලුම් කරන සෑම සමාගමක් ම, මේ පනතේ 13 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඇ) ඡේදය යටතේ මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන යම් මුදලක් ශ්‍රී ලංකා ආණ්ඩුව සඳහා හා වෙනුවෙන් භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයා වෙත තැන්පත් කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ කරන ලද තැන්පත් කිරීමක්, මුදලින් හෝ ආණ්ඩුවේ සුරැකුම්පත්වලින් හෝ ආණ්ඩුව විසින් ඇප වන ලද සුරැකුම්පත්වලින් සංයුක්ත විය හැකි අතර, එසේ තැන්පත් කරන ලද යම් සුරැකුම්පත්වල වටිනාකම, ඒ සුරැකුම්පත් තැන්පත් කරන ලද දිනයේ ඒවායේ වෙළෙඳ පොළ අගය ලෙස ගණන් ගනු ලැබිය යුතු ය.

(3) මුදලින් කරන ලද තැන්පත් කිරීමක් රක්ෂණකරුගේ බැරට භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයා විසින් කරනු ලැබිය යුතු අතර, මේ පනතේ විධිවිධාන යටතේ තැන්පතුවක් ආපසු දෙනු ලැබිය හැකි අවස්ථානුගත කරුණු යටතේ සහ ඒ ආකාරයට ඒ තැන්පතුව රක්ෂණකරුට මුදලින් ආපසු දෙනු ලැබිය යුතු ය ; තව ද යම් රක්ෂණකරුවකු විසින් මේ වගන්තිය යටතේ තැන්පත් කරන ලද සුරැකුම්පත් මත උපචිත වන යම් පොළියක් ලබා ගනු ලැබූ විට, ඒ පොළිය භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයා විසින් රක්ෂණකරු වෙත ගෙවනු ලැබිය යුතු ය.

(4) රක්ෂණකරුවකු විසින් මේ පනත යටතේ භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයා වෙත තැන්පත් කර ඇති සුරැකුම්පත් වෙනුවට, ආදේශ කරන අවස්ථාවේ දී පවත්නා වෙළෙඳ පොළ අනුපාතය අනුව තක්සේරු කරන ලද සමාන වටිනාකමින් යුතු වෙනත් ආණ්ඩුවේ සුරැකුම්පත් හෝ ආණ්ඩුව ඇපවන ලද සුරැකුම්පත් කවර හෝ අවස්ථාවක ආදේශ කරනු ලැබිය හැකි අතර, මේ පනත යටතේ රක්ෂණකරු විසින් තැන්පත් කරන ලද සුරැකුම්පත් කිසිවක් බේරුම් කර ගැනීමේ දී භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයාට ලැබෙන සම්පූර්ණ මුදල හෝ ඒ මුදලින්

යම් කොටසක් තැන්පතුවක් කර ඇති යම් රක්ෂණකරුවකු විසින් කරන ලද ලිඛිත ඉල්ලීමක් මත භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයා විසින් ආණ්ඩුවේ සුරැකුම්පත්වල හෝ ආණ්ඩුව ඇපවන ලද සුරැකුම්පත්වල ආයෝජනය කරනු ලැබිය යුතු ය.

(5) රක්ෂණකරු විසින් විකුණන ලෙස ඉල්ලීමක් කරනු ලැබුවහොත් භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයා විසින් තමා වෙත තැන්පත් කර ඇති සුරැකුම්පත් කිසිවක් විකුණනු ලැබිය යුතු අතර, උපලබ්ධ වූ මුදල තැන්පතුවක් වශයෙන් දැරිය යුතු ය ; නැතහොත් ඒ විකිණීමෙන් භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයා ලද මුදල සම්පූර්ණයෙන් ම හෝ එහි යම් කොටසක් හෝ රක්ෂණකරු විසින් නිශ්චිතව දක්වනු ලබන පරිදි ආණ්ඩුවේ යම් සුරුකුම්පත්වල හෝ ඇපවන ලද සුරැකුම්පත්වල ඒ නියෝජ්‍ය ලේකම්වරයා විසින් ආයෝජනය කරනු ලැබිය යුතු ය. තවද එසේ තැන්පතුවක් වශයෙන් ආයෝජනය කරනු ලැබුවේ යම් සුරැකුම්පත්වල ද, ඒ සුරැකුම්පත් භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයා විසින් දරනු ලැබිය යුතු ය.

තැන්පතු වෙන් කර තැබීම.

**22.** රක්ෂණකරුවකු විසින් කරන ලද තැන්පතු රක්ෂණකරුගේ වත්කම්වල කොටසක් ලෙස සලකනු ලැබිය යුතු නමුත් -

(අ) ඒ තැන්පතුව, රක්ෂණකරු විසින් මාරු කරනු ලැබීමට හෝ පවරනු ලැබීමට නැතහොත් යම් උකසකින් හෝ වෙනත් වැය බරකින් යටත් කොට බැඳ තැබීමට හෝ යම් තීන්දු ප්‍රකාශයක් ක්‍රියාවේ යෙදවීමෙහි ලා තහනමට ගැනීමකට යටත් කිරීමකට නොහැකි විය යුතු ය ; හෝ

(ආ) ඒ තැන්පතුව, රක්ෂණකරු ගණන් බේරා වසා දැමීමේ දී රක්ෂණකරු විසින් නිකුත් කර ඇති රක්ෂණ ඔප්පු මත පැන නැඟෙන හා එතෙක් නිදහස් කර නොමැති බැරකම් නිදහස් කිරීම සඳහා හැර, රක්ෂණකරුගේ වෙනත් බැරකමක් නිදහස් කිරීම සඳහා ලබා දෙනු නොලැබිය යුතු ය.

තැන්පතු ආපසු භාර දීම.

**23.** කවර හෝ පන්තියක රක්ෂණ ව්‍යාපාරයක් කර ගෙන යාම යම් රක්ෂණකරුවකු විසින් නතර කර ඇති බවට සහ ඒ පන්තිය සම්බන්ධයෙන් වූ ඒ රක්ෂණකරුගේ බැරකම් ඉටු කර ඇති බවට හෝ ඒ සඳහා අන්‍යාකාරයකින් විධිවිධාන සලසා ඇති බවට මණ්ඩලය පැහීමට පත්වන අවස්ථාවක, ඒ රක්ෂණකරු විසින් නිකුත් කරන ලද ඒ පන්තියේ අවසාන රක්ෂණ ඔප්පුවේ දින සිට අවුරුදු දෙකක් ඉකුත්වීමෙන් පසුව රක්ෂණ ව්‍යාපාරයේ ඒ පන්තිය සම්බන්ධයෙන් වූ තැන්පතුව ආපසු භාර දෙනු ලැබිය යුතු ය.

**24.** තනිව හෝ දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරයට අමතරව හෝ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයක් කර ගෙන යන සෑම රක්ෂණකරුවකු විසින් ම, ප්‍රමාණවත් තාක්ෂණ සංචිත පිහිටුවා පවත්වා ගෙන යනු ලැබිය යුතු ය :

තාක්ෂණ සංචිතයක් පවත්වාගෙන යාම.

එසේ වුවද, යම් රක්ෂණකරුවකු විසින් පවත්වා ගෙන යනු ලබන තාක්ෂණ සංචිතය ඒ රක්ෂණකරුගේ බැඳීම් ඉටු කිරීම සඳහා ප්‍රමාණවත් නොවන බව මණ්ඩලයේ මතය වන අවස්ථාවක, ස්වකීය තාක්ෂණ සංචිතය වැඩි කරන ලෙස හෝ වර්ධනය කරන ලෙස ඒ රක්ෂණකරුට නියම කිරීමට මණ්ඩලයට බලය තිබිය යුතු ය.

**25.** (1) 24 වන වගන්තිය යටතේ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයක් සඳහා පවත්වා ගෙන යනු ලබන තාක්ෂණ සංචිතයේ වත්කම්වලින් සියයට විස්සකට අඩු නොවන ප්‍රමාණයක් සහ 38 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ පවත්වා ගෙන යනු ලබන දීර්ඝ කාලීන රක්ෂණ අරමුදලේ වත්කම්වලින් සියයට තිහකට අඩු නොවන ප්‍රමාණයක් ආණ්ඩුවේ සුරැකුම්පත්වල මාර්ගයෙන් විය යුතු ය. ඉතිරි වත්කම්, මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන වෙනත් ආයෝජන ආකාරයෙන් විය යුතු ය.

රක්ෂණකරුවකු විසින් පවත්වා ගෙන යනු ලබන සංචිතයට හා අරමුදලට අදාළ සාමාන්‍ය විධිවිධාන.

(2) මේ වගන්තියේ (1) වන උපවගන්තියෙහි සඳහන් යම් සංචිතයක හෝ අරමුදලක වත්කම් කිසිවක් ආයෝජනය කිරීම සුදුසු නොවන්නේ යයි මණ්ඩලය සලකන අවස්ථාවක, ඒ ආයෝජනය සම්බන්ධයෙන් සුදුස්සක් කිරීම සඳහා විධාන නිකුත් කිරීමට මණ්ඩලයට බලය ඇති අතර, එසේ සුදුස්සක් කළ යුතු වන්නේ යම් කාලයක් ඇතුළත ද, ඒ කාලය ඒ විධානවල සඳහන් කරනු ලැබිය යුතු ය.

(3) මේ පනත යටතේ රක්ෂණකරුවකු විසින් පවත්වා ගෙන යනු ලබන සංචිතයක හෝ අරමුදලක වත්කම් සහ ඒ රක්ෂණකරුගේ වෙනත් සියලු වත්කම්, තත් කාර්යය සඳහා රක්ෂණකරුවකු විසින් කරනු ලබන ඉල්ලීමක් මත මණ්ඩලය විසින් අන්‍යාකාරයෙන් අවසර දෙනු ලැබ ඇත්නම් මිස, ශ්‍රී ලංකාවෙහි තබා ගනු ලැබිය යුතු ය.

**26.** (1) තත් කාර්ය සඳහා සාදන ලද රීති මගින් රක්ෂණ ව්‍යාපාරයේ එක් එක් පන්තියක් සම්බන්ධයෙන් මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන යම් මුදලක ණය ගෙවීමේ හැකියාවේ සීමාවක් සෑම රක්ෂණකරුවකු විසින් ම ඒ එක් එක් පන්තියක් සම්බන්ධයෙන් පවත්වා ගෙන යනු ලැබිය යුතු ය.

ණය ගෙවීමේ හැකියාවේ සීමාව.

(2) එවැනි යම් රක්ෂණකරුවකු විසින් පවත්වා ගෙන යනු ලබන රක්ෂණ ව්‍යාපාරයේ පන්තිය සම්බන්ධයෙන් පවත්වා ගෙන යා යුතු ණය ගෙවීමේ හැකියාවේ සීමාව නිශ්චය කිරීමේ කාර්යය සඳහා, රක්ෂණකරුවකුගේ වත්කම්වල අගය ඒ වත්කම්වල ආවේශ්‍යතාව හා වගකීම්වල ප්‍රමාණය නිශ්චය කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස මණ්ඩලය විසින් රීති සාදනු ලැබිය හැකි ය.

(3) රක්ෂණකරුවන්ගේ බැරකම්වලට ප්‍රතිපක්ෂව වත්කම් අසමානවීම වැළැක්වීම සහතික කිරීමේ කාර්යය සඳහා, රක්ෂණකරුවන්ගේ බැරකම්වලට ප්‍රතිපක්ෂව ඔවුන්ගේ වත්කම්වල අවම සීමාව නිශ්චය කිරීමෙහි ලා අදාළ කළ යුතු නිර්නායක, මණ්ඩලය විසින් තත් කාර්යය සඳහා කලින් කල සාදනු ලබන රීති මගින්, නියම කරනු ලැබිය හැකි ය.

## III වන කොටස

### රක්ෂණකරුවන්ට අදාල සාමාන්‍ය විධිවිධාන

ගිණුම් සහ වත්කම් වෙන් කිරීම.

**27.** රක්ෂණ ව්‍යාපාර පන්ති එකක හෝ ඊට වැඩි ගණනක ව්‍යාපාරය රක්ෂණකරුවකු විසින් කර ගෙන යන අවස්ථාවක ඒ රක්ෂණ ව්‍යාපාර එක් එක් පන්තිය සම්බන්ධයෙන් සියලු ලදුපත් හා ගෙවීම් පිළිබඳ වෙනම ගිණුම් පවත්වා ගෙන යනු ලැබිය යුතු අතර, ඒ රක්ෂණකරු විසින් කර ගෙන යනු ලබන සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ එක් එක් අනුපන්තිය සම්බන්ධයෙන් ද වෙනම ගිණුම් පවත්වා ගෙන යනු ලැබිය යුතු ය.

ඔප්පු පිළිබඳ ලේඛනය හා හිමිකම් පෑම් පිළිබඳ ලේඛනය.

**28.** සෑම රක්ෂණකරුවකු විසින් ම, ඒ රක්ෂණකරු විසින් කරනු ලබන සියලු රක්ෂණ ව්‍යාපාර සම්බන්ධයෙන් -

(අ) රක්ෂණ ඔප්පු පිළිබඳ ලේඛනයක් හෝ වාර්තාවක් තබා ගෙන ඒ ලේඛනය හෝ වාර්තාව පවත්වා ගෙන යනු ලැබිය යුතු අතර ඒ ලේඛනයෙහි හෝ වාර්තාවෙහි රක්ෂණකරු විසින් නිකුත් කරන ලද සෑම රක්ෂණ ඔප්පුවක් සම්බන්ධයෙන් ම, රක්ෂණ ඔප්පුව දරන්නාගේ නම සහ ලිපිනය ද, රක්ෂණ ඔප්පුව බලාත්මක කරන ලද දිනය ද, රක්ෂණකරුට දැනුම් දී ඇති යම් මාරු කිරීමක්, පැවරීමක් හෝ නම් කිරීමක් පිළිබඳ විස්තර ද, ඇතුළත් කරනු ලැබිය යුතු ය.

(ආ) හිමිකම් පෑම් පිළිබඳ ලේඛනයක් හෝ වාර්තාවක් තබා ගෙන ඒ ලේඛනය හෝ වාර්තාව පවත්වා ගෙන යනු ලැබිය යුතු අතර ඒ ලේඛනයෙහි හෝ වාර්තාවෙහි රක්ෂණකරු වෙත ඉදිරිපත් කරන ලද සෑම හිමිකම් පෑමක්, සහ ඒ හිමිකම් පෑමේ දිනය ද හිමිකම් පාන තැනැත්තාගේ නම හා ලිපිනය ද, හිමිකම් පෑම් බේරුම් කරන ලද දිනය ද , හිමිකම් පෑමක් ප්‍රතික්ෂේප කරනු ලැබූ අවස්ථාවක ප්‍රතික්ෂේප කරන ලද දිනය හා ප්‍රතික්ෂේප කිරීමට හේතු ද ඇතුළත් කරනු ලැබිය යුතු ය.

ණය තහනම් කිරීම.

**29.** (1) මණ්ඩලයේ පූර්ව අනුමතය ඇතිව හැර, යම් රක්ෂණකරුවකුගේ අධ්‍යක්ෂ ධුරය දරන යම් තැනැත්තකුට හෝ ඒ තැනැත්තා එවැනි යම් තනතුරක් දරන යම් සමාගමකට හෝ ඒ රක්ෂණකරු විසින් නිකුත් කරන ලද ජීවිත රක්ෂණ ඔප්පුවක් උකස් කිරීම මත වූ ණයක් නොවන යම් ණයක් ඒ රක්ෂණකරු විසින් ප්‍රදානය කරනු නොලැබිය යුතු ය. ඒ ණය ආපසු ගෙවීම සඳහා ප්‍රමාණවත් ඇපයක් දී ඇති බවට මණ්ඩලය සෑහීමට පත් වන්නේ නම් පමණක් , මණ්ඩලය විසින් ඉහත කී අනුමතය දෙනු ලැබිය යුතු ය.

(2) එවැනි රක්ෂණකරුවකුගේ අධ්‍යක්ෂවරයකුට හෝ ඒ තැනැත්තා අධ්‍යක්ෂවරයකු වන යම් සමාගමකට හෝ ජීවිත රක්ෂණ ඔප්පුවක් උකස් කිරීම මත රක්ෂණකරු විසින් ණයක් ප්‍රදානය කර ඇති හා ඒ ණය නියමිත දිනයේ දී ගෙවීම හිඟ තබා ඇති අවස්ථාවක, යම් එකඟ වීමක හෝ ගිවිසුමක පටහැනිව කුමක් සඳහන්ව ඇත ද, ණය ආපසු ගෙවීම සඳහා ඒ තැනැත්තා විසින් තබා ඇති ඇපයේ ප්‍රමාණවත් භාවය පිළිබඳව පරීක්ෂා කිරීමට අවශ්‍ය යයි මණ්ඩලය විසින් සලකනු ලබන්නේ නම්, නිශ්චිතව සඳහන් කරනු ලබන දිනයක දී හෝ එදිනට පෙර ඒ ණය ආපසු ගෙවන ලෙස හෝ අතිරේක ඇපයක් තබන ලෙස නියම කිරීමට ද මණ්ඩලයට බලය තිබිය යුතු ය. නිශ්චිතව සඳහන් කරන ලද දිනයේ දී හෝ එදිනට පෙර ඒ තැනැත්තා විසින් ණය ආපසු ගෙවීම හෝ අතිරේක ඇපයක් තැබීම හෝ පැහැර හරිනු ලැබුවහොත්, ඔහු ඒ දිනයේ සිට එක් අවුරුදු කාලයක් ඉකුත් වීමෙන් පසු ඒ රක්ෂණකරුගේ අධ්‍යක්ෂවරයකු ලෙස ධුර දැරීම නතර විය යුතු ය.

රක්ෂණකරුගේ වත්කම්, රක්ෂණකරුගේ ව්‍යාපාර නාමයෙන් තබා ගත යුතු බව.

**30.** යම් රක්ෂණකරුවකුගේ වත්කම් කිසිවක් ඒ රක්ෂණකරුගේ නාමයෙන් හැර අන්‍යාකාරයකින් තබා ගනු නොලැබිය යුතු ය.

ප්‍රතිරක්ෂණය.

**31.** (1) රක්ෂණකරුවකු විසින් රක්ෂණ ඔප්පු දරන්නන්ගේ යහපත සහතික කිරීම පිණිස හා රක්ෂණකරුවන්ට ප්‍රමාණවත් ලෙස ආරක්ෂාව සැලසී ඇති බවට සහතික කිරීම පිණිස, මණ්ඩලය විසින් නිශ්චිතව දක්වනු ලබන යම් නියම හා කොන්දේසිවලට යටත්ව ඒ රක්ෂණකරු විසින් සිදු කරන ලද හෝ නිකුත් කරන ලද යම් ගිවිසුමකින් හෝ රක්ෂණ ඔප්පුවකින් උද්ගත වන යම් වගකීමක් ශ්‍රී ලංකාව ඇතුළත හෝ ඉන් පිටත වෙනත් යම් රක්ෂණකරුවකු සමග ප්‍රතිරක්ෂණය කළ හැකි ය.

(2) මණ්ඩලය විසින් ලියවිල්ලකින් වූ දැන්වීමක් මගින්, ප්‍රතිරක්ෂණය කරන යම් රක්ෂණකරුවකුගෙන් ඒ රක්ෂණකරු වෙත ඉදිරිපත් කරනු ලැබිය හැකි යම් හිමිකම් පෑමක් මත මුදල් ගෙවීම පිණිස අවශ්‍ය මුදල් ඒ රක්ෂණකරුට තිබේ ද යන වග නිසැකව දැන ගැනීම සඳහා අවශ්‍ය යයි මණ්ඩලය සලකන තොරතුරු ඉදිරිපත් කරන ලෙස, ඒ රක්ෂණකරුට නියම කරනු ලැබිය හැකි අතර ඒ දැන්වීමේ නියමයන් අනුව ක්‍රියා කිරීම, ඒ රක්ෂණකරුගේ යුතුකම විය යුතු ය.

(3) මණ්ඩලය විසින් කලින් කල ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නිවේදනයක් මගින්, ශ්‍රී ලංකාව තුළ කරනු ලබන රක්ෂණ ව්‍යාපාර සම්බන්ධයෙන් නිකුත් කරන ලද රක්ෂණ ඔප්පු මත හෝ සිදු කරන ලද ගිවිසුම් මත වූ අවදානම්, ශ්‍රී ලංකාවෙන් පිටත යම් නිශ්චිතව සඳහන් කරන ලද ප්‍රතිරක්ෂණකරුවකු සමග ප්‍රතිරක්ෂණය කිරීම, ඒ ප්‍රතිරක්ෂණකරු සමග වූ එවැනි යම් වැඩපිළිවෙලක් ජාතික අභිවෘද්ධියට හානිකරවන අවස්ථාවක, තහනම් කරනු ලැබිය හැකි ය :

එසේ වුවද, මේ උපවගන්තිය යටතේ යම් නිවේදනයක් නිකුත් කිරීමට පෙර, මණ්ඩලය විසින් එවැනි නිවේදනයක් නිකුත් කිරීමට ඇති එහි අදහස ඒ නිශ්චිතව සඳහන් කරන ලද ප්‍රතිරක්ෂණකරු සමග ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් පිටත ප්‍රතිරක්ෂණ ව්‍යාපාරය කර ගෙනයන රක්ෂණකරු හෝ රක්ෂණකරුවන් වෙත දැනුම් දිය යුතු අතර, මණ්ඩලයේ එම යෝජිත තීරණය සම්බන්ධයෙන් ඒ රක්ෂණකරු හෝ රක්ෂණකරුවන් විසින් කරනු ලබන කරුණු දැක්වීම් කිසිවක් මණ්ඩලය විසින් සලකා බලනු ලැබිය යුතු ය.

රක්ෂණ ව්‍යාපාරය කර ගෙන යන රක්ෂණකරුගේ කාර්ය මණ්ඩලය.

**32.** (1) රක්ෂණ කටයුතු කර ගෙන යන සෑම රක්ෂණකරුවකු විසින් ම, වරලත් රක්ෂණ ආයතනයේ සාංගමික සුදුසුකම හෝ මණ්ඩලයට පිළිගත හැකි සමාන සුදුසුකමක් ඇත්තා වූ ද, කළමනාකරණ මට්ටමින් යටත් පිරිසෙයින් අවුරුදු පහක පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද ඇත්තා වූ ද යටත් පිරිසෙයින් එක් තැනැත්තකු නිශ්චිත නිලධරයකු වශයෙන් සේවයෙහි නියුක්ත කරනු ලැබිය යුතු ය.

(2) නිශ්චිත නිලධරයකු වශයෙන් සේවයෙහි නියුක්ත කරන ලද තැනැත්තකුට 94 වන වගන්තිය යටතේ මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන පරිදි ප්‍රධාන නිලධරයකුගේ සුදුසුකම් ඇත්නම්, ඒ නිශ්චිත නිලධරයා රක්ෂණකරුගේ ප්‍රධාන නිලධරයා වශයෙන් ද කටයුතු කළ හැකි ය.

රක්ෂණකරුවකු විසින් තැරැව්කාර සමාගමක කොටස් දැරීම ආදිය තහනම් කිරීම.

**33.** (අ) කිසිම රක්ෂණකරුවකු හෝ රක්ෂණකරුවකුගේ පාලක හෝ පාලිත හෝ ආශ්‍රිත සමාගමක් ; හෝ

(ආ) රක්ෂණකරුවකුගේ අධ්‍යක්ෂවරයා, ප්‍රධාන නිලධරයා හෝ නිශ්චිත නිලධරයා හෝ රක්ෂණකරුවකුගේ පාලක හෝ පාලිත හෝ ආශ්‍රිත සමාගමක අධ්‍යක්ෂවරයා හෝ ප්‍රධාන විධායක නිලධරයා හෝ

මේ පනත යටතේ තැරැව්කරුවකු වශයෙන් ලියාපදිංචි කරන ලද සමාගමක, කොටස් හිමියකු, අධ්‍යක්ෂවරයකු හෝ සේවා නියුක්තයකු නොවිය යුතු ය :

එසේ වුවද, රක්ෂණකරුවකු හෝ මේ වගන්තියේ සඳහන් පරිදි වූ යම් තැනැත්තකු මේ පනත යටතේ තැරැව්කරුවකු වශයෙන් ලියාපදිංචි කරන ලද යම් සමාගමක ලියාපදිංචි කරන ලද දිනයේ දී කොටස් හිමියකු, අධ්‍යක්ෂවරයකු හෝ සේවා නියුක්තයකු වන අවස්ථාවක, ඒ රක්ෂණකරුට හෝ තැනැත්තාට, මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන යම් කාලයක් ඇතුළත, අවස්ථාවෝචිත පරිදි, ඒ කොටස් බැහැර කරන ලෙස හෝ ඒ අධ්‍යක්ෂ ධුරය හෝ සේවා නියුක්තිය අත්හරින ලෙස නියම කරනු ලබන්නේ ය.

රක්ෂණකරුවකු රක්ෂණ කටයුතු භාර ගත හැකි වන්නේ කවර තැනැත්තන්ගෙන් ද යන වග.

**34.** කිසිම රක්ෂණකරුවකු විසින්-

(අ) රක්ෂණයේ විෂය කාරණයෙහි ලා රක්ෂණය කළ යුතු සම්බන්ධතාවක් ඇති යම් තැනැත්තකුගෙන් ;

(ආ) ප්‍රතිරක්ෂණය සම්බන්ධයෙන් වෙනත් රක්ෂණකරුවකුගෙන් ;

(ඇ) රක්ෂණ නියෝජිතයෙකුගෙන් ; හෝ

(ඇ) මේ පනත යටතේ ලියාපදිංචි කරන ලද රක්ෂණ තැරැව්කරුවකුගෙන්

හැර, රක්ෂණ කටයුතු කිසිවක් භාර ගනු නොලැබිය යුතු ය.

සාමාන්‍ය රක්ෂණ ඔප්පු යටතේ රක්ෂණකරුවකුගේ බැඳීම.

**35.** ජීවිත රක්ෂණ ව්‍යාපාර නොවන, රක්ෂණ ව්‍යාපාර සම්බන්ධයෙන් රක්ෂණකරුවකු විසින් සිදු කරන ලද හෝ නිකුත් කරන ලද යම් රක්ෂණ ගිවිසුමක් හෝ රක්ෂණ ඔප්පුවක් යටතේ ගෙවිය යුතු යම් මුදලක් ගෙවීමට -

(අ) ඒ ගිවිසුම හෝ රක්ෂණ ඔප්පුව යටතේ අයවීමට ඇති මුළු වාරික, ඒ මුදල ගෙවිය යුතු වන දිනයේ දී ගෙවා ඇත්නම් ; හෝ

(ආ) ඒ වාරික මුදල ගෙවිය යුතු වන දිනයේ දී, රක්ෂිතයා හෝ තැරැව්කරු විසින් ඒ වාරික ගෙවීම සඳහා බැංකු ඇපයක් සපයා ඇත්නම් සහ ඒ රක්ෂිතයා හෝ තැරැව්කරු විසින් ඒ වාරික, මණ්ඩලය විසින් නිශ්චය කරන යම් කාලයක් ඇතුළත ගෙවනු ලබන්නේ නම්

මිස, ඒ රක්ෂණකරු යටත් නොවිය යුතු ය.

ඇතැම් රක්ෂණ අනු පන්ති සම්බන්ධයෙන් බදු අනුප්‍රමාණ නියම කිරීමට මණ්ඩලය සතු බලය.

**36.** (1) රක්ෂණකරුවන් විසින් පනවා ඇති යම් බදු සීමා, රක්ෂණ ඔප්පු දරන්නන් කෙරෙහි හානිකර ලෙස බලපාන බව මණ්ඩලයේ අදහස වන අවස්ථාවක, රක්ෂණකරුවන් විසින් නිකුත් කරනු ලබන රක්ෂණ ඔප්පු සම්බන්ධයෙන් ඒ රක්ෂණකරුවන් විසින් අය කරනු ලැබිය යුතු මෝටර් රථ, ගිනි හා සේවායෝජකයන්ගේ වගකීම් සඳහා වූ අවම බදු, මණ්ඩලය විසින් කලින් කල නියම කරනු ලැබිය හැකි අතර, මෝටර් රථ රක්ෂණ ව්‍යාපාරය සඳහා ද වූ උපරිම බදු, මණ්ඩලය විසින් නියම කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් යම් අනුපන්තියකට අයත් රක්ෂණයක් සම්බන්ධයෙන් නිකුත් කරන ලද ගිවිසුමක් හෝ රක්ෂණ ඔප්පුවක් යටතේ, කිසිම රක්ෂණකරුවකු විසින් -

(අ) (1) වන උපවගන්තිය යටතේ මෝටර් රථ, ගිනි හා සේවායෝජකයන්ගේ වගකීම් සම්බන්ධයෙන් නියම කරනු ලබන අවම අනුපාතයට වඩා අඩු ; හෝ

(ආ) (1) වන උපවගන්තිය යටතේ මෝටර් රථ රක්ෂණ සම්බන්ධයෙන් නියම කරනු ලබන උපරිම අනුපාතයට වඩා වැඩි

මුදල් වාරික වශයෙන් භාර ගනු නොලැබිය යුතු ය.

රක්ෂණ ඔප්පු ආකෘති පත්‍ර.

**37.** (1) රක්ෂණ ඔප්පු දරන්නන්ගේ අභිවෘද්ධිය ප්‍රමාණවත් ලෙස ආරක්ෂා වී තිබේ ද යන වග පරීක්ෂා කිරීමේ කාර්යය සඳහා, යම් රක්ෂණකරුවකු විසින් නිකුත් කරන ලද රක්ෂණ ඔප්පු ආකෘති පත්‍රවල පිටපත් මණ්ඩලය වෙත සපයන ලෙස මණ්ඩලය විසින් ඒ රක්ෂණකරු වෙත ලියවිල්ලකින් වූ දැන්වීමක් මගින් නියම කරනු ලැබිය හැකි අතර, ඒ දැන්වීම අනුව ක්‍රියා කිරීම ඒ රක්ෂණකරුගේ යුතුකම විය යුතු ය.

(2) මණ්ඩලය විසින් ඒ රක්ෂණ ඔප්පු ආකෘති පත්‍රය මගින් ආවරණය කරන ලද රක්ෂණ ගිවිසුමේ නියමයන් සාධාරණ හා සාධාරණීය බව සහතික කිරීමේ අවශ්‍යතාව සැලකිල්ලට ගෙන, (1) වන උපවගන්තිය යටතේ මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද යම් රක්ෂණ ඔප්පු ආකෘති පත්‍රයක් සංශෝධනය කරන ලෙස විධාන කරනු ලැබිය හැකි අතර, ඒ සංශෝධන බලාත්මක කිරීම, ඒ ආකෘති පත්‍ර ඉදිරිපත් කරන රක්ෂණකරුගේ යුතුකම විය යුතු ය.

(3) මණ්ඩලයේ යම් සාමාජිකයකු හෝ එහි යම් නිලධරයකු හෝ සේවකයකු විසින් ලබා ගන්නා ලද කිසිම තොරතුරක්, අධිකරණයක් විසින් නියම කරනු ලැබූ විට හෝ මණ්ඩලයේ බලතල ක්‍රියාත්මක කිරීමේ හෝ කාර්ය හා කර්තව්‍ය ඉටු කිරීමේ කාර්යය සඳහා හැර, ඒ තැනැත්තා විසින් හෙළිදරව් කිරීම හෝ පාවිච්චි කිරීම හෝ නොකළ යුතු ය.

## IV වන කොටස

## දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාර

වෙනම අරමුදලක් පවත්වා ගෙන යාම සහ දීර්ඝ කාලීන රක්ෂණ කටයුතුවලට අදාළ වත්කම්, වෙනත් යම් ව්‍යාපාරයකට අදාළ වත්කම්වලින් වෙන්ව තබා ගැනීම, ඒ කටයුතු කර ගෙන යන රක්ෂණකරුවකුගේ යුතුකම බව.

**38.** (1) තනිව හෝ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයට අමතරව, දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරය කර ගෙන යන සෑම රක්ෂණකරුවකු විසින් ම –

(අ) "දීර්ඝ කාලීන රක්ෂණ අරමුදල" යනුවෙන් හඳුන්වනු ලබන වෙනම අරමුදලක් පවත්වා ගෙන යා යුතු අතර, ඒ රක්ෂණකරු විසින් කර ගෙන යනු ලබන දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරය සම්බන්ධයෙන් ලැබෙන සියලු මුදල් ඒ අරමුදලට බැර කරනු ලැබිය යුතු ය ; තව ද

(ආ) දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරය සම්බන්ධයෙන් වන වත්කම්, වෙනත් යම් පංතියක රක්ෂණ ව්‍යාපාර සම්බන්ධයෙන් වූ වත්කම්වලින් වෙන්ව තබා ගනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ රක්ෂණකරුවකු විසින් පවත්වාගෙන යනු ලබන දීර්ඝ කාලීන රක්ෂණ අරමුදල, රක්ෂණකරුගේ ව්‍යාපාරය දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරය පමණක් වූයේ නම්, රක්ෂණකරු වගකිව යුතු නොවන, රක්ෂණකරුගේ ගිවිසුම් කිසිවකට වගකිව යුතු නොවන අතර, ඒ අරමුදල ඒ රක්ෂණකරු විසින් කර ගෙන යනු ලබන දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරය නොවන යම් කාර්ය සඳහා කෙළින් ම හෝ අන්‍යාකාරයකින් යොදා ගනු නොලැබිය යුතු ය.

(3) රක්ෂණකරුවකු විසින්, (1) වන උපවගන්තියේ විධිවිධානවලට අනුව ක්‍රියා කරනු ලබන්නේ ද යන වග සත්‍යායනය කිරීමේ කාර්යය සඳහා, මණ්ඩලය විසින් -

(අ) නියම කරනු ලබන යම් ආකෘතියක, වාර වාර්තාවක් කලින් කල සපයන ලෙස ඒ රක්ෂණකරුගෙන් ඉල්ලා සිටිනු ලැබිය හැකි ය.

(ආ) ඒ රක්ෂණකරු දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරය කර ගෙන යනු ලබන ස්ථානයට සියලු යුක්ති සහගත වේලාවන්හි දී ඇතුළුව, රක්ෂණකරුගේ ඒ ව්‍යාපාරයට අදාළ පොත්, රෙජිස්ටර හෝ ලේඛන කිසිවක් පරීක්ෂා කිරීමට, නිලධරයකුට ලියවිල්ලකින් බලය දෙනු ලැබිය හැකි අතර, ඒ රක්ෂණකරු විසින් ඒ වාර වාර්තාව සැපයීම හෝ ඒ නිලධරයාට ඒ ස්ථානයට ඇතුළුව ඒ පරීක්ෂණය කිරීමට අවසර දෙනු ලැබිය යුතු ය.

(4) 48 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරය කරන රක්ෂණකරුවකුගේ මූල්‍ය කටයුතු සම්බන්ධයෙන් ජීව ගණක විමර්ශනයකින් පසුව, බෙදා හැරීම සඳහා තිබෙන බවට ජීව ගණක විසින් නිර්දේශ කර ඇති සහභාග රක්ෂණ ඔප්පු සම්බන්ධයෙන් ස්ථාපිත අතිරික්තයක් ඇති අවස්ථාවක, යටත් පිරිසෙයින් ඒ අතිරික්තයෙන් සියයට අනූවක් හෝ සහභාගී රක්ෂණ ඔප්පු දරන්නන්ට ප්‍රසාද දීමනා ගෙවීම සඳහා රක්ෂණකරු විසින් වෙන් කරනු ලැබ ඇත්නම් මිස, රක්ෂණකරු විසින් ඒ අතිරික්තයේ යම් කොටසක් සංයුක්ත වත්කම් පැවරීම හෝ අන්‍යාකාරයකින් යොදා ගැනීම නොකළ යුතු ය.

දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාර ඔප්පු භාර කිරීම හෝ පැවරීම.

**39.** (1) ප්‍රතිඡ්ඨාවක් ඇතිව හෝ නැතිව දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාර ඔප්පුවක් පැවරීමක් හෝ භාර කිරීමක්, රක්ෂණ ඔප්පුව මතම පිටසනක් කිරීමෙන් නැතහොත් පැවරුම්කරු හෝ භාර කරන්නා හෝ ඒ පැවරුම්කරුගේ හෝ භාර කරන්නාගේ යථා පරිදි බලය දෙන ලද අනුයෝජිතයා හෝ විසින් අත්සන් කරන ලදුව, පැවරීම හෝ භාර කිරීම පිළිබඳ කරුණු නිශ්චිතව ම සඳහන් කර දක්වමින් යටත් පිරිසෙයින් එක් සාක්ෂිකරුවකු හෝ විසින් සහතික කරන ලද වෙනම වූ සාධන පත්‍රයක් මගින් පමණක් කරනු ලැබිය හැකි ය.

(2) දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාර ඔප්පුවක් පිළිබඳ කිසිම පැවරීමක් හෝ භාර කිරීමක්, එය (1) වන උපවගන්තියට අනුකූලව සාදනු ලැබ අත්නම් මිස සහ පැවරීම හෝ භාර කිරීම පිළිබඳ ලියවිල්ලකින් වූ දැන්වීමක්, සාධන පත්‍රය හා පිටසන ද, පැවරීමට හෝ භාර කිරීමට සම්බන්ධ පාර්ශ්වකරුවන් විසින් හෝ ඔවුන් වෙනුවෙන් හෝ නිවැරදි බවට සහතික කරන ලද එහි පිටපතක් ද සමග රක්ෂණකරු වෙත, ශ්‍රී ලංකාව තුළ පිහිටි එහි ප්‍රධාන ව්‍යාපාර ස්ථානයෙහි දී භාර දෙනු ලබන තෙක්, රක්ෂණකරු කෙරෙහි ප්‍රතිපක්ෂව කවර හෝ බලපෑමක් නොවිය යුතු ය.

(3) දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාර ඔප්පුවක් පිළිබඳව සම්බන්ධතාවක් දක්වන තැනැත්තන් අතර, ඒ රක්ෂණ ඔප්පුව යටතේ වූ සියලු හිමිකම් පෑම්වල ප්‍රමුඛතාව, (2) වන උපවගන්තියේ සඳහන් දැන්වීමක රක්ෂණකරු වෙත භාර දෙන ලද දිනය මගින් විධිමත් කරනු ලැබිය යුතු අතර, පැවරීම හෝ භාර කිරීම පිළිබඳ සාධන පත්‍ර එකකට වැඩි ප්‍රමාණයක් ඇති අවස්ථාවක, ඒ සාධන පත්‍රය යටතේ වූ හිමිකම් පෑම්වල ප්‍රමුඛතාව, (2) වන උපවගන්තියෙහි සඳහන් දැන්වීම් භාර දෙනු ලැබූ පිළිවෙල අනුව පාලනය විය යුතු ය.

(4) (2) වන උපවගන්තියෙහි සඳහන් දැන්වීම ලැබුණු විට, ඒ පැවරීමේ හෝ භාර කිරීමේ දිනය සහ පැවරුම්ලාභියාගේ හෝ භාරගත් තැනැත්තාගේ නම ද සහිතව, ඒ පැවරීම හෝ භාර කිරීම පිළිබඳ කරුණ රක්ෂණකරු විසින් සටහන් කරනු ලැබිය යුතු අතර, දැන්වීම දෙන ලද තැනැත්තාගේ හෝ පැවරුම්ලාභියාගේ හෝ භාරගත් තැනැත්තාගේ ඉල්ලීම පිට ඒ දැන්වීම ලැබුණු බවට ලියවිල්ලකින් වූ පිළිගැනීමක් කළ යුතු ය. තව ද, එවැනි යම් පිළිගැනීමක්, ඒ පිළිගැනීම අදාළ වන්නේ යම් දැන්වීමකට ද ඒ දැන්වීම රක්ෂණකරු වෙත යථා පරිදි ලැබී ඇති බවට, ඒ රක්ෂණකරුට ප්‍රතිපක්ෂව ඒ පිළිගැනීම තීරණාත්මක සාක්ෂියක් වන්නේ ය.

(5) පැවරීමේ හෝ භාර කිරීමේ නියම හා කොන්දේසිවලට යටත්ව, රක්ෂණකරු විසින්, (2) වන උපවගන්තියෙහි සඳහන් දැන්වීම ලැබුණු දින පටන් රක්ෂණ ඔප්පුව යටතේ ප්‍රතිලාභ ලැබීමට හිමිකම ඇති එකම තැනැත්තා වශයෙන් දැන්වීමෙහි නම් කරනු ලැබ ඇති පැවරුම්ලාභී හෝ භාරගත් තැනැත්තා පිළිගනු ලැබිය යුතු අතර, පැවරීම හෝ භාර දීම කරන ලද දිනයෙහි පැවරුම්කරු හෝ භාර කරන්නා යටත් වූ සියලු බැඳීම්වලට හා සාධාරණකම්වලට ඒ තැනැත්තා යටත් විය යුතු ය. තව ද, පැවරුම්කරුගේ හෝ භාරකරුගේ කැමැත්ත ලබා නොගෙන නැතහොත් නඩු කටයුතුවලට පැවරුම්කරු හෝ භාර කරන්නා පාර්ශ්වකරුවකු නොකර රක්ෂණ ඔප්පුව සම්බන්ධයෙන් රක්ෂණකරු විසින් නඩු කටයුතු පවරනු ලැබිය හැකි ය.

(6) නියමිත දිනට පෙරාතුව සිදු කරන ලද භාර කිරීමක් හෝ පැවරීමක් යටතේ දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාර ඔප්පුවක් භාරගත් තැනැත්තකුට හෝ පැවරුම්ලාභියකුට ඇති අයිතිවාසිකම් හා ප්‍රතිකර්ම කෙරෙහි මේ වගන්තියේ විධිවිධානවලින් බලපෑමක් නොවිය යුතු ය.

(7) යම් නීතියක් හෝ නීතියේ බලය ඇති සිරිතක පටහැනිව කුමක් සඳහන්ව ඇත ද, භාර කිරීමක සම්බන්ධතාව, ජීවිතය රක්ෂණය කරන ලද තැනැත්තාගේ ජීවිත කාලය තුළ දී යම් නිශ්චිත සිද්ධියක් සිදුවීම මත වෙනත් යම් තැනැත්තකුට හිමි විය යුතු යයි යන කොන්දේසිය ඇතිව යම් තැනැත්තකුගේ වාසියට කරන ලද භාර කිරීමක් සහ තැනැත්තන් ගණනාවකගේ, ජීවත්ව සිටින තැනැත්තකුගේ හෝ තැනැත්තන්ගේ වාසියට කරන ලද භාර කිරීමක් වලංගු වන්නේ ය.

රක්ෂණ ඔප්පුව මගින් පවාරණ අගය අත්කර ගැනීම.

40. (1) දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාර රක්ෂණ ඔප්පුවක් ප්‍රකාර, යම් තැනැත්තකු නියම කර ඇති දිනයක් දක්වා ජීවත්ව සිටීම මත හෝ ඒ තැනැත්තා මිය යාම මත ඒ රක්ෂණ ඔප්පුව කල් පිරිය යුතුව ඇති හා රක්ෂණ ඔප්පුව නියම කර ඇති කාලයක් සඳහා ඒකාකාර වූ අනුප්‍රමාණයක් මත නැතහොත් ඒ නියම කරන ලද කාලය ඉකුත් වීමට පෙර මිය යාම සිදුවන අවස්ථාවක, ඒ මිය යාම දක්වා වාරික ගෙවීමට යටත්ව ඇති හා සියලු වාරික අනුක්‍රමික අවුරුදු තුනක් සඳහා ගෙවා ඇති අවස්ථාවක, ඒ රක්ෂණ ඔප්පුව පවාරණ අගයක් අත්කර ගෙන ඇතැයි සලකනු ලැබිය යුතු අතර, පටහැනිව යම් ගිවිසුමක

කුමක් සඳහන්ව ඇත ද, වැඩිදුර වාරික නොගෙවීම හේතුකොට ගෙන ඒ රක්ෂණ ඔප්පුව අභාවිත නොවිය යුතු නමුත්, ඒ නොගෙවීම නොතකා එහි ගෙවා නිමි අගයේ ප්‍රමාණයට එය බලාත්මකව පැවතිය යුතු ය.

මේ උපවගන්තියේ කාර්යය සඳහා, පවාරණ අගය හා ගෙවා නිමි අගය ගණන් බැලීම සඳහා භාවිත කළ යුතු ක්‍රමය, ජීව ගණකවරයකු විසින් සහතික කරනු ලැබිය යුතු ය.

(2) යම් රක්ෂණකරුවකුට අය වීමට ඇති ණයක් රක්ෂණකරු විසින් නිකුත් කරන ලද දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාර රක්ෂණ ඔප්පුවක් සුරක්ෂිත කර ඇති හා (1) වන උපවගන්තිය යටතේ රක්ෂණ ඔප්පුව, එහි ගෙවා නිමි අගයේ ප්‍රමාණයට සජීවී ලෙස තබා ඇති අවස්ථාවක, රක්ෂණකරු විසින්-

(අ) ඒ ණය සජීවී ලෙස එසේ තබා ඇති රක්ෂණ ඔප්පුව මගින් සුරක්ෂිත කරන ලද ණයක් ලෙස සලකනු ලැබිය හැකි අතර, ඉනික්බිතිව එසේ සජීවී ලෙස තබා ඇති රක්ෂණ ඔප්පුව, ණය වෙනුවෙන් ඇපයක් විය යුතු ය ; නැතහොත්

(ආ) ඒ ගෙවා නිමි අගයේ මුදල්, එහි වර්තමාන අගය ණය මුදලට සමාන වන මුදලකින් අඩු කරනු ලැබිය හැකි අතර, ඉනික්බිතිව ඒ ණය රක්ෂණකරු වෙත අය වීමට තිබීම නතර විය යුතු ය.

(3) මේ වගන්තිය-

(අ) උද්ගත නොවිය හැකි යම් අනිශ්චිත අවස්ථාවක් සිදුවීම මත පමණක් රක්ෂණ මුදල ගෙවිය යුතු වන ;

(ආ) රක්ෂණ ඔප්පුවේ ගෙවා නිමි අගය, මණ්ඩලය විසින් කලින් කල නියම කරන ලද යම් මුදලකට වඩා අඩු වන ;

(ඇ) වාරිකය ගෙවීමෙහි ලා පැහැර හැරීමක් සිදු වීමෙන් පසුව, පාර්ශ්වකරුවන් වෙනත් යම් වැඩපිළිවෙලකට ලියවිල්ලක් මගින් එකඟ වන ; හෝ

(ඇ) වාරික නොගෙවීම නොතකා, රක්ෂණ ඔප්පුව බලාත්මකව පවත්වා ගෙන යාම සඳහා ගිවිසුමේ කොන්දේසි යටතේ රක්ෂණ ඔප්පුවේ පවාරණ අගය ඉබේම අදාළ කරනු ලබන

කවර හෝ අවස්ථාවක, අදාළ නොවිය යුතු ය.

අවුරුදු දෙකකට පසුව, වැරදි ප්‍රකාශයක් හේතුකොට ගෙන රක්ෂණ ඔප්පුව පිළිබඳව ප්‍රශ්න නොකළ යුතු බව.

**41.** කිසිම දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාර රක්ෂණ ඔප්පුවක්, ඒ රක්ෂණ ඔප්පුව නිකුත් කරන ලද දිනයේ සිට අවුරුදු දෙකක කාලයක් ඉකුත් වීමෙන් පසුව, ඒ රක්ෂණ ඔප්පුව නිකුත් කරන ලද්දේ හෝ පුනර්යුක්ත කරන ලද්දේ යම් යෝජනාවක හෝ වෙනත් ලේඛනයක විශ්වාසය මත ද, ඒ යෝජනාවෙහි හෝ වෙනත් ලේඛනයෙහි නැතහොත් වෛද්‍ය නිලධරයකුගේ හෝ තීරකයකුගේ යම් වාර්තාවක කරන ලද ප්‍රකාශයක්, එවැනි ප්‍රකාශයක් වැදගත් කාරණයක් සම්බන්ධයෙන් කරන ලද බව හෝ හෙළිදරව් කිරීම වැදගත් වන්නා වූ කරුණු යටපත් කරන ලද බව, සහ රක්ෂණ ඔප්පුව දරන්නා විසින් ඒ ප්‍රකාශය වංචනික ලෙස කරන ලද බව ; සහ ප්‍රකාශය කරන ලද අවස්ථාවේ දී ඒ ප්‍රකාශය අසත්‍ය යයි නැතහොත් හෙළිදරව් කිරීම වැදගත් වන්නා වූ කරුණු යටපත් කරන ලදැයි රක්ෂණ ඔප්පුව දරන්නා දැන සිටි බව රක්ෂණකරු විසින් පෙන්වනු ලැබුවහොත් මිස, වැරදි සහිත යයි හෝ අසත්‍ය යයි යන හේතුව මත, යම් රක්ෂණකරුවකු විසින් ප්‍රශ්න කරනු නොලැබිය යුතු ය :

එසේ වුව ද, රක්ෂණ ඔප්පුවේ කොන්දේසි යටතේ වයස පිළිබඳ සාක්ෂි ඉල්ලා සිටීමට රක්ෂණකරු හිමිකම් ලබන්නේ නම්, මේ වගන්තියෙහි ඇතුළත් කිසිවකින් රක්ෂණකරු එසේ සාක්ෂි ඉල්ලා සිටීමෙන් වළක්වනු නොලැබිය යුතු අතර, රක්ෂණ ඔප්පුවේ කොන්දේසි, හුදෙක් ජීවිත රක්ෂණය කරනු ලැබූ තැනැත්තාගේ වයස යෝජනා පත්‍රයේ වැරදි ලෙස ප්‍රකාශ කර තිබීම පිළිබඳව ලැබුනු සාක්ෂි මත සකස් කිරීම නිසා කිසිම රක්ෂණ ඔප්පුවක් පිළිබඳව ප්‍රශ්න කරනු ලැබූ ලෙස සලකනු නොලැබිය යුතු ය.

මනාප ආදිය පිළිබඳව දැන්වීම.

**42.** (1) දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාර රක්ෂණ ඔප්පුවක් සම්බන්ධයෙන් ගෙවිය යුතු යම් වාරිකයක් එය ගෙවිය යුතු වන දිනයේ දී ගෙවනු නොලැබූ අවස්ථාවක, මනාප පිළිබඳව රක්ෂණ ඔප්පුවේ දක්වා ඇත්තම් මිස, එකී දිනයේ සිට මාස තුනක

කාලයක් ඉකුත් වීමට පෙර රක්ෂණකරු විසින් රක්ෂණ ඔප්පුව දරන්නාට ඇති මනාප පිළිබඳව ඔහුට දැනුම් දිය යුතු අතර, ඉන් අනතුරුව ලබාගත හැකි මනාප පිළිබඳව කිසිම වැඩිදුර දැනුම් දීමක් රක්ෂණ ඔප්පුව දරන්නාට දෙනු නොලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියෙහි සඳහන් සෑම දැන්වීමක් ම, එය රක්ෂණ ඔප්පුවෙහි සඳහන් ලිපිනයට හෝ ලිපිනයක් එසේ සඳහන් කර නොමැති අවස්ථාවක, රක්ෂණකරු විසින් වාරික අලුත් කිරීමේ දැන්වීමක් හෝ ලදු පතක් රක්ෂණ ඔප්පුව දරන්නාට අවසන් වරට යවනු ලැබූ ලිපිනයට හෝ යවනු ලැබුවහොත්, ඒ දැන්වීම රක්ෂණ ඔප්පුව දරන්නාට යථා පරිදි දෙනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(3) රක්ෂණ ඔප්පුව සඳහා වූ යෝජනාවෙහි සහ යෝජක විසින් වෛද්‍ය නිලධරයා වෙත කරනු ලැබූ පෞද්ගලික ප්‍රකාශයෙහි සහතික පිටපත් රක්ෂණ ඔප්පුවට අමුණා ඇත්තේ නම් මිස, ඒ යෝජනාවේ හා පෞද්ගලික ප්‍රකාශයෙහි සහතික පිටපතක් ලබා ගැනීම සඳහා රක්ෂණකරුවකු වෙත කරනු ලැබූ ඉල්ලීමක් මත, රක්ෂණකරු විසින්, රක්ෂණ ඔප්පුව දරන්නාට හෝ ඔහුගේ නීත්‍යනුකූල නියෝජිතයාට හෝ රක්ෂණ ඔප්පුව භාරගත් තැනැත්තකුට හෝ ඒ සහතික පිටපත සපයනු ලැබිය යුතු ය.

රක්ෂණ ඔප්පුවෙන් සුරක්ෂිත කරන ලද මුදල් ගෙවනු ලැබිය යුතු තැනැත්තා හෝ තැනැත්තන් නම් කිරීම සඳහා රක්ෂණ ඔප්පුව දරන්නා සතු බලය.

**43.** (1) දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාර රක්ෂණ ඔප්පුවක් දරන්නා මගින්, රක්ෂණ ඔප්පුව බලාත්මක කරන විට හෝ ගෙවීම සඳහා රක්ෂණ ඔප්පුව කල් පිරීමට පෙර කවර හෝ විටක, රක්ෂණ ඔප්පුවෙන් සුරක්ෂිත කරන ලද මුදල ඔහු මිය ගිය විට ගෙවිය යුතු තැනැත්තා හෝ තැනැත්තන් නම් කරනු ලැබිය හැකි ය :

එසේ වුව ද, යම් නාමිකයකු බාල වයස්කාරයකු වන අවස්ථාවක, බාලවයස්කරුගේ බාල වයස් කාලය පවත්නා කාලය තුළ දී රක්ෂණ ඔප්පුව දරන්නා මියගිය හොත්, රක්ෂණ ඔප්පුව මගින් සුරක්ෂිත කරන ලද මුදල ලබා ගැනීම සඳහා රක්ෂණ ඔප්පුව දරන්නා විසින් නියමිත ආකාරයෙන් යම් තැනැත්තකු පත් කිරීම නීත්‍යනුකූල වන්නේ ය.

(2) (1) වන උපවගන්තිය යටතේ කරන ලද නම් කිරීමක්, එය රක්ෂණ ඔප්පුවේ සන්දර්භයෙහි ම ඇතුළත් කර ඇත්තම් මිස, රක්ෂණ ඔප්පුවෙහි කරනු ලබන පිටසනක් මගින් කළ යුතු

අතර, ඒ පිටපත ලියවිල්ලකින් වූ දැන්වීමක් මගින් රක්ෂණකරු වෙත දැනුම් දිය යුතු ය. තව ද, රක්ෂණකරු විසින් පිටපත ඒ රක්ෂණ ඔප්පුවට අදාළ වාර්තාවෙහි හෝ ලේඛනයෙහි ලියාපදිංචි කරනු ලැබිය යුතු ය. එවැනි යම් නම් කිරීමක් රක්ෂණ ඔප්පුව ගෙවීම සඳහා කල්පිරීමට පෙර කවර හෝ අවස්ථාවක දී, අවස්ථාවෝචිත පරිදි, වෙනත් පිටපතක් මගින් හෝ රක්ෂණ ඔප්පුව දරන්නාගේ අන්තිම කැමති පත්‍රයක් මගින් හෝ අවලංගු කළ හැකි ය ; නැතහොත් වෙනස් කල හැකි ය. තව ද එවැනි යම් අවලංගු කිරීමක් හෝ වෙනස් කිරීමක් පිළිබඳව රක්ෂණ ඔප්පුව දරන්නා විසින් රක්ෂණකරු වෙත ලියවිල්ලකින් වූ දැන්වීමක් දී ඇත්නම් මිස, රක්ෂණ ඔප්පුවේ සන්දර්භයෙහි සඳහන් කරන ලද හෝ රක්ෂණකරුගේ වාර්තාවල ලියාපදිංචි කරන ලද නාමිකයකුට රක්ෂණකරු විසින් රක්ෂණ ඔප්පුව යටතේ සද්භාවයෙන් කරනු ලැබූ යම් ගෙවීමක් සම්බන්ධයෙන් ඔහු බැඳීමකට යටත් නොවිය යුතු ය.

(3) නම් කිරීමක් හෝ එය අවලංගු කිරීමක් හෝ වෙනස් කිරීමක් ලියාපදිංචි කරනු ලැබූ බවට ලිඛිත පිළිගැනීමක් රක්ෂණකරු විසින් රක්ෂණ ඔප්පුව දරන්නා වෙත සපයනු ලැබිය යුතු ය.

(4) 39 වන වගන්තියට අනුකූලව සිදු කරන ලද රක්ෂණ ඔප්පුවක් පැවරීමක හෝ භාර කිරීමක, නම් කිරීමක් අවලංගු කිරීමේ බලපෑම ඇත්තේ ය :

එසේ වුවද, රක්ෂණ ඔප්පුවක පවාරණ අගයේ ප්‍රමාණයට ඒ රක්ෂණ ඔප්පුව ඇපයට තබා ගෙන රක්ෂණකරු විසින් දෙන ලද ණයක් සැලකිල්ලට ගෙන රක්ෂණ ඔප්පුව භාර කරන අවස්ථාවේ දී ඒ රක්ෂණ ඔප්පුවේ අවදානම දරන රක්ෂණකරුට රක්ෂණ ඔප්පුවක් භාර කිරීම හෝ ඒ ණය ආපසු ගෙවීමේ දී කරනු ලබන නැවත භාර කිරීම හේතුකොට ගෙන නම් කිරීමක අවලංගු වීමක් සිදු නොවිය යුතු නමුත්, රක්ෂණ ඔප්පුව විෂයයෙහි රක්ෂණකරුගේ සම්බන්ධතාවේ ප්‍රමාණයට පමණක් නාමිකයාගේ අයිතිවාසිකම් කෙරෙහි එයින් බලපෑමක් ඇති විය යුතු ය.

(5) ජීවිතය රක්ෂණය කරන ලද තැනැත්තාගේ ජීවිත කාලය තුළ දී ගෙවීම සඳහා රක්ෂණ ඔප්පුව කල් පිරෙන අවස්ථාවක හෝ නාමිකයා හෝ නාමිකයන් එක් කෙනකුට වැඩි ගණනක් ඇති විටක, සියලු ම නාමිකයන් හෝ ගෙවීම සඳහා රක්ෂණ

ඔප්පුව කල්පිරීමට පෙර, මිය යන අවස්ථාවක, රක්ෂණ ඔප්පුව මගින් සුරක්ෂිත කරන ලද මුදල, අවස්ථාවෝචිත පරිදි, රක්ෂණ ඔප්පුව දරන්නාට හෝ ඔහුගේ උරුමක්කාරයන්ට හෝ නීත්‍යානුකූල නියෝජිතයන්ට හෝ ගෙවනු ලැබිය යුතු ය.

(6) ජීවිතය රක්ෂණය කරන ලද තැනැත්තාගෙන් පසුව, නාමිකයා හෝ නාමිකයන් එක් කෙනකුට වැඩි ගණනක් ඇත්නම්, ඒ නාමිකයන් අතුරෙන් එක් නාමිකයකු හෝ ඊට වැඩි ගණනක් හෝ ජීවත්ව සිටින අවස්ථාවක, රක්ෂණ ඔප්පුව මගින් සුරක්ෂිත කරන ලද මුදල එසේ ජීවත්ව සිටින තැනැත්තාට හෝ තැනැත්තන්ට ගෙවනු ලැබිය යුතු ය.

ලාභාංශ හා ප්‍රසාද මුදල් විෂයයෙහි සීමා කිරීම.

**44.** රක්ෂණකරුගේ වත්කම් හා බැරකම් පිළිබඳ ජීව ගණක තක්සේරුවක ප්‍රතිඵලයක් වශයෙන් 48 වන වගන්තියෙහි සඳහන් උද්ධෘතයේ කොටසක් වශයෙන් මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලැබූ තක්සේරු ශේෂ පත්‍රයෙහි පෙන්නුම් කර ඇති අතිරික්තයක් හැර, දීර්ඝ කාලීන රක්ෂණ අරමුදලෙහි හෝ එවැනි වෙනත් පන්තියක හෝ රක්ෂණ ව්‍යාපාර අරමුදල්වල හෝ යම් කොටසක් දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාර කර ගෙන යන කිසිම රක්ෂණකරුවකු විසින්, එහි කොටස්කරුවන්ට ලාභාංශ කිසිවක් ප්‍රකාශ කිරීමේ හෝ ගෙවීමේ හෝ රක්ෂණ ඔප්පු දරන්නන්ට යම් ප්‍රසාද මුදලක් ගෙවීමේ හෝ ණයකර, ණය හෝ ණයට ගනු ලැබූ අත්තිකාරම් කිසිවක් භාර දීමේ දී යම් ගෙවීමක් කිරීමේ කාර්යය සඳහා කෙළින් ම හෝ අන්‍යාකාරයකින් යොදවනු නොලැබිය යුතු ය. තව ද ඉහත තක්සේරු කරන ලද දිනයෙහි හෝ එදිනට පෙර දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරයට අදාළ ආදායම් ගිණුමේ මාර්ගයෙන් දායක මුදල් අය වශයෙන් ගෙන එනු ලැබ ඇත්නම් මිස, සහ මේ පනතේ 49 වන වගන්තිය යටතේ මණ්ඩලය වෙත වාර වාර්තා ඉදිරිපත් කළ තක්සේරුවෙන් අනාවරණය වූ හුදෙක් සමාන අතිරික්තවලින් කරන ලද පැවරුම් වලින් සංචිත අරමුදල සෑදී ඇති විටක හැර, ඒ අතිරික්තය, යම් සංචිත අරමුදලකින් හෝ අන්‍යාකාරයකින් ලබාගත් දායක මුදල්වලින් වැඩි කරනු නොලැබිය යුතු ය.

අතුරු ප්‍රසාද මුදල් ප්‍රකාශ කිරීම.

**45.** මේ පනතෙහි පටහැනිව කුමක් සඳහන්ව ඇත ද, ඉකුත් අවසන් තක්සේරු කිරීමේ දී කරන ලද ජීව ගණක නිර්දේශය මත, අතුරු තක්සේරු කිරීමේ කාලය තුළ මිය යාම හෝ අන්‍යාකාර හේතුවක් නිසා ගෙවීම සඳහා කල් පිරෙන රක්ෂණ අයත් ඔප්පු දීර්ඝ කාලීන ව්‍යාපාර රක්ෂණ ඔප්පු දරන්නන්ට අතුරු ප්‍රසාද මුදලක් හෝ ප්‍රසාද මුදල් හෝ ප්‍රකාශ කිරීමෙහි ලා නිදහස රක්ෂණකරුවකුට තිබිය යුතු ය.

දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාර කර ගෙන යන රක්ෂණකරුවකු විසින් ජීව ගණකයකු පත් කළ යුතු බව.

**46.** දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාර කර ගෙන යන සෑම රක්ෂණකරුවකු විසින් ම, ජීව ගණකයකු ස්ථිර පදනමක් මත සේවයෙහි නියුක්ත කළ යුතු ය ; නැතහොත් සේවයට බඳවා ගනු ලැබිය යුතු ය.

## V වන කොටස

## ගිණුම් පරීක්ෂා කිරීම හා විමර්ශනය කිරීම

රක්ෂණකරුවකුගේ ගිණුම් විගණනය කිරීම.

**47.** (1) මණ්ඩලය විසින් තත් කාර්ය සඳහා සාදනු ලබන රීති මගින් නිශ්චය කරනු ලබන යම් ආකෘතියක හා යම් ආකාරයකින්, රක්ෂණකරුවකු විසින් එහි ගිණුම් පිළියෙළ කොට පවත්වා ගෙන යනු ලැබිය යුතු ය.

(2) සෑම රක්ෂණකරුවකු විසින් ම, ස්වකීය වාර්ෂික ගිණුම්, මණ්ඩලය විසින් නිකුත් කරනු ලබන අනුමත විගණකවරුන්ගේ ලැයිස්තුවකින් හා ඒ අතුරෙන් තෝරා ගනු ලැබූ විගණකවරයකු ලවා විගණනය කර ගත යුතු අතර, ඒ විගණනය කරන ලද ගිණුම්වල පිටපතක්, මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන මුදල් වර්ෂය අවසන් වීමෙන් පසුව වූ යම් කාලයක් ඇතුළත මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. රක්ෂණකරුගේ මුදල් තත්ත්වය පිළිබඳව හා නිවැරදි අදහසක් පැහැදිලි ලෙස දැක්වෙන පරිදි මණ්ඩලය විසින් තත් කාර්ය සඳහා සාදන ලද රීති මගින් නියම කර ඇති ආකාරයට රක්ෂණකරුගේ ගිණුම් වාර්තා පවත්වා ගෙන ගොස් තිබේ ද යන වග විගණකවරයා විසින් ස්වකීය වාර්තාවෙන් ප්‍රකාශ කරනු ලැබිය යුතු ය.

(3) විගණකවරයාගේ වාර්තාව ලැබුණු විට, මණ්ඩලය විසින් –

(අ) විගණනය කරන ලද ගිණුම්වල ආකෘතිය හා එහි අන්තර්ගතය පිළිබඳ තොරතුරු ; සහ

(ආ) විගණනයට අදාළ අවශ්‍ය යයි මණ්ඩලය සලකන වෙනත් යම් අතිරේක තොරතුරු

ඉදිරිපත් කරන ලෙස, විගණකවරයාගෙන් ඉල්ලා සිටිනු ලැබිය හැකි ය.

ජීව ගණක වාර්තාව සහ උද්ධෘතය.

48. (1) සෑම රක්ෂණකරුවකු විසින් ම, ඒ රක්ෂණකරු විසින් සිදු කරන ලද සියලු දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාර සම්බන්ධයෙන්, ඒ ව්‍යාපාරයේ රක්ෂණකරුගේ වත්කම් හා බැරකම් තක්සේරු කිරීමක් ද ඇතුළුව, ඒ දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරයේ මුදල් තත්ත්වය සම්බන්ධයෙන් එක් එක් මුදල් වර්ෂය අවසානයේ දී ජීව ගණකයකු ලවා විමර්ශනයක් කිරීමට සලස්වනු ලැබිය යුතු අතර, තත් කාර්යය සඳහා මණ්ඩලය විසින් සාදන ලද රීතිවලට අනුකූලව උද්ධෘතයක් පිළියෙල කිරීමට ද මණ්ඩලය විසින් සලස්වනු ලැබිය යුතු ය. රක්ෂණකරුගේ රක්ෂණ ඔප්පු දරන්නන්ගේ වර්තන හා අනිශ්චිත වූ සියලු බැරකම් ඉටු කිරීමට රක්ෂණකරුගේ සංචිත ප්‍රමාණවත් වන්නේ ද යන වග ජීව ගණක විසින් සහතික කොට, අතිරික්තය ද නිශ්චය කරනු ලැබිය යුතු අතර, රක්ෂණ ඔප්පු දරන්නන්ට ගෙවනු ලැබිය හැකි ප්‍රසාද දීමනාවේ ප්‍රමාණය ද නිර්දේශ කළ යුතු ය. රක්ෂණකරුගේ කොටස් හිමියන්ට පැවරීම සඳහා ඇති අතිරික්තය ද ජීව ගණක විසින් නිර්දේශ කරනු ලැබිය යුතු ය.

(2) උද්ධෘතයක් සෑදීම සම්බන්ධයෙන් (1) වන උපවගන්තියේ විධිවිධාන, අතිරික්තය බෙදා දීමේ අදහස ඇතිව රක්ෂණකරුගේ මුදල් තත්ත්වය පිළිබඳව විමර්ශනයක් හෝ ප්‍රතිඵල ප්‍රසිද්ධියට පත් කරනු ලබන විමර්ශනයක් කරනු ලැබූ වෙනත් කවර හෝ අවස්ථාවක, අදාළ විය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ සාදන ලද උද්ධෘතයක පිටපතක් මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, ජීව ගණක තක්සේරුවට අදාළ අතිරේක තොරතුරු සහ ලේඛන කිසිවක් ඉල්ලා සිටීමට මණ්ඩලයට බලය තිබිය යුතු ය.

(4) (1) වන උපවගන්තියෙන් හෝ (2) වන උපවගන්තියෙන් නියම කර ඇති සෑම උද්ධෘතයකට ම සෑබෑ වූ හෝ අනිශ්චිත වූ හෝ බැරකමක් ඇති සෑම රක්ෂණ ඔප්පුවක් පිළිබඳ සම්පූර්ණ හා නිවැරදි විස්තර ජීව ගණක වෙත විමර්ශනය කිරීමේ කාර්යය සඳහා සපයා ඇති බවට අධ්‍යක්ෂවරයා විසින් හෝ රක්ෂණකරුගේ ප්‍රධාන නිලධරයා විසින් හෝ අත්සන් කරන ලද සහතිකයක් අමුණනු ලැබිය යුතු ය.

(5) (1) වන උපවගන්තියෙන් හෝ (2) වන උපවගන්තියෙන් නියම කර ඇති සෑම උද්ධෘතයකට ම, ඒ උද්ධෘතයේ කාර්යය සඳහා, රක්ෂණකරුගේ ගිණුම් පිළියෙල කරනු ලැබ ඇත්තා වූ දිනයෙහි පවත්නා දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාර පිළිබඳ ප්‍රකාශයක් අමුණනු ලැබිය යුතු ය.

(6) ගිණුම් වර්ෂයේ අවසන් දිනය නොවන දිනයට රක්ෂණකරුවකුගේ මුදල් තත්ත්වය සම්බන්ධයෙන් විමර්ශනයක් කරනු ලැබූ අවස්ථාවක, ඉකුත් ගිණුම් වර්ෂය අවසන් වීමෙන් පසු ගත වූ කාලය සඳහා වූ ගිණුම් සහ විමර්ශනය කරන ලද දිනයේ පැවති පරිදි ශේෂ පත්‍රය, මේ පනතේ විධිවිධාන සලසා ඇති ආකාරයට පිළියෙළ කොට, විගණනය කරනු ලැබිය යුතු ය.

වාර්තා සැපයීම.

**49.** සෑම රක්ෂණකරුවකු විසින් ම –

(අ) සමාගමේ කොටස්හිමියන් හෝ රක්ෂණකරුගේ රක්ෂණ ඔප්පු දරන්නන් වෙත ඉදිරිපත් කරන ලද රක්ෂණකරුගේ ව්‍යාපාරයට අදාළ වාර්තාවේ සහතික පිටපතක්, එය එසේ ඉදිරිපත් කරනු ලැබූ වහාම ; සහ

(ආ) තත් කාර්යය සඳහා සාදන ලද රීති මගින් නිශ්චය කරනු ලබන යම් තොරතුරු ඇතුළත් ත්‍රෛමාසික වාර වාර්තාවක් මණ්ඩලය වෙත සපයනු ලැබිය යුතු ය.

ප්‍රතිරක්ෂණ සන්ධානවල පිටපත් සැපයීම.

**50.** (1) යම් රක්ෂණකරුවකු විසින් ශ්‍රී ලංකාව තුළ දී සිදු කරන ලද රක්ෂණ ව්‍යාපාරයේ යම් පන්තියකට අදාළ (ප්‍රතිශෝධිත සන්ධාන ද ඇතුළුව) ස්වකීය ප්‍රතිරක්ෂණ සන්ධානවල, ගිවිසුම්වල හා සැකසුම්වල සහතික පිටපත්, සෑම රක්ෂණකරුවකු විසින් ම කලින් කල මණ්ඩලය වෙත සපයනු ලැබිය යුතු ය :

එසේ වුව ද, නියමිත දිනයෙහි දී බලපවත්නා යම් ප්‍රතිරක්ෂණ සන්ධානවල, ගිවිසුම්වල හා සැකසුම්වල සහතික පිටපත්, නියමිත දිනයෙන් පසු මාස තුනක් ඉකුත් වීමට පෙර, සපයනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ මණ්ඩලය වෙත සපයන ලද යම් ප්‍රතිරක්ෂණ සන්ධානයක්, ගිවිසුමක් හෝ සැකසුමක් රක්ෂණකරුගේ හෝ රක්ෂිතයාගේ යහපත සඳහා හෝ රක්ෂණ කර්මාන්තයේ සංවර්ධනය සඳහා නැතහොත් ජාතික යහපත සඳහා කවර හෝ ආකාරයකින් හානිකර වේ ද යන වග නිශ්චය කිරීමේ කාර්යය සඳහා ඒ සියලු ප්‍රතිරක්ෂණ සන්ධාන, ගිවිසුම් හා සැකසුම් සමාලෝචනය කිරීමේ බලය මණ්ඩලයට තිබිය යුතු ය.

රක්ෂණකරුවන්ගේ හා මහජනතාවගේ යහපත ප්‍රමාණවත් ලෙස ආරක්ෂා නොවන බව මණ්ඩලයේ අදහස වන අවස්ථාවක, රක්ෂණ කර්මාන්තයේ සංවර්ධනය උදෙසා අවශ්‍ය යයි මණ්ඩලය සලකන සංශෝධන කිසිවක් නිර්දේශ කිරීමේ බලය, මණ්ඩලයට ඇත්තේ ය.

(3) සංශෝධන කිරීම සඳහා නිර්දේශ කිසිවක් කරනු ලැබූ අවස්ථාවක, අවස්ථාවෝචිත පරිදි ඒ සන්ධානය, ගිවිසුම හෝ සැකැස්ම අලුත් කිරීම සඳහා ඉදිරිපත් කරනු ලැබූ විටක, ඒ සන්ධානයට, ගිවිසුමට හෝ සැකසුමට අවශ්‍ය සංශෝධන කිරීම, රක්ෂණකරුගේ කාර්යය වන්නේ ය.

51. (1) මේ පනතේ විධිවිධාන යටතේ මණ්ඩලය වෙත සපයන ලද යම් වාර වාර්තාවක් කවර ආකාරයකින් හෝ වැරදි සහිත බව හෝ දෝෂ සහිත බව මණ්ඩලයට පෙනී යන්නේ නම්, මණ්ඩලය විසින් -

වාර වාර්තා සම්බන්ධයෙන් මණ්ඩලය සතු බලතල.

(අ) ඒ වාර වාර්තාව නිවැරදි කිරීම හෝ පරිපූරණය කිරීම සඳහා අවශ්‍ය යයි මණ්ඩලය විසින් සලකනු ලබන යම් වැඩිදුර තොරතුරු ඒ විගණකවරයා හෝ ජීව ගණක විසින් සහතික කොට සැපයිය යුතු යයි මණ්ඩලය විධාන කරන්නේ නම්, ඒ වැඩිදුර තොරතුරු එසේ සහතික කොට සපයන ලෙස රක්ෂණකරුට නියම කරනු ලැබිය හැකි ය ;

(ආ) රක්ෂණකරුගේ ලියාපදිංචි කාර්යාලයේ දී හෝ ප්‍රධාන ව්‍යාපාර ස්ථානයේ දී මණ්ඩලය විසින් පරීක්ෂා කරනු ලැබීම පිණිස යම් ගිණුම් පොතක්, රෙජිස්ටරයක් හෝ වෙනත් යම් ලේඛනයක් ඉදිරිපත් කරන ලෙස හෝ තත් කාර්යය සඳහා රක්ෂණකරු වෙත භාර දෙනු ලබන දැන්වීමක නිශ්චිතව සඳහන් කරනු ලබන යම් ප්‍රකාශයක් සපයන ලෙස හෝ රක්ෂණකරුගෙන් ඉල්ලා සිටිනු ලැබිය හැකි ය ;

(ඇ) ඒ වාර වාර්තාවට අදාළව, රක්ෂණකරුගේ යම් නිලධරයකු දිවුරුම් පිට හෝ ප්‍රතිඥාව පිට විභාග කරනු ලැබිය හැකි ය ; නැතහොත්

(ඈ) මණ්ඩලය විසින් නියම කරනු ලබන යම් වැඩිදුර තොරතුරු සපයන ලෙස ඉල්ලා සිටි අභියාචනය රක්ෂණකරු වෙත භාර දෙන ලද දිනයේ සිට එක් මාසයක් ඉකුත් වීමට පෙර හෝ මණ්ඩලය විසින් ඒ

අභියාචනයෙහි නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි යම් වැඩිදුර කාලයක් ඉකුත් වීමට පෙර, ඒ වැඩිදුර තොරතුරු සපයනු ලබන්නේ නම් මිස, ඒ වාර වාර්තාව භාර ගැනීම, ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකි ය.

(2) රක්ෂණකරුවකු විසින් නිකුත් කරනු ලබන ඉල්ලීමක් මත සහ මණ්ඩලයෙන් කරුණු විභාග කිරීමෙන් පසුව, දිසා අධිකරණයක් විසින්, අවස්ථාගත කරුණු අනුව මණ්ඩලය විසින් ගන්නා ලද ක්‍රියා මාර්ගය යුක්ති සහගත නොවන බව රක්ෂණකරු විසින් අධිකරණය සෑහීමට පත් කරනු ලබන්නේ නම්, මණ්ඩලය විසින් භාර ගැනීම ප්‍රතික්ෂේප කරන ලද යම් වාර වාර්තාවක් භාර ගන්නා ලද ලෙස මණ්ඩලයට විධාන කරනු ලැබිය හැකි ය:

එසේ වුව ද, මේ උපවගන්තිය යටතේ කරන ලද ඉල්ලීමක්, ඒ ඉල්ලීම මණ්ඩලය විසින් නියම කරන ලද දිනයෙන් හෝ වාර වාර්තාව භාර ගැනීම ප්‍රතික්ෂේප කරන ලද දිනයෙන් පසුව මාස දෙකක් ඉකුත් වීමට පෙර කරනු ලබන්නේ නම් මිස, දිසා අධිකරණය විසින් භාර ගනු නොලැබිය යුතු ය.

(3) මේ වගන්තිය යටතේ වූ යම් ඉල්ලීමක දී දිසා අධිකරණයේ තීරණය අවසානාත්මක විය යුතු අතර, ඒ තීරණය යම් අභියාචනයකට යටත් නොවිය යුතු ය.

(4) මේ වගන්තිය යටතේ, දිසා අධිකරණය වෙත කරනු ලබන ඉල්ලීමක්, ලඝු කාර්ය පටිපාටිය අනුව පෙත්සමක් මගින් කරනු ලැබිය යුතු අතර, ඒ කාර්ය පටිපාටියට අදාළ සිවිල් නඩු විධාන සංග්‍රහයේ විධිවිධාන එයට හා ඒ සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

*නැවත තක්සේරු කිරීමක් නියම කිරීමට මණ්ඩලය සතු බලය.*

**52.** (1) 48 වන වගන්තිය යටතේ කරන ලද විමර්ශනයකින් හෝ තක්සේරු කිරීමකින්, තක්සේරු කිරීමෙහි ලා වැරදි සහිත පදනමක් යයි මණ්ඩලයට පෙනී යන පදනමක් අනුගමනය කිරීමේ හේතුව නිසා, රක්ෂණකරුගේ කටයුතුවල තත්ත්වය නියමාකාරයෙන් පිළිබිඹු නොවන බව මණ්ඩලයට පෙනී යන්නේ නම්, මණ්ඩලය විසින් රක්ෂණකරු වෙත සාධාරණ දැනුම් දීමක් කිරීමෙන්, හා කරුණු දැක්වීමට අවස්ථාවක් ලබා දීමෙන් පසුව, තත් කාර්යය සඳහා රක්ෂණකරු විසින් පත් කරනු ලැබ, මණ්ඩලය විසින් අනුමත කරනු ලැබූ ජීව ගණකයකු මගින් මණ්ඩලය විසින් නිශ්චිතව සඳහන් කරනු ලබන යම් දිනයක තක්සේරුකරුගේ

වියදමින් විමර්ශනයක් හා තක්සේරු කිරීමක් කිරීමට සලස්වනු ලැබිය යුතු අතර, ඒ විමර්ශනය හා තක්සේරුව කිරීමේ කාර්යය සඳහා ඒ ජීව ගණකට අවශ්‍ය කරුණු, මණ්ඩලය විසින් නිශ්චිතව සඳහන් කරනු ලබන මාස තුනකට නොඅඩු යම් කාලයක් ඇතුළත රක්ෂණකරු විසින් ඒ ජීව ගණකට සුදුස්සක් කිරීම සඳහා ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(2) සාරාංශ පිළියෙල කිරීමට අදාළ 48 වන වගන්තියේ (1) වන සහ (4) වන උපවගන්තිවල අදාළ විධිවිධාන, මේ වගන්තිය යටතේ කරනු ලැබිය යුතු යම් විමර්ශනයක් හා තක්සේරුවක් සම්බන්ධයෙන් අදාළ විය යුතු ය :

එසේ වුව ද, ඒ විමර්ශනය කිරීමේ හා තක්සේරු කිරීමේ ප්‍රතිඵලය වශයෙන් පිළියෙල කරන ලද සාරාංශය, මණ්ඩලය විසින් නිශ්චිතව සඳහන් කරනු ලබන යම් දිනයක හෝ එදිනට පෙර ඉදිරිපත් කළ යුතු ය.

තැන්පතු වැඩි කිරීමට මණ්ඩලය සතු බලය.

**53.** යම් රක්ෂණකරුවකු විසින් සපයන ලද වාර වාර්තා, ප්‍රතිරක්ෂණ සන්ධාන, ගිවිසුම් සහ සැකසුම් පරීක්ෂා කරනු ලැබූ විටක, 21 වන වගන්තිය යටතේ රක්ෂණකරු විසින් තබන ලද තැන්පතුව හෝ රක්ෂණකරුගේ රක්ෂණ ව්‍යාපාරය සම්බන්ධයෙන් වූ වත්කම් ප්‍රමාණය, රක්ෂණකරු විසින් කරනු ලබන රක්ෂණ ව්‍යාපාරයේ ප්‍රමාණයට අදාළව බෙහෙවින් ම අඩු බව මණ්ඩලයට පෙනී යන අවස්ථාවක, මණ්ඩලය විසින්, රක්ෂණකරුට කරුණු දැක්වීමට අවස්ථාවක් ලබා දීමෙන් පසුව, 21 වන වගන්තියේ (2), (3), (4) හා (5) වන උපවගන්තිවල විධිවිධාන යටතේ අතිරේක තැන්පතුවක් කරන ලෙස රක්ෂණකරුට නියම කරනු ලැබිය හැකි අතර, 22 වන වගන්තියේ හා 23 වන වගන්තියේ විධිවිධාන ඒ අතිරේක තැන්පතුව සම්බන්ධයෙන් අදාළ විය යුතු ය :

එසේ වුවද, යම් රක්ෂණකරුවකුගේ ශ්‍රී ලංකාව තුළ ඇති වත්කම්, ඒ රක්ෂණකරු විසින් ශ්‍රී ලංකාව තුළ සිදු කරන ලද රක්ෂණ ව්‍යාපාරය සම්බන්ධයෙන් ගෙවීම හිඟ තබා ඇති හිමිකම් පෑම් සහ අවසන් නොවූ අවදානම් පියවීම සඳහා ප්‍රමාණවත් බව මණ්ඩලය සෑහීමට පත්වන පරිදි රක්ෂණකරු විසින් තහවුරු කරනු ලබන අවස්ථාවක, 21 වන වගන්තිය යටතේ කරන ලද යම් තැන්පතුවක් ද සමඟ වූ ඒ අතිරේක තැන්පතුවේ ප්‍රමාණය, 26 වන වගන්තිය යටතේ මණ්ඩලය විසින් නිශ්චය කරන ලද ණය ගෙවීමේ හැකියාවේ සීමාව නොඉක්මවිය යුතු ය.

පරීක්ෂණයක් කරන ලෙස නියමයක් කිරීමට ඇති බලය.

**54.** (1) (අ) රක්ෂණකරුවකුගේ රක්ෂණ ඔප්පු දරන්නන්ගේ සම්බන්ධතා අනතුරේ පවත්නා බවට ; හෝ

(ආ) යම් රක්ෂණකරුවකුට ස්වකීය බැදීම් ඉටු කිරීමට නොහැකිව ඇති බවට හෝ මේ පනතේ විධිවිධාන අතුරෙන් කවර හෝ විධිවිධානයක් අනුව ක්‍රියා කිරීම යම් රක්ෂණකරුවකු විසින් පැහැර හැර ඇති බවට

විශ්වාස කිරීමට මණ්ඩලයට හේතු ඇති අවස්ථාවක, මණ්ඩලය, විසින්, රක්ෂණකරුට සාධාරණ දැනුම් දීමක් කිරීමෙන් හා කරුණු දැක්වීමට අවස්ථාවක් ලබා දීමෙන් පසුව, මණ්ඩලය වෙනුවෙන් විගණකවරයකු හෝ ජීව ගණකයකු ලවා නැතහොත්, එකවර පත් කරනු ලබන විගණකවරයකු හා ජීව ගණකයකු යන දෙදෙනා ම ලවා හෝ පළමුව විගණකවරයකු පමණක් හෝ ජීව ගණකයකු පමණක් ලවා සහ පසුව ජීව ගණකයකු හෝ විගණකවරයකු ලවා රක්ෂණකරුගේ කටයුතු පිළිබඳව විමර්ශනයක් කරනු ලැබිය හැකි ය ; නැතහොත් මණ්ඩලය විසින් ම ඒ විමර්ශනය කරන ලෙස නියම කරනු ලැබිය හැකි ය :

එසේ වුව ද, මණ්ඩලය විසින් තත් කාර්යය සඳහා පත් කරන ලද විගණකවරයකු හෝ ජීව ගණකයකු, රක්ෂණකරුගේ සේවයෙහි නියුක්ත විගණකවරයකු හෝ ජීව ගණකයකු හෝ නොවිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ යම් විමර්ශනයක ගාස්තුව හා වියදම් රක්ෂණකරු විසින් ගෙවනු ලැබිය යුතු ය.

(3) මේ වගන්තිය යටතේ වූ යම් විමර්ශනයක් කර ගෙන යාමෙහි ලා මණ්ඩලය විසින් දැන්වීමක් මගින් –

(අ) රක්ෂණකරුට හෝ රක්ෂණකරු වෙනුවෙන් ගිණුම් පොත්වල, වාර්තාවල හෝ වෙනත් ලේඛනවල භාරකාරත්වය දරන යම් තැනැත්තකුට ;

(ආ) රක්ෂණකරුගේ අධ්‍යක්ෂවරයකු, ජීව ගණකවරයකු, විගණකවරයකු, නිලධරයකු හෝ සේවකයකු හෝ අනුයෝජිතයකු වන්නා වූ හෝ යම් අවස්ථාවක දී එලෙස ධුර දරා ඇති නැතහොත් ක්‍රියා කර ඇති යම් තැනැත්තකුට ; හෝ

(ඇ) රක්ෂණකරුගේ කලින් සිටි හෝ දැනට සිටින සාමාජිකයකුට හෝ රක්ෂණ ඔප්පු දරන්නකුට

රක්ෂණකරු විසින් ඒ රක්ෂණ ව්‍යාපාරයේ කාර්යය සඳහා දරනු ලබන වත්කම් සම්බන්ධයෙන් රක්ෂණකරුට ඇති අයිතියට සාක්ෂි වන ලේඛන ද ඇතුළුව රක්ෂණකරුගේ පොත්, ගිණුම්, වාර්තා හෝ වෙනත් ලේඛන කිසිවක් මණ්ඩලයේ පරීක්ෂණය සඳහා ඉදිරිපත් කරන ලෙස හා ඒවා සම්පූර්ණයෙන් ම හෝ ඒවායේ යම් කොටසක් පිටපත් කර ගැනීමට අවසර දෙන ලෙස නියම කරනු ලැබිය හැකි ය :

එසේ වුව ද, මේ උපවගන්තිය යටතේ කරන ලද නියමයක්, රක්ෂණකරු විසින් කර ගෙන යනු ලබන යම් ව්‍යාපාරයක කාර්යය සඳහා දරනු ලබන වත්කම්වලට රක්ෂණකරුට ඇති හිමිකමට සාක්ෂි වශයෙන් වූ රක්ෂණකරුගේ ඒ ව්‍යාපාරයට අදාළ ලේඛනවලට පමණක් ව්‍යාප්ත විය යුතු ය.

(4) මේ වගන්තිය යටතේ විමර්ශනය කිරීමේ දී, (3) වන උපවගන්තියෙහි නිශ්චිතව සඳහන් යම් පුද්ගලයකුට මණ්ඩලය ඉදිරියට පැමිණ, රක්ෂණකරුගේ ව්‍යාපාරය සම්බන්ධයෙන් දිවුරුමක් මත විභාග කරනු ලැබීමට යටත් වන ලෙස මණ්ඩලය විසින් නියම කරනු ලැබිය හැකි අතර, මේ වගන්තියේ කාර්යය සඳහා මණ්ඩලය විසින් දිවුරවීම් කරනු ලැබිය හැකි ය.

(5) (3) වන හෝ (4) වන උපවගන්තිය යටතේ ස්වකීය භාරයේ ඇති යම් ලේඛනයක් ඉදිරිපත් කරන ලෙස හෝ මණ්ඩලය ඉදිරියට පැමිණෙන ලෙස හෝ මණ්ඩලය විසින් හෝ මණ්ඩලය විසින් පත්කරන ලද යම් තැනැත්තකු විසින් හෝ විභාග කරනු ලැබීමට යටත් වන ලෙස හෝ ඒ විභාගයේ දී තමාගෙන් අසනු ලබන යම් ප්‍රශ්නයකට පිළිතුරු දෙන ලෙස නියම කරනු ලැබූ විට, එසේ කිරීම ප්‍රතික්ෂේප කරන හෝ පැහැර හරින යම් තැනැත්තකු, වරදකට වරදකරු විය යුතු අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, රුපියල් පණස් දහසකට නොඅඩු දඩයකට ඒ තැනැත්තා යටත් විය යුතු ය.

(6) මේ වගන්තිය යටතේ කරනු ලබන යම් විමර්ශනයක ප්‍රතිඵල, අවස්ථාවෝචිත පරිදි, පත් කරන ලද විගණකවරයා හෝ ජීව ගණක හෝ විසින් ලිඛිතව වාර්තා කර ගනු ලැබිය යුතු අතර, ඒ වාර්තාවේ පිටපත් මණ්ඩලය හා රක්ෂණකරු වෙත සපයනු ලැබිය යුතු ය.

විමර්ශනය කරන තැනැත්තා සතු බලතල.

**55.** 54 වන වගන්තිය යටතේ රක්ෂණකරුවකු සම්බන්ධයෙන් යම් විමර්ශනයක් කරනු ලබන විටක, 1982 අංක 17 දරන සමාගම් පනතේ 162 වන වගන්තියේ විධිවිධාන, ඒ පනතේ ඒ වගන්තියට අනුව කරනු ලබන විමර්ශනයකට අදාළ කරනු ලබන පරිදි ඒ විමර්ශනයේ කාර්යය සඳහා ද අදාළ විය යුතු අතර, ඒ විමර්ශන සම්බන්ධයෙන් හා ඊට ආනුෂංගික වූ සියලු වියදම් රක්ෂණකරු විසින් දැරිය යුතු ය ; තව ද, රක්ෂණකරු විසින් ඒ වියදම් දැරීමේ දී, රක්ෂණකරුගෙන් අය වීමට ඇති වෙනත් ණය අභිබවා ඒ වියදම්වලට ප්‍රමුඛතාව ලැබිය යුතු ය.

වැඩිදුර වාර්තා සහ උද්ධෘත.

**56.** තත් කාර්යය සඳහා මණ්ඩලය විසින් සාදනු ලැබූ රීති මගින් නිශ්චය කරනු ලබන පරිදි වැඩිදුර වාර්තා හෝ උද්ධෘත හෝ සංශෝධිත නැතහොත් ආදේශිත වාර්තා හෝ උද්ධෘත, සෑම රක්ෂණකරුවකු විසින් ම මණ්ඩලය වෙත සපයනු ලැබිය යුතු ය.

විධාන නිකුත් කිරීමට මණ්ඩලය සතු බලය.

**57.** (1) යම් රක්ෂණකරුවකුගේ කටයුතු මහජන යහපතට හෝ රක්ෂණ ඔප්පු දරන්නන්ගේ යහපතට හානි කර වන පරිදි හෝ රක්ෂණකරුගේ යහපතට අගතිකර වන පරිදි පවත්වා ගෙන යනු ලබන බවට මණ්ඩලය සෑහීමට පත් වන අවස්ථාවක, අවශ්‍ය යයි මණ්ඩලය විසින් සලකනු ලබන විධාන මණ්ඩලය විසින් ඒ රක්ෂණකරු වෙත නිකුත් කරනු ලැබිය හැකි අතර, විශේෂයෙන් ම,-

(අ) මනා රක්ෂණ මූලධර්මවලට අනුකූලව ස්වකීය රක්ෂණ ව්‍යාපාරය කර ගෙන යාමට රක්ෂණකරුට හැකි වනු පිණිස අවශ්‍ය වන යම් ක්‍රියා මාර්ග ගන්නා ලෙස හෝ කළමනාකරණ කාර්ය මණ්ඩල බඳවා ගන්නා ලෙස ;

(ආ) රක්ෂණකරුගේ අධ්‍යක්ෂවරයන් කිසිවකු හෝ රක්ෂණකරුගේ අධ්‍යක්ෂ මණ්ඩලය සමග කටයුතු කිරීම නුසුදුසු යයි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සලකනු ලබන යම් තැනැත්තකු හෝ ඉවත් කරන ලෙස ;

(ඇ) රක්ෂණකරුගේ වත්කම් කිසිවක් නියාදනය කිරීම හෝ ආපසු ලබා ගැනීම සම්බන්ධයෙන් කටයුතු කරන ලෙස ;

(ඈ) නීති විරෝධී ලෙස හෝ අනිසි ලෙස ගෙවන ලදැයි මණ්ඩලයට පෙනී යන මුදල් රක්ෂණකරු විසින් ආපසු අය කර ගනු ලැබීමට පියවර ගන්නා ලෙස ; සහ

(ඉ) ප්‍රතිරක්ෂණය සම්බන්ධයෙන් අවශ්‍ය යයි මණ්ඩලය විසින් සලකනු ලබන යම් වැඩපිළිවෙලවල් යොදන ලෙස

රක්ෂණකරුට නියම කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ මණ්ඩලය විසින් නිකුත් කරන ලද විධාන කිසිවක්, මණ්ඩලය වෙත කරුණු ඉදිරිපත් කළ විටක හෝ මණ්ඩලය විසින් සිය මෙහෙයිමෙන් ම හෝ පුළු වශයෙන් වෙනස් කිරීම හෝ අවලංගු කිරීම කරනු ලැබිය හැකි අතර, එසේ කිරීමේ දී සුදුසු යයි මණ්ඩලය කල්පනා කරන කොන්දේසි පනවනු ලැබිය හැකි ය.

(3) (1) වන උපවගන්තිය යටතේ නිකුත් කරනු ලැබූ යම් විධානයක් අනුව ක්‍රියා කිරීම පැහැර හරින යම් රක්ෂණකරුවකු මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් පණස් දහසකට නොඅඩු දඩයකට ඒ තැනැත්තා යටත් විය යුතු ය.

(4) (3) වන උපවගන්තිය යටතේ වරදකරු කරනු ලැබීමෙන් පසු යම් රක්ෂණකරුවකු වෙත නිකුත් කර තිබුණු විධානයක් අනුව ක්‍රියා කිරීම ඒ රක්ෂණකරු විසින් දිගට ම පැහැර හරිනු ලබන අවස්ථාවක, ඒ රක්ෂණකරු වෙත ප්‍රදානය කරන ලද ලියාපදිංචි කිරීම, මණ්ඩලය විසින් නිශ්චිතව සඳහන් කරනු ලබන යම් කාලයක් සඳහා අත්හිටුවීමට මණ්ඩලයට බලය ඇති අතර, එසේ අත්හිටුවනු ලැබූ කාලය තුළ දී 18 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධාන ඒ රක්ෂණකරු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

## VI වන කොටස

### ප්‍රචාරය

**58.** (1) මේ පනත යටතේ මණ්ඩලය වෙත සපයන ලද සෑම වාර වාර්තාවක් ම හෝ එහි සහතික පිටපතක් ම මණ්ඩලයේ කාර්යාලයෙහි තබා ගත යුතු අතර, මණ්ඩලයේ මතය අනුව රහස්‍ය තොරතුරු වශයෙන් සලකනු ලබන තොරතුරු හැර ඒ සෑම වාර වාර්තාවක් ම, මණ්ඩලයේ අනුමතිය ඇතිව සහ මණ්ඩලය විසින් නියම කරනු ලබන කාලවේලා තුළ දී, යම් තැනැත්තකු විසින් පරීක්ෂා කරනු ලැබීම පිණිස විවෘතව තැබිය යුතු ය. යට කී අන්දමේ රහස්‍ය තොරතුරු කිසිම තැනැත්තකුගේ පරීක්ෂාව පිණිස විවෘතව තබනු නොලැබිය යුතු ය.

ලේඛනවල භාරකාරත්වය සහ ලේඛන පරීක්ෂා කිරීම.

(2) තත් කාර්යය සඳහා මණ්ඩලය විසින් සාදනු ලැබූ රීතිවලින් නිශ්චය කර ඇති යම් ගාස්තුවක් ගෙවා යම් තැනැත්තකු විසින් (රහස්‍ය තොරතුරු නොවන) යම් වාර වාර්තාවක පිටපතක් හෝ වාර වාර්තාවක කොටසක පිටපතක් ලබා ගනු ලැබිය හැකි ය.

ලේඛන මගින් ඉදිරිපත් කරන සාක්ෂි.

**59.** මණ්ඩලය වෙත සපයා ඇති වාර වාර්තාවක පිටපතක් බවට මණ්ඩලය විසින් සහතික කරන ලද්දකැයි උද්දේශිත සෑම ලේඛනයක් ම ඒ වාර වාර්තාවේ පිටපතක් ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ පිටපත සහ මුල් වාර්තාව අතර වෙනසක් ඇති බව ඔප්පු කරනු ලැබුවහොත් මිස, ඒ පිටපත එහි මුල් පිටපත වූවාක් මෙන් සාක්ෂි වශයෙන් පිළිගනු ලැබිය යුතු ය.

වාර්තාවල සාරාංශය ප්‍රසිද්ධ කරනු ලැබිය යුතු බව.

**60.** මේ පනත යටතේ මණ්ඩලය වෙත රක්ෂණකරුවන් හා තැරැව්කරුවන් විසින් සපයා ඇති හෝ සපයා ඇතැයි උද්දේශිත ගිණුම්වල, ශේෂපත්‍රවල, ප්‍රකාශවල, උද්ධෘතවල සහ වෙනත් වාර්තාවල සාරාංශයක්, අමාත්‍යවරයා විසින් විධාන කරනු ලබන යම් ආකාරයකට මණ්ඩලය විසින් එක් එක් වර්ෂයේ දී ප්‍රසිද්ධ කරනු ලැබිය යුතු අතර, ඒ මත මණ්ඩලය විසින් කර ඇති යම් සටහනක් වේ නම් ඒ සටහන සහ ඊට සම්බන්ධ ලිපි හුවමාරුව ද ඒ සාරාංශයට අමුණනු ලැබිය හැකි ය :

එසේ වුව ද යම් නිශ්චිත රක්ෂකයකු කෙරෙහි බලපාන යම් කාරණයක් සම්බන්ධයෙන් එවැනි යම් සටහනක සඳහනක් කිරීම, ඒ සටහනෙහි ඒ සඳහන ඇතුළත් කිරීමට විරුද්ධව කරුණු දැක්වීමට ඒ රක්ෂණකරුට අවස්ථාවක් ලබා දී ඇත්නම් මිස, නොකළ යුතු ය.

නියමිත ආකෘති පත්‍රයෙහි වාර්තා සැපයිය යුතු බව.

**61.** රක්ෂණකරුවකු විසින් සපයනු ලබන සෑම වාර වාර්තාවක් ම නියමිත ආකෘති පත්‍රයෙහි විය යුතු අතර, එම ආකෘතියෙන් ම එය ප්‍රසිද්ධ කරනු ලැබිය යුතු ය :

එසේ වුව ද, මේ වගන්තියෙහි ඇතුළත් කිසිවකින් ඒ වාර වාර්තාවලින් ලබාගත් සත්‍ය වූ ද, නිවැරදි වූ ද, උද්ධෘතයක් ප්‍රචාරය කිරීමේ කාර්යය සඳහා ප්‍රසිද්ධ කිරීමෙන් රක්ෂණකරුවකු වළක්වනු නොලැබිය යුතු ය.

## VII වන කොටස

## පරිපාලනය කිරීම මගින් කළමනාකරණය කිරීම සහ ගණන් බේරා වසා දැමීම

පරිපාලකයකු පත් කළ හැක්කේ කවර විට ද යන වග.

**62.** (1) දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරය හෝ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය හෝ දීර්ඝකාලීන රක්ෂණ ව්‍යාපාරය සහ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය, කර ගෙන යන රක්ෂණකරුවකු, රක්ෂණ ඔප්පු දරන්නන්ගේ යහපතට හානිකර වන ආකාරයකින් ක්‍රියා කර ඇති බවට හෝ රක්ෂණ ඔප්පු දරන්නන්ගේ යහපතට හානිකර වීමට ඉඩ ඇති ආකාරයකින් ක්‍රියා කරන බවට කවර හෝ ප්‍රභවයකින් මණ්ඩලයට ලැබී ඇති තොරතුරු අනුව විශ්වාස කිරීමට කවර හෝ විටක මණ්ඩලයට හේතු ඇත්නම්, මණ්ඩලය විසින් සුදුසු යයි මණ්ඩලය කල්පනා කරන පරිදි කරුණු ඉදිරිපත් කිරීමට අවස්ථාවක් රක්ෂණකරුට ලබා දීමෙන් පසුව, ඒ පිළිබඳව වාර්තාවක් මණ්ඩලය විසින් අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(2) වාර්තාව සලකා බැලීමෙන් පසු, මණ්ඩලයේ විධානයට හා පාලනයට යටත්ව ඒ රක්ෂණකරුගේ ව්‍යාපාරය කළමනාකරණය කිරීම සඳහා පරිපාලකයකු පත් කිරීම අවශ්‍ය යයි හා සුදුසු යයි අමාත්‍යවරයාගේ මතය වන්නේ නම්, අමාත්‍යවරයා විසින් එවැනි පරිපාලකයකු පත් කරනු ලැබිය හැකි ය.

(3) (2) වන උපවගන්තිය යටතේ පත් කරනු ලැබූ පරිපාලකයකුට, අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන යම් පාරිශ්‍රමිකයක් ගෙවනු ලැබිය යුතු අතර, ඒ පාරිශ්‍රමිකය, ඒ පරිපාලක විසින් කළමනාකරණය කරනු ලබන ව්‍යාපාරයේ අරමුදල්වලින් ගෙවනු ලැබිය යුතු ය.

(4) (2) වන උපවගන්තිය යටතේ පරිපාලකයකු පත් කරන ලද දිනයේ දී හා එදිනට පසුව රක්ෂණකරුවකුගේ ව්‍යාපාරය කළමනාකරණය කිරීම ඒ පරිපාලක වෙත පැවරෙන අතර, එසේ පරිපාලනය කරනු ලබන කාල පරිච්ඡේදය තුළ දී ඒ ව්‍යාපාරයට සම්බන්ධ බලතල කිසිවක් ක්‍රියාත්මක කිරීම රක්ෂණකරු විසින් නතර කරනු ලැබිය යුතු ය :

එසේ වුව ද, මණ්ඩලයේ අනුමතය ඇතිව හැර, අලුත් රක්ෂණ ඔප්පු කිසිවක් පරිපාලක විසින් නිකුත් කරනු නොලැබිය යුතු ය.

(5) පරිපාලකයකු වශයෙන් යම් තැනැත්තකුගේ පත් කිරීම අමාත්‍යවරයා විසින් කවර හෝ අවස්ථාවක දී ප්‍රත්‍යාදිෂ්ට කර පරිපාලක වශයෙන් වෙනත් තැනැත්තකු පත් කරනු ලැබිය හැකි ය. එවිට රක්ෂණකරුගේ ව්‍යාපාර කටයුතු කළමනාකරණය කිරීම පළමු කී තැනැත්තාට අහිමි වන්නේ ය.

(6) පරිපාලකගේ බලතල හා කාර්ය සම්බන්ධයෙන්, අවස්ථාගත කරුණු අනුව යෝග්‍ය යයි මණ්ඩලය විසින් සලකනු ලබන යම් විධාන, මණ්ඩලය විසින් පරිපාලක වෙත නිකුත් කරනු ලැබිය හැකි අතර, රක්ෂණකරුගේ ව්‍යාපාරය කළමනාකරණය කිරීම සම්බන්ධයෙන් හෝ ඒ කළමනාකරණයේ දී උද්ගත වන යම් කාරණයකට අදාළව හෝ අවශ්‍ය උපදෙස් ඒ පරිපාලක විසින් කවර හෝ අවස්ථාවක දී මණ්ඩලයෙන් විමසනු ලැබිය හැකි ය.

පරිපාලක සතු බලතල හා කාර්ය.

63. (1) කාර්යක්ෂමතාව හා ගැලපෙන පරිදි අතිශයින්ම සකසුරුවම්කමින් රක්ෂණකරුගේ ව්‍යාපාරය කළමනාකරණය කිරීම පරිපාලක විසින් කර ගෙන යනු ලැබිය යුතු අතර, ජීවිත රක්ෂණ ඔප්පු දරන්නන්ගේ පොදු යහපතට අවස්ථානුකූල පරිදි ඉතාමත් හිතකර වන්නේ පහත දැක්වෙන ක්‍රියාමාර්ග, එනම්-

(අ) අමාත්‍යවරයාගේ අනුමතය ඇතිව මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන යම් ආයතනයකට රක්ෂණකරුගේ ව්‍යාපාරය මාරු කිරීම ;

(ආ) රක්ෂණකරුගේ ව්‍යාපාරය ගණන් බේරා වසා දැමීම ; හෝ

(ඇ) යෝග්‍ය යයි සලකනු ලබන වෙනත් යම් ක්‍රියා මාර්ගයක්,

යන ක්‍රියා මාර්ග අතුරෙන් කවර ක්‍රියා මාර්ගය ද යන වග සඳහන් කරමින් වාර්තාවක්, හැකිතාක් ඉක්මණින් මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(2) එකී වාර්තාව මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලැබූ විට, රක්ෂණ ඔප්පු දරන්නන්ගේ පොදු යහපත ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීම සඳහා සුදුසු යයි මණ්ඩලය කල්පනා කරන යම් ක්‍රියා මාර්ගයක් මණ්ඩලය විසින් ගනු ලැබිය හැකි ය.

(3) (2) වන උපවගන්තිය යටතේ මණ්ඩලය වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මණ්ඩලය විසින් කරනු ලැබූ යම් ක්‍රියාවක්, රක්ෂණකරුගේ සාංගමික සංස්ථාපත්‍රයේ හෝ ව්‍යවස්ථාවලියේ කුමක් සඳහන්ව ඇත ද ඒ නොතකා, බලාත්මක විය යුතු ය.

කොන්ත්‍රාත්තු හා ගිවිසුම් අවලංගු කිරීම.

**64.** රක්ෂණ ඔප්පු දරන්නන්ගේ යහපතට හානිකරව තිබුණු බවට හෝ හානිකර වන බවට පරිපාලක සෑහීමට පත්වන රක්ෂණකරු හා වෙනත් යම් තැනැත්තකු අතර ඇති රක්ෂණ ඔප්පුවක් නොවන යම් කොන්ත්‍රාත්තුවක් හෝ ගිවිසුමක්, පරිපාලක විසින් රක්ෂණකරුගේ කටයුතු කළමනාකරණය කර ගෙන යාම පවත්නා කාලය තුළ කවර හෝ අවස්ථාවක (කොන්දේසි රහිතව හෝ පැනවීම සුදුසු යයි පරිපාලක කල්පනා කරන යම් කොන්දේසිවලට යටත්ව හෝ) පරිපාලක විසින් අවලංගු කරනු ලැබිය හැකි ය. නැතහොත් වෙනස් කරනු ලැබිය හැකි ය. එවැනි යම් කොන්ත්‍රාත්තුවක් හෝ ගිවිසුමක් අවලංගු කිරීමට හෝ වෙනස් කිරීමට පෙර, ඒ අවලංගු කිරීම හෝ වෙනස් කිරීම බලපාන සියලු තැනැත්තන්ට ඒ සම්බන්ධයෙන් කරුණු දක්වා සිටීමට අවස්ථාවක් පරිපාලක විසින් ලබා දිය යුතු ය.

පරිපාලකගේ පත් වීම අවසන් කිරීම.

**65.** පරිපාලකයකු පත් කිරීමට තුඩු දුන් කාර්යය සම්පූර්ණ වී ඇති බව හෝ ඒ පත් කිරීම දිගට ම පවත්වා ගෙන යාම යම් හේතුවක් නිසා අයෝග්‍ය බව, තත් කාර්යය සඳහා මණ්ඩලය විසින් ඉදිරිපත් කරන ලද වාර්තාවක් මත අමාත්‍යවරයාට පෙනී යන කවර හෝ අවස්ථාවක අමාත්‍යවරයා විසින්, ඒ පත් කිරීම ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබිය හැකි ය ; එසේ ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබූ විට රක්ෂණකරුගේ ව්‍යාපාරය කළමනාකරණය කිරීම පරිපාලකාගෙන් ඉවත් කරනු ලැබිය යුතු ය ; එවිට , අමාත්‍යවරයා විසින් අන් ආකාරයකින් විධාන කරනු ලබන්නේ නම් මිස ඒ ව්‍යාපාරය කළමනාකරණය කිරීම, පරිපාලක පත් කරන ලද දිනයට පෙරාතුව ම වූ දිනයෙහි දී පැවරී තිබූ තැනැත්තා වෙත ම නැවත පැවරෙන්නේ ය.

පරිපාලකයකු පත් කිරීමේ තීරණය අවසානාත්මක බව.

**66.** 62 වන වගන්තිය හෝ 65 වන වගන්තිය ප්‍රකාර අමාත්‍යවරයා විසින් ගනු ලබන යම් තීරණයක් අවසානාත්මක වන්නේ ය.

ලේඛන හෝ දේපළ, පරිපාලකවරුන් වෙත භාර නොදී තබා ගැනීම සම්බන්ධයෙන් දණ්ඩනය.

**67.** කළමනාකරණය යම් පරිපාලකයකු වෙත පැවරී ඇති, යම් රක්ෂණකරුවකුගේ ව්‍යාපාරයට අදාළ වන්නා වූ ද ඒ රක්ෂණකරුගේ යම් අධ්‍යක්ෂවරයකු භාරයේ ඇත්තා වූ ද යම් ගිණුම් පොතක්, රෙජිස්ටරයක් හෝ වෙනත් යම් ලේඛනයක් ඒ පරිපාලක වෙත භාර දීම ඒ අධ්‍යක්ෂවරයා විසින් පැහැර හරිනු ලබන්නේ නම්, හෝ ඒ රක්ෂණකරුගේ දේපළ කිසිවක් තමා වෙත රඳවාගනු ලබන්නේ නම් ඒ අධ්‍යක්ෂවරයා වරදකට වරදකරු විය යුතු අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලැබූ ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට එක් අවුරුද්දක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක වූ බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් පණස් දහසක් නොඉක්මවන දඩයකට හෝ ඒ බන්ධනාගාරගත කිරීම හා දඩය යන දඬුවම් දෙකට ම හෝ ඔහු යටත් විය යුතු ය.

ස්වේච්ඡාවෙන් ගණින් බේරා වසා දැමීම.

**68.** වෙනත් යම් ලිඛිත නීතියක කුමක් සඳහන්ව ඇත ද, මණ්ඩලයේ පූර්ව අනුමතය ඇතිව හැර රක්ෂණකරුවකුගේ ව්‍යාපාරය ස්වේච්ඡාවෙන් ගණින් බේරා වසා දමනු නොලැබිය යුතු ය.

දිසා අධිකරණය විසින් රක්ෂණකරුවකු ගණින් බේරා වසා දැමීමට ආඥා කළ හැකි වන්නේ කවර අවස්ථාගත කරුණු යටතේ ද යන වග.

**69.** (1) දිසා අධිකරණය විසින් 1982 අංක 17 දරන සමාගම් පනතට අනුකූලව රක්ෂණකරුවකු ගණින් බේරා වසා දැමීමට ආඥා කරනු ලැබිය හැකි අතර, ඒ අනුව ඒ පනතේ විධිවිධාන, මේ පනතේ මේ කොටසේ විධිවිධානවලට යටත්ව අදාළ විය යුතු ය.

(2) දිසා අධිකරණයක් විසින් යම් රක්ෂණකරුවකු වෙත පහත සඳහන් අවස්ථාවල දී, එනම්-

(අ) ඒ රක්ෂණකරු විසින් නිකුත් කරන ලද්දා වූ ද අවුරුදු තුනකට නොඅඩු කාලයක් බලාත්මකව පැවතියා වූ ද, කල් පිරෙන විට රුපියල් පන් ලක්ෂයකට නොඅඩු මුළු වටිනාකමකින් යුක්ත වන්නා වූ ද, දීර්ඝ කාලීන රක්ෂණ ඔප්පු සියයට එකකට නොඅඩු ප්‍රමාණයක් දරන්නන් විසින් ගණින් බේරා වසා දැමීම සඳහා පෙත්සමක් ඉදිරිපත් කරනු ලබන්නේ නම් ; හෝ

(ආ) ගණින් බේරා වසා දැමීම සඳහා ඉල්ලුම් කිරීමට මෙයින් බලය දී ඇති මණ්ඩලය විසින් පහත දැක්වෙන හේතු, එනම්-

(i) රක්ෂණකරු විසින් 21 වන වගන්තියේ හෝ 26 වන වගන්තියේ විධිවිධාන අනුව නැතහොත් 57 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද විධාන කිසිවක් අනුව ක්‍රියා කිරීම පැහැර හැර තිබීම ;

(ii) රක්ෂණකරු විසින් මේ පනත යටතේ කරන ලද යම් නියමයක් අනුව ක්‍රියා කිරීම පැහැර හැර නැතහොත් මේ පනතේ විධිවිධාන කිසිවක් කඩ කර, මණ්ඩලය විසින් ඒ පැහැර හැරීම හෝ කඩ කිරීම පිළිබඳව රක්ෂණකරු වෙත දැනුම් දෙනු ලැබීමෙන් පසුව, මාස තුනක කාලයක් ඒ පැහැර හැරීම හෝ කඩ කිරීම දිගට ම කරගෙන ගොස් තිබීම ;

(iii) මේ පනතේ විධිවිධාන යටතේ සපයන ලද වාර්තාවලින් හෝ මේ පනත යටතේ පවත්වන ලද යම් විමර්ශනයක ප්‍රතිඵලවලින් රක්ෂණකරු වස්තුභංගත්වයට පත්ව ඇති බව පෙනී යාම ; හෝ

(iv) රක්ෂණකරු දිගට ම කටයුතු කරගෙන යාම රක්ෂණ ඔප්පු දරන්නන්ගේ යහපතට හානිකර වීම,

යන හේතු අතුරෙන් යම් හේතුවක් මත, දිසා අධිකරණය වෙත ගණන් බේරා වසා දැමීම සඳහා ඉල්ලුම් කරන්නේ නම්

ගණන් බේරා වසා දමන ලෙස ආඥා කරනු ලැබිය හැකි ය.

(3) (2) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ වූ පෙත්සමක් නිස්සාර ලෙස හෝ පීඩාකාරී ලෙස ඉදිරිපත් කර ඇති බව පෙනී යන අවස්ථාවක, පෙත්සමේ සහ ඒ මත වූ නඩු කටයුතුවල ප්‍රතිඵලයක් වශයෙන් රක්ෂණකරු විසින් ඇත්ත වශයෙන්ම හා යුක්තිසහගත ලෙස දරන ලද නඩු ගාස්තු හා වියදම් පෙත්සම්කරුවන් විසින් ගෙවන ලෙසට දිසා අධිකරණය විසින් ආඥාවක් කරනු ලැබිය හැකි ය.

වත්කම් හා බැරකම් තක්සේරු කිරීම.

**70.** (1) රක්ෂණකරුවකු ගණන් බේරා වසා දැමීමේ දී රක්ෂණකරුගේ වත්කම්වල හා බැරකම්වල වටිනාකම, ක්‍රියාත්මක කළ හැකි තාක් දුරට තත් කාර්යය සඳහා මණ්ඩලය විසින් සාදන ලද රීතිවලට අනුකූලව සහ දිසා අධිකරණය විසින් දෙනු ලැබිය හැකි යම් විධානවලට යටත්ව සුදුසු යයි ඈවරකරු කල්පනා කරන යම් ආකාරයකින් සහ පදනමක් මත නිසැකව දැනගනු ලැබිය යුතු ය.

(2) දියා අධිකරණය විසින්, රක්ෂණකරුවකුගේ කොන්ත්‍රාත්තුවල ප්‍රමාණයෙහි යම් අඩු කිරීමක් කිරීමේ කාර්යය සඳහා රක්ෂණකරුගේ වත්කම්වල හා බැරකම්වල සහ රක්ෂණකරු විසින් නිකුත් කරන ලද රක්ෂණ ඔප්පු සම්බන්ධයෙන් වූ සියලු හිමිකම් පෑම්වල වටිනාකම, තත් කාර්යය සඳහා මණ්ඩලය විසින් සාදන ලද රීති කිසිවක් සැලකිල්ලට ගෙන, අධිකරණය විසින් සුදුසු යයි කල්පනා කරන යම් ආකාරයකින් හා පදනමක් මත නිසැකව දැන ගනු ලැබිය යුතු ය.

ඈවර කරනු ලැබීමේ දී වත්කම් අරමුදලේ අතිරික්තය යොදා ගැනීම.

**71.** (1) රක්ෂණකරුවකු ගණන් බේරා වසා දැමීමේ දී දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාර සම්බන්ධයෙන් වූ රක්ෂණකරුගේ වත්කම්වල හා බැරකම්වල වටිනාකම මණ්ඩලය විසින් පත් කරන ලද ස්වාධීන ජීව ගණකයකු මගින් රක්ෂණකරුගේ වෙනත් යම් වත්කම්වල හා බැරකම්වල වටිනාකමින් වෙන් කර නිසැකව දැන ගනු ලැබිය යුතු අතර, පළමුවෙන් සඳහන් කළ වත්කම් දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාර සම්බන්ධයෙන් වූ බැරකම් ඉක්මවන තාක් ප්‍රමාණයට, දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාර සම්බන්ධයෙන් වූ බැරකම් හැර, බැරකම් කිසිවක් නිදහස් කිරීම සඳහා පළමුව සඳහන් කළ බැරකම් යොදා ගනු නොලැබිය යුතු ය.

(2) දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාර කර ගෙන යන යම් රක්ෂණකරුවකු ගණන් බේරා වසා දැමීමේ දී, රක්ෂණකරුගේ වත්කම් හා බැරකම් නිසැකව දැන ගනු ලැබූ විට, බැරකම් ඉක්මවන (මෙහි මින් මතු 'බැලූ බැල්මට පෙනෙන අතිරික්තයක්' යනුවෙන් සඳහන් කරනු ලබන) අතිරික්තයක් ඇති බව ද, අතිරික්තයේ යම් කොටසක් ගණන් බේරා වසා දැමීම ආරම්භ කිරීමට ඉහතින් වූ අවුරුදු දහය ඇතුළත යම් අවස්ථාවක, දීර්ඝ කාලීන රක්ෂණ ඔප්පු දරන්නන්ට වෙන් කර දී ඇති බව ද පෙනී යන අවස්ථාවක, පහත දැක්වෙන විධිවිධාන බලපැවැත්විය යුතු ය :-

(අ) ඉහත සඳහන් අවුරුදු දහයක කාලය තුළ ලාභ සහිත රක්ෂණ ඔප්පු දරන්නන්ට එසේ වෙන් කර දෙන ලද අතිරික්තයේ මුළු මුදල, බැලූ බැල්මට පෙනෙන අතිරික්තයට යම් අනුපාතයක් දරන්නේ ද ඊට සමානුපාතිකව ඒ දස අවුරුදු කාලය තුළ දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරයෙන් උද්ගත වන මුළු අතිරික්තය දරන අනුපාතයට සමාන මුදලක් රක්ෂණකරුගේ දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරය සම්බන්ධයෙන් ඔහුගේ බැරකම්වලට එකතු කරනු ලැබිය යුතු ය ; තව ද

(ආ) ඒ එකතු කිරීම කරනු ලැබීමෙන් පසු වත්කම් අතිරික්තව තිබෙන තාක් දුරට පමණක් රක්ෂණකරුගේ වත්කම්, එකී බැරකම් ඉක්මවන සේ සලකනු ලැබිය යුතු ය :

එසේ වුව ද -

(i) එවැනි යම් වෙන්කර දීමක් කර නොමැති අවස්ථාවක හෝ දීර්ඝ කාලීන ව්‍යාපාරය සම්බන්ධයෙන් රක්ෂණකරුගේ බැරකම්වලට එකතු කරනු ලැබිය යුතු මුදල ඉහත කී පරිදි එවැනි අනුපාතයකට සමාන මුදලක් විය යුතු වීම විශේෂ අවස්ථානුගත කරුණු හේතුකොට ගෙන සාධාරණීය නොවන්නේ යයි දිසා අධිකරණයට පෙනී යන්නේ නම්, එසේ එකතු කරනු ලැබිය යුතු මුදල දිසා අධිකරණය විසින් විධාන කරනු ලබන යම් මුදලක් විය යුතු ය ; තව ද

(ii) අදාළ දීර්ඝ කාලීන ව්‍යාපාරයේ වර්ගයක පමණක් එවැනි අතිරික්තයේ අනුපාතයක් ගණන් බේරා වසා දැමීම ආරම්භ කිරීමට පළමුව දීර්ඝ කාලීන රක්ෂණ ඔප්පු දරන්නන්ට වෙන් කර දී ඇති අවස්ථාවක, මේ උපවගන්තිය අදාළ කිරීමේ කාර්යය සඳහා ඒ වර්ගය සම්බන්ධයෙන් වූ රක්ෂණකරුගේ වත්කම් හා බැරකම්වල වටිනාකම, දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරය සම්බන්ධයෙන් ඒ රක්ෂණකරුගේ වත්කම්වල හා බැරකම්වල වටිනාකම, නිසැකව දැනගනු ලැබූ ආකාරයෙන් ම වෙනම නිසැකව දැනගනු ලැබිය යුතු අතර, බැරකම් ඉක්මවා වත්කම්වල එසේ සොයා ගනු ලැබූ යම් අතිරික්තයක්, දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාර සම්බන්ධයෙන් රක්ෂණකරුගේ බැරකම්වලට එකතු කළ යුතු මුදල නිසැකව දැන ගැනීමේ කාර්යය සඳහා බැලූ බැල්මට පෙනෙන අතිරික්තය වශයෙන් සලකනු ලැබිය යුතු ය.

**72.** 73 වන වගන්තිය අදාළ වන අවස්ථාවක් නොවන වෙනත් අවස්ථාවක රක්ෂණකරුවකු ගණන් බේරා වසා දැමීමේ දී, 21 වන වගන්තිය හෝ 53 වන වගන්තිය යටතේ රක්ෂණකරු විසින් තබන ලද තැන්පතුව ආපසු ගෙවීමේ ආඥාවක් සඳහා

ඇවරකරුවකුගේ ඉල්ලීම මත තැන්පතුව ආපසු ගෙවීම.

ඇවරකරු විසින් දිසා අධිකරණය වෙත ඉල්ලීමක් කරනු ලැබිය යුතු අතර, අධිකරණය විසින් එවැනි ඉල්ලීමක් මත විධාන කරනු ලබන යම් නියම හා කොන්දේසිවලට යටත්ව තැන්පතුව ආපසු ගෙවන ලෙස ආඥා කරනු ලැබිය යුතු ය.

අර්ථ වශයෙන් ගණන් බේරා වසා දැමීමේ ක්‍රමය.

**73.** (1) රක්ෂණකරුවකුගේ ව්‍යාපාරය සංයුක්ත වන යම් රක්ෂණ ව්‍යාපාර පන්තියක් සම්බන්ධයෙන් රක්ෂණකරුවකුගේ කටයුතු ගණන් බේරා වසා දැමිය යුතු නමුත්, ව්‍යාපාරය සංයුක්ත කරන වෙනත් යම් රක්ෂණ ව්‍යාපාර පන්තියක් රක්ෂණකරු විසින් අඛණ්ඩව කර ගෙන යා යුතු බව හෝ ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නිවේදනයක් මගින් අමාත්‍යවරයා විසින් ප්‍රකාශ කරනු ලබන යම් ආයතනයකට පැවරීම යෝග්‍ය යයි යම් අවස්ථාවක පෙනී යන්නේ නම්, මේ පනතේ විධිවිධානවලට අනුකූලව ඒ කාර්යය සඳහා යෝජනා ක්‍රමයක් සකස් කර එය දිසා අධිකරණය වෙත අනුමතය සඳහා ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(2) මේ වගන්තිය යටතේ සකස් කරන ලද යම් යෝජනා ක්‍රමයකින් (යෝජිත ගණන් බේරා වසා දැමීමේ දී උද්ගත විය හැකි අතිරික්ත වත්කම් කිසිවක් වෙන් කර දීම ද ඇතුළුව) සිදු කරන ලද රක්ෂණ ව්‍යාපාර යම් පන්ති අතර රක්ෂණකරුගේ වත්කම් හා බැරකම් වෙන් කර දීම හා බෙදා හැරීම සඳහා ද, ස්වකීය රක්ෂණ ඔප්පු සම්බන්ධයෙන් සෑම පන්තියක ම රක්ෂණ ඔප්පු දරන්නන්ගේ අනාගත අයිතිවාසිකම් සඳහා ද, ගණන් බේරා වසා දැමීමට යෝජිත රක්ෂණකරුගේ කටයුතු කිසිවක් ගණන් බේරා වසා දැමීමේ ආකාරය සඳහා ද, විධිවිධාන සලස්වනු ලැබිය හැකි ය. තව ද රක්ෂණකරුගේ අරමුණු සම්බන්ධයෙන් රක්ෂණකරුගේ සාංගමික සංස්ථා පත්‍රය වෙනස් කිරීම සඳහා වූ ඇතැම් විධිවිධාන සහ යෝජනා ක්‍රමය බලාත්මක කිරීම සඳහා යෝග්‍ය විය හැකි වැඩිදුර විධිවිධාන, ඒ යෝජනා ක්‍රමයෙහි ඇතුළත් විය හැකි ය.

(3) ඇවර කිරීමේ දී රක්ෂණකරුවන්ගේ බැරකම් තක්සේරු කිරීමට සහ ඇවර කිරීමේ දී දීර්ඝ කාලීන රක්ෂණ අරමුදලේ තිබෙන අතිරික්ත වත්කම් යෙදවීමට අදාළ මේ පනතේ විධිවිධාන, ඒ විධිවිධාන රක්ෂණකරුවකු ගණන් බේරා වසා දැමීමේ දී අදාළ වන ආකාරයෙන් ම, මේ වගන්තිය යටතේ යෝජනා ක්‍රමයට අනුකූලව රක්ෂණකරුවකුගේ කටයුතුවල යම් කොටසක් ගණන් බේරා වසා දැමීමේ දී අදාළ විය යුතු අතර, සමාගමක්

සම්බන්ධයෙන් මේ වගන්තිය යටතේ වූ යම් යෝජනා ක්‍රමයක් සමාගම් ගණන් බේරා වසා දැමීම සම්බන්ධයෙන් 1982 අංක 17 දරන සමාගම් පනතේ විධිවිධාන අතුරෙන් කවර හෝ විධානයකට අවශ්‍ය සුළු වශයෙන් වූ වෙනස් කිරීම් සහිතව අදාළ විය හැකි ය.

(4) යම් සමාගමක සංස්ථා පත්‍රය එහි අරමුණු සම්බන්ධයෙන් වෙනස් කරන මේ වගන්තිය යටතේ වූ යෝජනා ක්‍රමයක් ස්ථිර කරන්නා වූ දිසා අධිකරණයේ ආඥාවක්, එම වෙනස් කිරීම සම්බන්ධයෙන්, එය 1982 අංක 17 දරන සමාගම් පනතේ 7 වන වගන්තිය යටතේ ස්ථිර කරන ලද ආඥාවක් පරිද්දෙන් බලපැවැත්විය යුතු අතර, ඒ වගන්තියේ විධිවිධාන ඒ අනුව අදාළ විය යුතු ය.

(5) මේ වගන්තිය යටතේ යෝජනා ක්‍රමයක් ස්ථිර කරමින් ආඥාවක් කිරීමේ දී රක්ෂණකරු විසින් දිගටම කරගෙන යනු ලබන, රක්ෂණ ව්‍යාපාර යම් පන්ති වේ නම් ඒ රක්ෂණ පන්තිවලට අදාළ නොවන්නා වූ 21 වන වගන්තිය හෝ 53 වන වගන්තිය යටතේ රක්ෂණකරු විසින් කරන ලද තැන්පතුවේ යම් ප්‍රමාණයක් නියාදනය කිරීම සඳහා අවශ්‍ය යයි දිසා අධිකරණය සලකන යම් ආඥා, දිසා අධිකරණය විසින් කරනු ලැබිය හැකි ය.

රක්ෂණ ඔප්පුවල වටිනාකම් දැක්වීම.

**74.** වත්කම්වල මුදල් බෙදා හැරීමේ කාර්යය සඳහා රක්ෂණකරුවකු ගණන් බේරා වසා දැමීමේ දී රක්ෂණකරුගේ පොත්වලින් පෙනී යන පරිදි රක්ෂණකරු විසින් ප්‍රදානය කර ඇති රක්ෂණ ඔප්පුවලට හිමිකම් ලබන හෝ රක්ෂණ ඔප්පු විෂයයෙහි සම්බන්ධතාවක් දරන එක් එක් තැනැත්තාට ඇති බැරකමේ වටිනාකම ඇවරකරු විසින් නිසැකව දැන ගනු ලැබිය යුතු අතර, දිසා අධිකරණය විසින් විධාන කරනු ලබන යම් ආකාරයකට ඒ වටිනාකම පිළිබඳව ඒ එක් එක් තැනැත්තාට දැනුම් දීමක් කළ යුතු ය ; තව ද එසේ දැන්වීමක් දෙනු ලැබූ යම් තැනැත්තකු, දිසා අධිකරණය විසින් නිශ්චිතව සඳහන් කරනු ලබන යම් ආකාරයකින් සහ එසේ නිශ්චය කරනු ලබන යම් කාලයක් ඇතුළත, ඒ වටිනාකම සම්බන්ධයෙන් ආරාවුල් කිරීමට ඇති තම අදහස පිළිබඳව දැනුම් දෙනු ලබන්නේ නම් මිස, ඒ තැනැත්තා නිසැකව දැන් ගනු ලැබූ වටිනාකමින් බැඳී සිටිය යුතු ය.

රක්ෂණ හිමිපුළුම් අඩු කිරීමට දිසා අධිකරණය සතු බලය.

**75.** (1) රක්ෂණකරුවකු ඇවර කරනු ලැබීමට යටත්ව ඇති අවස්ථාවක, සාධාරණ යයි දිසා අධිකරණය කල්පනා කරන යම් නියම මත හා යම් කොන්දේසිවලට යටත්ව, රක්ෂණකරුගේ රක්ෂණ හිමිපුම් සම්බන්ධයෙන් ගෙවිය යුතු මුදල් අඩු කරමින්, දිසා අධිකරණය විසින් ආඥාවක් කරනු ලැබිය හැකි ය.

(2) දීර්ඝ කාලීන ව්‍යාපාර කර ගෙන යන රක්ෂණකරුවකු වස්තු භංගත්වයට පත් වී ඇති බව ඔප්පු කරනු ලැබ ඇති අවස්ථාවක, සුදුසු යයි දිසා අධිකරණය කල්පනා කරන්නේ නම් ගණන් බේරා වසා දැමීමේ ආඥාවක් කිරීම වෙනුවට රක්ෂණකරුගේ රක්ෂණ ගිවිසුම් සම්බන්ධයෙන් ගෙවිය යුතු මුදල්, සාධාරණ යයි දිසා අධිකරණය කල්පනා කරන යම් නියම මත හා යම් කොන්දේසිවලට යටත්ව, දිසා අධිකරණය විසින් අඩු කරනු ලැබිය හැකි ය.

(3) මේ වගන්තිය යටතේ ආඥාවක් සඳහා වූ ඉල්ලීමක් ඇවරකරු විසින් හෝ රක්ෂණකරු විසින් හෝ වෙනුවෙන් හෝ රක්ෂණ ඔප්පුවක් දරන්නකු විසින් නැතහොත් මණ්ඩලය විසින් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය ; තව ද මණ්ඩලය සහ බලපෑමට ලක්වීමට ඉඩ ඇතැයි දිසා අධිකරණය කල්පනා කරන යම් තැනැත්තකු එවැනි යම් ඉල්ලුම් පත්‍රයක් මත කරුණු දක්වා සිටීමට හිමිකම් ලැබිය යුතු ය.

*දීර්ඝ කාලීන රක්ෂණ ඔප්පු නිකුත් කර ඇත්තා වූ ද, දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරය ගණන් බේරා වසා දමා ඇත්තා වූ ද, නැතහොත් ගණන් බේරා වසා දැමීමට පියවර ගනු ලබන්නා වූ ද, තැනැත්තන්ගේ වෙනත් වත්කම් කෙරෙහි, ඇතැම් අවස්ථාගත කරුණු යටතේ පිහිට පැතීමට ඇතැම් දීර්ඝ කාලීන කොටස් රක්ෂණ දරන්නන්ට ඇති අයිතිවාසිකම්.*

**76.** දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරය කර ගෙන යන රක්ෂණකරුවකු විසින් ඒ ව්‍යාපාරය ගණන් බේරා වසා දැමීමේ දී හෝ ගණන් බේරා වසා දැමීමෙන් පසු හෝ ගණන් බේරා වසා දැමීමට පියවර ගනු ලබන්නා වූ අවස්ථාවක සහ ඒ රක්ෂණකරු විසින් නිකුත් කරන ලද දීර්ඝ කාලීන රක්ෂණ ඔප්පු යටතේ පවත්නා බැරකම් පියවීමට ඒ ව්‍යාපාරයට අදාළ වත්කම් ප්‍රමාණවත් වී නොමැති හෝ ප්‍රමාණවත් නොවන අවස්ථාවක, ඒ දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරය ගණන් බේරා වසා දැමීම රක්ෂණකරුගේ ඒ එක් එක් අධ්‍යක්ෂකවරයාගේ චේතනාන්විත නොසැලකිල්ල, වංචාව හෝ වංක භාවය නිසා සිදු වූ බව ඔප්පු වී ඇති විටක, ඒ දිනයේ දී හෝ ඒ දිනයෙන් පසුව එවැනි රක්ෂණ ඔප්පුවක් දරන සෑම තැනැත්තකු ම නිසි අධිකරණ බලය ඇති අධිකරණයක පවරනු ලබන නඩුවක් මගින් රක්ෂණකරුගේ එක් එක් අධ්‍යක්ෂවරයාගේ පුද්ගලික වත්කම්වලට එරෙහිව කටයුතු කර, ඒ රක්ෂණ ඔප්පුව යටතේ ගෙවීම හිඟ තබා ඇති යම් මුදලක් අය කර ගැනීමට හිමිකම් ලැබිය යුතු ය.

*රක්ෂණ ඔප්පු දරන්නන්ට පූර්ව හිමිකම් පෑමක් තිබිය යුතු බව.*

**77.** 1982 අංක 17 දරන සමාගම් පනතේ හෝ යම් ලිඛිත නීතියක හෝ විධිවිධානවල පටහැනිව කුමක් සඳහන්ව ඇත ද ඒ නොතකා, දිසා අධිකරණයක් විසින් 69 වන වගන්තිය යටතේ රක්ෂණකරුවකු ගණන් බේරා වසා දැමීමට ආඥා කරන අවස්ථාවක, ඒ රක්ෂණකරුගේ වත්කම් බෙදා හැරීමේ දී රක්ෂණකරුගේ රක්ෂණ ඔප්පු දරන්නන්ට පූර්ව හිමිකම් පෑමක් තිබිය යුතු ය.

## VIII වන කොටස

### තැරැව්කරුවන් සහ රක්ෂණ නියෝජිතයන් ලියාපදිංචි කිරීම

රක්ෂණ නියෝජිතයන් පත් කිරීම.

**78.** (1) රක්ෂණකරුවකුට හෝ තැරැව්කරුවකුට රක්ෂණ නියෝජිතයකු වශයෙන් යම් පුද්ගලයකු පත් කිරීමට අවසර ඇති අතර, ඒ පුද්ගලයා රක්ෂණ නියෝජිතයකු වශයෙන් ඒ රක්ෂණකරු හෝ තැරැව්කරු සමග ලියාපදිංචි වී සිටිය යුතු ය. රක්ෂණ නියෝජිතයන් වශයෙන් තමන් සමග ලියාපදිංචි වී ඇති සියලු පුද්ගලයන් පිළිබඳව රෙජිස්ටරයක්, තත් කාර්යය සඳහා මණ්ඩලය විසින් සාදන ලද රීති මගින් නිශ්චිතව සඳහන් කරනු ලබන යම් ආකාරයකින් සෑම රක්ෂණකරුවකු හෝ තැරැව්කරුවකු විසින් පවත්වා ගෙන යනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ පවත්වා ගෙන යනු ලබන රෙජිස්ටරයේ පිටපතක් වාර්ෂිකව මණ්ඩලය වෙත යැවීමට සෑම රක්ෂණකරුවකුට ම හෝ තැරැව්කරුවකුට ම නියම වන අතර, ලැයිස්තුවට කරනු ලබන එකතු කිරීම් හෝ කපා හැරීම් කිසිවක් පිළිබඳව ඒ රක්ෂණකරු හෝ තැරැව්කරු විසින් මණ්ඩලයට දැනුම් දෙනු ලැබිය යුතු ය.

(3) රක්ෂණ ඔප්පු දරන්නන්ගේ යහපත සැලකිල්ලට ගෙන, යම් රක්ෂණකරුවකු හෝ තැරැව්කරුවකු හෝ විසින් මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද රෙජිස්ටරයේ රක්ෂණ නියෝජිතයකු වශයෙන් නම සඳහන් තැනැත්තකු රක්ෂණ නියෝජිතයකු වශයෙන් කටයුතු කිරීමට නුසුදුසු බව මණ්ඩලය සලකන විටක, ඒ රක්ෂණ නියෝජිතයාගේ නම කපා හරින ලෙස, අවස්ථාවෝචිත පරිදි, ඒ රක්ෂණකරුට හෝ තැරැව්කරුට නියම කිරීමට මණ්ඩලයට අයිතිවාසිකම ඇත්තේ ය.

(4) මණ්ඩලය විසින් තත් කාර්යය සඳහා සාදනු ලබන රීති මගින්, රක්ෂණ නියෝජිතයකු වශයෙන් පත් කරනු ලැබීමේ කාර්යය සඳහා යම් තැනැත්තකු වෙත තිබිය යුතු සුදුසුකම් නිශ්චය කරනු ලැබිය හැකි ය.

(5) යම් රක්ෂණකරුවකු හෝ තැරැව්කරුවකු විසින්, වෙනත් යම් රක්ෂණකරුවකු හෝ තැරැව්කරුවකු සමග ඒ වන විටත් රක්ෂණ නියෝජිතයකු වශයෙන් ලියාපදිංචි වී ඇති යම් පුද්ගලයකු, රක්ෂණ නියෝජිතයකු වශයෙන් පත් කරනු නොලැබිය යුතු ය.

ලියාපදිංචි කර නොමැතිව, රක්ෂණ තැරැව් කරුවකුගේ ව්‍යාපාරය කරගෙන යාම තහනම් බව.

**79.** කිසිම තැනැත්තකු, ඒ තැනැත්තා මණ්ඩලය විසින් ප්‍රදානය කරන ලද තැරැව්කරුවකු වශයෙන් ලියාපදිංචි කිරීමේ සහතිකයක් දරන්නකු නම් හා මණ්ඩලය විසින් අනුමත කරන ලද රක්ෂණ තැරැව්කරුවන්ගේ සංගමයක සාමාජිකයකු වන්නේ නම් මිස, රක්ෂණ තැරැව්කරුවකු වශයෙන් ක්‍රියා කිරීම හෝ එලෙස පෙනී සිටීම හෝ නොකළ යුතු ය.

තැරැව්කරුවකු වශයෙන් ලියාපදිංචි කිරීම සඳහා සුදුසුකම්.

**80.** (1) යම් තැනැත්තකු, ඒ තැනැත්තා —

(අ) තත් කාර්යය පදහා මණ්ඩලය විසින් සාදන ලද රීති මගින් නිශ්චය කරනු ලබන යම් ප්‍රමාණයක ගෙවා නිමි කොටස් ප්‍රාග්ධනයක් ඇති, 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි කරන ලද සමාගමක් වන්නේ නම් ;

(ආ) මණ්ඩලයට පිළිගත හැකි පරිදි රක්ෂණ ව්‍යාපාරයේ සුදුසුකම් සහ පළපුරුද්ද ඇති තැනැත්තන් එහි සේවා නියුක්තියෙහි හෝ එහි අධ්‍යක්ෂ මණ්ඩලයේ සිටින්නේ නම් ;

(ඇ) රක්ෂණකරුවන් දෙදෙනකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සමග වෘත්තීය හානිපූර්ණය සඳහා රක්ෂණ ඔප්පුවක් හෝ ඔප්පු ලබාගන්නේ නම් ;

(ඈ) රක්ෂිත මහජනතාවගේ යහපත ආරක්ෂා කිරීම තහවුරු කිරීමේ කාර්යය සඳහා, මණ්ඩලය විසින් තත් කාර්යය සඳහා සාදන ලද රීති මගින් නියම කරනු ලබන වෙනත් යම් අවශ්‍යතාවන් ඉටු කරන්නේ නම්

මිස, රක්ෂණ නියෝජිතයකු වශයෙන් ලියාපදිංචි කරනු නොලැබිය යුතු ය.

(2) (අ) යම් සමාගමක් යම් රක්ෂණකරුවකුගේ කොටස් හිමියකු වන අවස්ථාවක ; හෝ

(ආ) (i) ඒ සමාගමේ අධ්‍යක්ෂවරයකු හෝ නිශ්චිත නිලධරයකු ; හෝ

(ii) ඒ සමාගමේ ආශ්‍රිත සමාගමක හෝ පාලිත සමාගමක අධ්‍යක්ෂවරයකු හෝ ප්‍රධාන විධායක නිලධරයකු,

යම් රක්ෂණකරුවකුගේ අධ්‍යක්ෂවරයකු හෝ කොටස් හිමියකු හෝ සේවා නියුක්තයකු වන අවස්ථාවක,

ඒ සමාගමට රක්ෂණ තැරැව්කරුවකු ලෙස ලියාපදිංචි වීමට හිමිකම් නොමැත්තේ ය.

81. තැරැව්කරුවකු වශයෙන් ලියාපදිංචි කිරීම සඳහා වූ සෑම ඉල්ලුම් පත්‍රයක් ම, මණ්ඩලය විසින් තත් කාර්යය සඳහා සපයනු ලබන යම් ආකෘති පත්‍රයක මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, ඒ සෑම ඉල්ලුම් පත්‍රයක් ම සමග — ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලුම් කිරීම.

(අ) සමාගමේ සාංගමික සංස්ථා පත්‍රයේ හා සාංගමික ව්‍යවස්ථාවලියේ සහතික පිටපතක් ;

(ආ) සමාගම සංස්ථාගත කිරීමේ සහතිකයේ සහතික පිටපතක් ;

(ඇ) (i) සමාගමේ කොටස් හිමියන්ට ;

(ii) සමාගමේ අධ්‍යක්ෂවරුන් හා ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන් ;

(iii) 80 වන වගන්තියේ (ඇ) ඡේදය යටතේ මණ්ඩලය විසින් නියම කරන ලද අවශ්‍යතා කිසිවක් වේ නම්, ඒ අවශ්‍යතා ඉටු කිරීමට

අදාළ විස්තර දැක්වෙන ප්‍රකාශ ;

(ඈ) යථා පරිදි සම්පූර්ණ කොට සහතික කරන ලද, සමාගම් රෙජිස්ට්‍රාර්වරයා විසින් නිකුත් කරන ලද 48 ආකෘතියේ පිටපතක් ;

(ඉ) සමාගම විසින් ක්‍රියාත්මක කිරීමට යෝජිත රක්ෂණ ව්‍යාපාරයේ පන්තිය හෝ පන්ති දැක්වෙන ප්‍රකාශනයක් ;

(ඊ) සමාගමේ ගෙවා නිමි කොටස් ප්‍රාග්ධනයේ ප්‍රමාණය දැක්වෙන ප්‍රකාශනයක් ;

(උ) එක් එක් දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාර හා සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර සම්බන්ධයෙන් තත් කාර්යය සඳහා මණ්ඩලය විසින් නියම කරනු ලබන ගාස්තුවක් ;

(ඌ) මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන යම් ආකෘතියක හා යම් මුදලක් සඳහා, රක්ෂණකරුවන් දෙදෙනකු හෝ ඊට වැඩි ගණනක් විසින් නිකුත් කරන ලද වෘත්තිය හානිපූරණ රක්ෂණ ඔප්පුවේ හෝ ඔප්පුවල සහතික පිටපතක් ; සහ

(එ) මණ්ඩලය විසින් ඉදිරිපත් කරන ලෙස නියම කරනු ලබන වෙනත් යම් ලේඛන හා තොරතුරු,

ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

තැරැව්කරුවකු වශයෙන් ලියාපදිංචි කිරීම.

**82.** (1) මණ්ඩලය —

(අ) ඉල්ලුම්කරුවකුට ලැබීමට ඉඩ ඇති ව්‍යාපාර ප්‍රමාණය සහ ඉල්ලුම්කරුවකුගේ ඉපයීමේ අපේක්ෂාවන් ප්‍රමාණවත් බවට ;

(ආ) ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කරනු ලබන්නේ යම් ව්‍යාපාරයක් සම්බන්ධයෙන් ද, ඒ ව්‍යාපාරය පිළිගත් වෘත්තිය ප්‍රමිතිවලට අනුකූලව පවත්වා ගෙන යනු ලබන බවට ;

(ඇ) ඉල්ලුම්කරුගේ මූල්‍ය තත්ත්වය සතුටුදායක බවට ;

(ඈ) ඉල්ලුම්කරුගේ සේවා නියුක්තියේ සිටින තැනැත්තන්ගේ රක්ෂණ තැරැව්කාර ව්‍යාපාරයේ දැනුම, නිපුනතාව හා පළපුරුද්ද ප්‍රමාණවත් බවට ; සහ

(ඉ) රක්ෂණ තැරැව්කාර ව්‍යාපාරය කර ගෙන යාමේ තනි කාර්යය සඳහා, සමාගම 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි කර ඇති බවට,

සෑහීමට පත්වන අවස්ථාවක, ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කරනු ලබන්නේ රක්ෂණ ව්‍යාපාරයේ යම් පන්තියක් හෝ පන්ති සම්බන්ධයෙන් ද, ඒ පන්තිය හෝ පන්ති සඳහා මණ්ඩලය විසින් ඒ ඉල්ලුම්කරු රක්ෂණ තැරැව්කරුවකු වශයෙන් ලියාපදිංචි කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ රක්ෂණ තැරැව්කරුවකු ලියාපදිංචි කරනු ලැබූ විට ලියාපදිංචි කිරීමේ සහතිකයක්, ඒ සහතිකයේ නිශ්චිතව සඳහන් කරනු ලබන යම් කොන්දේසිවලට

යටත්ව මණ්ඩලය විසින් ඉල්ලුම්කරු වෙත නිකුත් කරනු ලැබිය යුතු අතර, ඒ සහතිකය එක් අවුරුද්දක කාලයක් සඳහා වලංගු විය යුතු ය. දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරය සහ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර සම්බන්ධයෙන් වෙනම ලියාපදිංචි කිරීමේ සහතික නිකුත් කරනු ලැබිය යුතු ය.

(3) මණ්ඩලය විසින් නිකුත් කරන ලද ලියාපදිංචි කිරීමේ සහතිකයකින් ඒ දරන්නාට එහි නිශ්චිතව සඳහන් කර ඇති ව්‍යාපාරය කර ගෙන යාමට බලය දෙනු ලැබිය යුතු ය.

(4) මේ වගන්තිය යටතේ තැරැව්කරුවකු වෙත නිකුත් කරන ලද ලියාපදිංචි කිරීමේ සහතිකයක් —

(අ) වෙනත් යම් තැනැත්තකුට පවරනු නොලැබිය යුතු අතර, එවැනි යම් පැවරීමක් ශූන්‍ය හා බලරහිත වන්නේ ය ;

තව ද

(ආ) වෙනත් යම් තැනැත්තකුගේ අර්ථලාභය සඳහා භාවිත කරනු නොලැබිය යුතු ය.

(5) මණ්ඩලය විසින් කවර හෝ අවස්ථාවක රක්ෂණ තැරැව්කරුවකුගේ ලියාපදිංචි කිරීමේ පවත්නා යම් කොන්දේසිවලට කොන්දේසි කිසිවක් එකතු කිරීම, ඒ කොන්දේසි වෙනස් කිරීම හෝ ප්‍රත්‍යාදිෂ්ට කිරීම හෝ අලුත් කොන්දේසි පැනවීම හෝ කළ හැකි ය.

තැරැව්කරුවකු වෙත ප්‍රදානය කරන ලද ලියාපදිංචි කිරීමක් අලුත් කිරීම.

**83.** තැරැව්කරුවකු වෙත නිකුත් කරන ලද ලියාපදිංචි කිරීමේ සහතිකය, තත් කාර්යය සඳහා මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලබන ඉල්ලුම් පත්‍රයක් මත අලුත් කරනු ලැබිය හැකි අතර, ඒ ඉල්ලුම් පත්‍රය සමග —

(අ) මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන යම් ආකෘතියක හා මුදලක් සඳහා ඉදිරි කාලය සඳහා වෘත්තීය හානිපූරණ රක්ෂණ ඔප්පුවක් ;

(ආ) ඉකුත් මුදල් වර්ෂයේ දී සිදු කරන ලද ව්‍යාපාරය පිළිබඳ ප්‍රකාශයක් ;

(ඇ) ඒ අලුත් කිරීම සම්බන්ධයෙන් මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන අලුත් කිරීමේ ගාස්තුවක් ; සහ

(ඈ) මණ්ඩලය විසින් නියම කරනු ලබන වෙනත් ලේඛන,

ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

ලියා පදිංචි කිරීමක් අවලංගු කිරීම හෝ අත්හිටුවීම.

**84.** (1) (අ) තැරැව්කරු නිදහස් කරනු නොලැබූ බුන්වත් තැනැත්තකු හෝ වස්තු භංගත්වයට පත් තැනැත්තකු ලෙස බලපවත්නා නීතිය යටතේ නිරණය කර ඇති හෝ ප්‍රකාශයට පත් කර ඇති ;

(ආ) තැරැව්කරු, මණ්ඩලය විසින් නිකුත් කරන ලද යම් උපදෙස්වලට දිගට ම අකීකරු වන ;

(ඇ) (i) තැරැව්කරුගේ අධ්‍යක්ෂවරයකු හෝ නිශ්චිත නිලධරයකු ; හෝ

(ii) ඒ තැරැව්කරුගේ ආශ්‍රිත හෝ පාලිත සමාගමක අධ්‍යක්ෂවරයකු හෝ ප්‍රධාන විධායක නිලධරයකු

රක්ෂණකරුගේ අධ්‍යක්ෂවරයකු හෝ කොටස් හිමියකු හෝ සේවා නියුක්තයකු වන ;

(ඈ) තැරැව්කරු මේ පනත යටතේ යම් වරදකට වරදකරු බව තීරණය කර ඇති හෝ යටත් පිරිසෙයින් වෙන් වෙන් අවස්ථා තුනක දී මණ්ඩලය විසින් ලිඛිතව අවවාද කර හෝ පරික්ෂාකාරී වන ලෙස දැනුම් දී ඇති ; හෝ

(ඉ) තැරැව්කරු විසින් මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද යම් ඉල්ලුම් පත්‍රයක, ගිණුමක, ලිඛිත තොරතුරක හෝ ලේඛනයක යම් ප්‍රකාශයක් අසත්‍ය හෝ නොමග යවන සුළු බව තීරණය කරනු ලැබූ

අවස්ථාවක, මණ්ඩලය විසින් තැරැව්කරුවකුගේ ලියාපදිංචි කිරීමක් අත්හිටුවීම හෝ අවලංගු කිරීම නැතහොත් තැරැව්කරුවකු වෙත නිකුත් කරන ලද සහතිකයක් අලුත් කිරීම ප්‍රතික්ෂේප කිරීම හෝ කළ හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ මණ්ඩලය විසින් කරන ලද තීරණයකින් අතෘප්තියට පත් තැරැව්කරුවකු විසින්, ඊට එරෙහිව අභියාචනාධිකරණය වෙත අභියාචනය කළ හැකි අතර, මේ පනතේ 19 වන වගන්තියේ විධිවිධාන ඒ අභියාචනය සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

ලියාපදිංචි තැරැව්කරු විසින් රක්ෂණ ඔප්පු ලබා ගෙන පවත්වා ගෙන යා යුතු බව.

**85.** (1) සෑම තැරැව්කරුවකු විසින් ම, ඒ තැරැව්කරුගේ ව්‍යාපාරය හා සම්බන්ධයෙන් ඒ තැරැව්කරුවන් හෝ ඔවුන්ගේ දැනට සිටින හෝ කලින් සිටි සේවානියුක්තයන් විසින් දරන ලද කවර හෝ විස්තරයකට අයත් සිවිල් වගකීමක් සම්බන්ධයෙන් වූ යම් හිමිකම් පෑම්වලින් උද්ගත වන පාඩුවලට එරෙහිව, මණ්ඩලය විසින් අනුමත කරන ලද ලියාපදිංචි රක්ෂණකරුවන් දෙදෙනකුගෙන් හෝ ඊට වැඩි ගණනකින්, රක්ෂණ ඔප්පු ලබා ගෙන ඒවා පවත්වා ගෙන යා යුතු ය.

(2) මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධානවල ව්‍යාප්තියට හානියක් නොමැතිව, යම් නොසැලකිලිමත් ක්‍රියාවක්, දෝෂයක් හෝ නොකර හැරීමක් හේතුකොට ගෙන ව්‍යාපාරය හා සම්බන්ධ වගකීම් කඩ කිරීම සඳහා රක්ෂිතයාට එරෙහිව කරනු ලබන හිමිකම් පෑම්වලින් උද්ගත වන පාඩුවලට එරෙහිව, ඒ රක්ෂණ ඔප්පුව මගින් රක්ෂණකරු වගකීමෙන් නිදහස් කරනු ලැබිය යුතු ය :

එසේ වුව ද, යම් වංක හෝ වංචනික ක්‍රියාවක් හෝ නොකර හැරීමක් සිදු කරන, කරන හෝ එහි ලා කමා කරන යම් තැනැත්තකුට ඒ රක්ෂණ ඔප්පුව මගින් වගකීමෙන් නිදහස් කිරීමක් සලසන ලෙස නියම කරනු නොලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ ලබා ගන්නා ලද රක්ෂණ ඔප්පුවක් මගින්, ලියාපදිංචි කරන ලද සහතිකයක් අලුත් කරනු ලබන දිනයේ දී—

(අ) රුපියල් ලක්ෂ පහළොවක මුළු මුදලක් ; හෝ

(ආ) මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන වගකීම පිළිබඳ උපරිම සීමාවකට යටත්ව, රක්ෂණ ඔප්පුව ආරම්භ වන හෝ අලුත් කරනු ලබන දිනයට පෙරාතුව අවසන් වන අවසාන ගිණුම් කාල සීමාව සඳහා ව්‍යාපාරයේ තැරැව් ගාස්තුව මෙන් තුන් ගුණයකට සමාන මුදලක්

සඳහා, වගකීමෙන් නිදහස් කිරීමේ අවම සීමාවක් සලස්වනු ලැබිය යුතු ය.

(4) මණ්ඩලයේ ලිඛිත අනුමතය නොමැතිව, වගකීමෙන් නිදහස් කිරීමේ අවම සීමාවෙන් 2.5% ක් ඉක්මවන අතිරික්තයක් හෝ අඩු කළ යුතු මුදලක් කිසිම රක්ෂණ ඔප්පුවක නොතිබිය යුතු ය.

ගිණුම් පවත්වා ගෙන යාම සහ වාර වාර්තා ඉදිරිපත් කිරීම.

**86.** (1) සෑම තැරැව්කරුවකු විසින් ම, තත් කාර්යය සඳහා සාදන ලද රීති මගින් මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන යම් ආකාරයට හා යම් ආකෘතිවල ගිණුම් පවත්වා ගෙන යනු ලැබිය යුතු ය.

(2) සෑම තැරැව්කරුවකු විසින් ම, ගිණුම් කාල සීමාව ඉකුත්ව මාස හයක් ඇතුළත, ඒ ගිණුම් ශේෂ පත්‍රයකින් ද, ලාභාලාභ ගිණුමකින් ද, ගිණුම් පිළිබඳ සටහනකින් ද, සමන්විත සුදුසුකම් ලත් විගණකවරයකු විසින් සහතික කරන ලද විගණනය කරනු ලැබූ ගිණුම් මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(3) සෑම තැරැව්කරුවකු විසින් ම, එය විසින් ව්‍යාපාර පවරනු ලැබූ සියලුම රක්ෂණකරුවන්ගේ නම් ද, එසේ පවරනු ලැබූ ව්‍යාපාරවල ප්‍රතිශතය ද සඳහන් කරමින් වාර වාර්තාවක් මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ පවරනු ලැබූ ව්‍යාපාරවල ප්‍රතිශතය මණ්ඩලය විසින් නිශ්චය කරන ලද ප්‍රතිශතය නොඉක්මවන බවට ඒ තැරැව්කරුගේ අධ්‍යක්ෂවරයන් දෙදෙනකු විසින් නිසි පරිදි අත්සන් තබන ලද සහතිකයක් වාර්ෂිකව මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(4) සෑම ලියාපදිංචි තැරැව්කරුවකු විසින් ම, "රක්ෂණ තැරැව්කාර ගිණුම" යනුවෙන් හඳුන්වනු ලබන හා බලපත්‍ර ලත් වාණිජ බැංකුවක තැරැව්කරු විසින් පවත්වා ගෙන යනු ලබන ගිණුමකට, රක්ෂණ ගිවිසුමක් සම්බන්ධයෙන් ලැබෙන සියලු මුදල් ගෙවනු ලැබිය යුතු ය.

(5) තැරැව්කරුවකු විසින් ඉදිරිපත් කරන ලද යම් ගිණුමක්, ප්‍රකාශයක් හෝ වාර වාර්තාවක් යම් ආකාරයකින් වැරදි සහගත බව හෝ අසම්පූර්ණ බව මණ්ඩලයට පෙනී යන්නේ නම්—

(අ) විගණකවරයකු විසින් හෝ අවශ්‍ය යයි මණ්ඩලය සලකන වෙනත් තැනැත්තකු විසින් සහතික කරනු ලැබිය යුතු යයි මණ්ඩලය විසින් විධාන කරනු ලබන්නේ නම්, එසේ සහතික කරනු ලැබූ වැඩිදුර තොරතුරු ; නැතහොත්

(ආ) මණ්ඩලය විසින් පරීක්ෂා කරනු ලැබීම සඳහා යම් වැඩිදුර ලේඛනයක්,

මණ්ඩලය විසින් ඉල්ලා සිටිනු ලැබිය හැකි ය.

**87.** තැරැව්කරුවකු වශයෙන් ලියාපදිංචි කිරීම හෝ දැනටමත් නිකුත් කර ඇති ලියාපදිංචි කිරීමේ සහතිකයක් නැවත අලුත් කිරීම සඳහා වන කිසිම ඉල්ලීමක්, ඒ ඉල්ලීම ප්‍රතික්ෂේප නොකළ යුතු වන්නේ මක්නිසා ද යන වග පිළිබඳව හේතු දක්වන ලෙස ඉල්ලුම්කරු වෙත එයින් දැනුම් නොදී සහ ඉල්ලුම්කරු විසින්— හේතු දක්වන ලෙස දැන්වීම.

(අ) ඒ නිශ්චිතව සඳහන් කාලය තුළ හේතු දැන්වීම පැහැර හරිනු ලබන්නේ නම් ; නැතහොත්

(ආ) මණ්ඩලයට පිළිගත හැකි ප්‍රමාණවත් හේතු දැක්වීම පැහැර හරිනු ලබන්නේ නම්

මිස, මණ්ඩලය විසින් ප්‍රතික්ෂේප කරනු නොලැබිය යුතු ය.

**88.** තැරැව්කරුවකු හෝ රක්ෂණ නියෝජිතයකු හෝ විසින් පවත්වා ගෙන යනු ලබන රක්ෂණ ව්‍යාපාරයේ එක් එක් පන්තිය සම්බන්ධයෙන් රක්ෂණකරුවකු විසින් ඒ තැරැව්කරුට හෝ රක්ෂණ නියෝජිතයාට ගෙවනු ලැබිය හැකි කොමිස් මුදලේ උපරිම අනුපාතය මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය යුතු ය. අතරමැදියන්ට ගෙවනු ලබන කොමිස් මුදලේ අනුපාතය.

**89.** තැරැව්කරුවකු හෝ රක්ෂණ නියෝජිතයකු හෝ විසින් රක්ෂණකරුවකු වෙනුවෙන් එකතු කරනු ලබන වාරික, එසේ එකතු කිරීමෙන් සති දෙකක් ඇතුළත ප්‍රේෂණය කිරීම, ඒ තැරැව්කරුගේ හෝ රක්ෂණ නියෝජිතයාගේ කාර්යය වන්නේ ය. නියෝජිතයන් හා තැරැව්කරුවන් විසින් වාරික එකතු කිරීම.

## IX වන කොටස

## වැරදි

**90.** (අ) මේ පනත යටතේ යථා පරිදි ලියාපදිංචි කර නොමැතිව රක්ෂණ ව්‍යාපාරයක් කර ගෙන යන හෝ යම් රක්ෂණ ව්‍යාපාරයක් ආරම්භ කරන යම් සමාගමක් ; හෝ ලියාපදිංචි කර නොමැතිව යම් රක්ෂණ ව්‍යාපාරයක් කර ගෙන යාමේ හෝ ආරම්භ කිරීමේ වරද හෝ බලය දී නොමැති රක්ෂණ ව්‍යාපාර යම් පන්තියක් කර ගෙන යාමේ වරද.

(ආ) මේ පනතේ 15 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක් යටතේ කර ගෙන යාමට බලය දී නොමැති යම් වර්ගයක රක්ෂණ ව්‍යාපාරයක් කර ගෙන යන යම් සමාගමක්,

වරදකට වරදකරු විය යුතු අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබීමේ දී රුපියල් පනස් දහසකට නොඅඩු

දඩයකට හෝ එක් අවුරුද්දකට නො අඩු කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරගත වූ බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ ඒ සමාගම යටත් විය යුතු ය.

මේ පනත උල්ලංඝනය කරමින් රක්ෂණ නියෝජිතයකු වශයෙන් ව්‍යාපාරය කර ගෙන යාමේ වරද.

**91.** රක්ෂණකරුවකු හෝ තැරැව්කරුවකු වෙත රක්ෂණ නියෝජිතයකු වශයෙන් යථා පරිදි ලියාපදිංචි කර නොමැතිව රක්ෂණ නියෝජිතයකු වශයෙන් ව්‍යාපාරය කර ගෙන යන යම් තැනැත්තකු වරදකට වරදකරු විය යුතු අතර, මහේස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබීමේ දී රුපියල් පනස් දහසකට නොඅඩු දඩයකට හෝ එක් අවුරුද්දකට නොඅඩු කාලයක් සඳහා දෙආකාරයෙන් එක් ආකාරයක වූ බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ ඒ තැනැත්තා යටත් විය යුතු ය.

82 වන වගන්තියේ විධිවිධාන උල්ලංඝනය කිරීම වරදක් බව.

**92.** මේ පනතේ 82 වන වගන්තිය යටතේ යථා පරිදි ලියාපදිංචි කර නොමැතිව, තැරැව්කරුවකු වශයෙන් ව්‍යාපාරය කරගෙන යන යම් තැනැත්තකු වරදකට වරදකරු විය යුතු අතර, මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ දී පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබීමේ දී රුපියල් පනස් දහසකට නොඅඩු දඩයකට හෝ එක් අවුරුද්දකට නොඅඩු කාලයක් සඳහා දෙආකාරයෙන් එක් ආකාරයක වූ බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ ඒ තැනැත්තා යටත් විය යුතු ය.

මේ පනත යටතේ වූ වෙනත් වැරදි.

**93.** වරදක් සඳහා විශේෂ දණ්ඩනයක් නිශ්චිතව දක්වා ඇති 54, 57, 67, 90, 91 හෝ 92 වන වගන්තිවල විධිවිධානවලට හානියක් නොමැතිව, මේ පනතේ යම් විධිවිධානයක් හෝ මේ පනත යටතේ මණ්ඩලය විසින් යවන ලද යම් විධානයක් හෝ මේ පනත යටතේ සාදන ලද යම් රීතියක් කඩ කරන හෝ ඒ අනුව ක්‍රියා කිරීම පැහැර හරින යම් තැනැත්තකු වරදකට වරදකරු විය යුතු අතර, මහේස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබීමේ දී රුපියල් පනස් දහසකට නොඅඩු දඩයකට සහ දිගට ම සිදු කරනු ලබන වරදක් සම්බන්ධයෙන් වන විට, වරදකරු කරනු ලැබීමෙන් පසු ඒ වරද දිගට ම සිදු කරනු ලබන එක් එක් දිනය සඳහා රුපියල් දෙදහසකට නොඅඩු වැඩිදුර දඩයකට ඒ තැනැත්තා යටත් විය යුතු ය.

## X කොටස

### සාමාන්‍ය කරුණු

**94.** (1) සෑම රක්ෂණකරුවකු සහ තැරැව්කරුවකු විසින් ම ප්‍රධාන කාර්යාලයක් පවත්වා ගෙන යනු ලැබිය යුතු අතර, තත් කාර්යය සඳහා මණ්ඩලය විසින් සාදනු ලබන රීති මගින් මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන යම් සුදුසුකම් ඇති තැනැත්තකු එහි ප්‍රධාන නිලධරයා ලෙස පත් කරනු ලැබිය යුතු ය. තව ද ඒ නිලධරයා එහි ව්‍යාපාර කටයුතුවල සාමාන්‍ය පාලනය, මෙහෙයවීම හා අධීක්ෂණය සම්බන්ධයෙන් වගකිව යුතු ය.

ප්‍රධාන නිලධරයන් පත් කිරීම.

(2) රක්ෂිත මහජනතාව විෂයයෙහි රක්ෂණකරුවකුට හෝ තැරැව්කරුවකුට ඇති වගකීම් හා රක්ෂණ ක්ෂේත්‍රයෙහි සුදුසුකම් හෝ පළපුරුද්දක් ලබා ඇති තැනැත්තන් ප්‍රධාන නිලධරයන් වශයෙන් සේවයෙහි නියුක්ත කරනු ලබන බවට සහතික කිරීමේ අවශ්‍යතාව සැලකිල්ලට ගෙන, ප්‍රධාන නිලධරයකු වශයෙන් පත් කරන ලද යම් තැනැත්තකු ඒ තනතුර දැරීමට නුසුදුසු හා අයෝග්‍ය තැනැත්තකු යයි මණ්ඩලය සලකන අවස්ථාවක, ඒ පත් කිරීමට විරුද්ධ වීමට මණ්ඩලයට බලය තිබිය යුතු ය.

(3) (2) වන උපවගන්තිය යටතේ ප්‍රධාන නිලධරයකුගේ පත් කිරීමට මණ්ඩලය විරුද්ධ වන අවස්ථාවක, අවස්ථාවෝචිත පරිදි, ඔහු හෝ ඇය සේවයෙහි නියුක්ත කළ රක්ෂකයකු හෝ තැරැව්කරුවකු විසින් ඔහුගේ හෝ ඇයගේ පත්වීම ප්‍රත්‍යාදිෂ්ට කර, ඔහු හෝ ඇය වෙනුවට වෙනත් තැනැත්තකු පත් කරනු ලැබිය යුතු ය.

**95.** සෑම රක්ෂණකරුවකු හා තැරැව්කරුවකු විසින් ම, තත් කාර්යය සඳහා සාදන ලද රීති මගින් මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන යම් ආකෘතියක වූ රෙජිස්ටරයක්, පවත්වා ගෙන යනු ලැබිය යුතු අතර, ඒ රෙජිස්ටරයෙහි –

රක්ෂණ ඔප්පු පිළිබඳ රෙජිස්ටරය.

(අ) රක්ෂණ ඔප්පුව දරන්නාගේ නම සහ ලිපිනය සඳහන් කරමින් නිකුත් කරන ලද සෑම රක්ෂණ ඔප්පුවක් පිළිබඳ විස්තර;

(ආ) රක්ෂණ ඔප්පුව නිකුත් කරන ලද දිනය සහ ඔප්පුවේ අංකය;

(ඈ) ලැබුන වාරිකවල මුදල සහ රක්ෂණ නියෝජිතයන්ට හා තැරැව්කරුවන්ට ගෙවන ලද කොමිස් මුදල ;

(ඇ) රක්ෂණය කරන ලද මුදල සහ රක්ෂණ ඔප්පුව ආරම්භ වන දිනය ;

(ඉ) ඉදිරිපත් කර ඇති හිමිකම් පෑම් පිළිබඳ විස්තර හා හිමිකම්පෑම්වලට මුදල් ගෙවන ලද දින සහ ගෙවූ මුදල් ; සහ

(ඊ) හිමිකම් පෑමක් ප්‍රතික්ෂේප කරනු ලැබූ විටක, එසේ ප්‍රතික්ෂේප කිරීමට හේතු සහ හිමිකම් පෑමක කොටසක් බේරුම් කර ඇති විටක එසේ කිරීමට හේතු ,

ඇතුළත් විය යුතු ය.

"රක්ෂණය" යන වචනය භාවිත කිරීම.

**96.** රක්ෂණකරුවකු, මේ පනත යටතේ ලියාපදිංචි කර ඇති තැරැව්කරුවකු හෝ එවැනි රක්ෂණකරුවකුගේ හෝ තැරැව්කරුවකුගේ රක්ෂණ නියෝජිතයකු නොවන වෙනත් කිසිම තැනැත්තකු විසින්, මණ්ඩලයේ ලිඛිත අනුමතය නොමැතිව, ස්වකීය නාමයේ, අභිධානයේ හෝ විස්තරයේ කොටසක් වශයෙන් "රක්ෂණය" වන වචනය හෝ ඒ වචනයේ ව්‍යුත්පන්න කිසිවක් හෝ වෙනත් භාෂාවක ඒ වචනයට සමාන වෙනත් යම් වචනයක්, ඒ නාමයෙන්, අභිධානයෙන් හෝ විස්තරයෙන් ඒ තැනැත්තා විසින් ශ්‍රී ලංකාවෙහි රක්ෂණ ව්‍යාපාරය කර ගෙන යන බව පෙන්නුම් කිරීම පිණිස භාවිත කිරීම හෝ ඒ ප්‍රතිඵලය ගෙන දෙන නිරූපණ කිසිවක් යම් බිල්පත්‍ර ශීර්ෂයක, ලිපි ශීර්ෂයක, දැන්වීමක හෝ ප්‍රචාරක දැන්වීම් කිරීම හෝ නොකළ යුතු ය :

එසේ වුව ද, රක්ෂණකරුවන්ගේ හෝ තැරැව්කරුවන්ගේ සමාගමක් විසින් "රක්ෂණය" යන වචනය හෝ ඒ වචනයේ ව්‍යුත්පන්න කිසිවක් හෝ යම් භාෂාවක ඒ වචනයට සමාන වචනයක් හෝ එහි නාමයේ හෝ අභිධානයේ කොටසක් වශයෙන් නැතහොත් එහි කටයුතුවල විස්තරයක් වශයෙන් භාවිත කිරීම, මේ වගන්තියේ ඇතුළත් කිසිවකින් තහනම් නොවන්නේ ය.

දැන්වීම භාර දීම.

**97.** යම් රක්ෂණකරුවකු වෙත භාර දිය යුතු බවට මේ පනතින් හෝ මේ පනත යටතේ නියම කර ඇති හෝ බලය දී ඇති යම් දැන්වීමක්, තත් කාර්යය සඳහා, 1982 අංක 17 දරන සමාගම් පනතේ ඇතුළත් විධිවිධානවලට අනුකූලව ඒ රක්ෂණකරු

හෝ යම් අධ්‍යක්ෂවරයකු හෝ කළමනාකරුවකු හෝ නිලධරයකු වෙත භාර දෙනු ලැබිය යුතු අතර, එසේ භාර දෙනු ලැබුවහොත්, මේ පනතේ කාර්ය සඳහා ඒ දැන්වීම යථා පරිදි භාර දෙනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

රක්ෂණය කරන ලද මුදල, නිශ්චිත මුදලක් නොඉක්මවන දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාර ඔප්පු යටතේ උද්ගත වන හිමිකම් පෑම් බේරුම් කිරීමට මණ්ඩලයට ඇති බලය.

**98.** (පොරොන්දු වූ ලාභයක් හෝ බෝනස් මුදලක් නොවන යම් ලාභයක් හෝ බෝනස් මුදලක් හැර) රක්ෂණය කරන ලද මුදල මණ්ඩලය විසින් නිශ්චය කරන ලද යම් මුදලක් නොඉක්මවන්නා වූ ද, රක්ෂණකරුවකු විසින් සිදු කරන ලද රක්ෂණ ව්‍යාපාරය සම්බන්ධයෙන් ඒ රක්ෂණකරු විසින් නිකුත් කරන ලද්දා වූ ද, දීර්ඝ කාලීන රක්ෂණ ඔප්පුවක් මත වූ හිමිකම් පෑමක් බේරුම් කිරීමට අදාළ ආරාවුලක් රක්ෂණ ඔප්පුවක් යටතේ හිමිකම් පාන්නකු සහ රක්ෂණ ඔප්පුව නිකුත් කළ හෝ ඒ සම්බන්ධයෙන් අන්‍යාකාරයකින් වගකීම භාර ගෙන ඇති රක්ෂණකරුවකු අතර උද්ගත වන අවස්ථාවක, ඒ ආරාවුල හිමිකම්පාන්නාගේ මනාපය අනුව, මණ්ඩලයේ තීරණය සඳහා මණ්ඩලය වෙත යොමු කරනු ලැබිය හැකි අතර, මණ්ඩලය විසින් කරුණු දක්වා සිටීමට අවස්ථාවක් පාර්ශ්වකරුවන්ට ලබා දීමෙන් පසුව සහ සුදුසු යයි මණ්ඩලය විසින් කල්පනා කරන වැඩිදුර පරීක්ෂණ පැවැත්වීමෙන් පසුව, මණ්ඩලය විසින් ආරාවුල සම්බන්ධයෙන් එහි නියමය කරනු ලැබිය හැකි ය.

ප්‍රචාරක දැන්වීම්.

**99.** (1) රක්ෂණකරුවන්, රක්ෂණ නියෝජිතයන් හා තැරැව්කරුවන් විසින් නිකුත් කරනු ලබන ප්‍රචාරක දැන්වීම්වල අසත්‍ය, වැරදි සහගත හෝ මහජනයා නොමග යවන සුළු යම් තොරතුරක් හෝ කරුණක් ඇතුළත් නොවිය යුතු ය.

(2) අසත්‍ය, වැරදි සහගත හෝ නොමග යවන සුළු තොරතුරක් හෝ කරුණක් ඇතුළත් යම් ප්‍රචාරක දැන්වීමක් සම්බන්ධයෙන් (1) වන උපවගන්තියෙහි සඳහන් යම් තැනැත්තකුට හෝ පුද්ගල මණ්ඩලයකට විධාන නිකුත් කිරීමට මණ්ඩලයට බලය තිබිය යුතු අතර, ඒ දැන්වීම නිකුත් කරන ලද විධානවලට අනුකූලව සංශෝධනය කිරීම ඒ තැනැත්තාගේ යුතුකම විය යුතු ය.

(3) (1) වන උපවගන්තියේ විධිවිධානවල කුමක් සඳහන්ව ඇත ද, රක්ෂණකරුවකු, රක්ෂණ නියෝජිතයකු හෝ තැරැව්කරුවකු විසින් නිකුත් කරනු ලබන සෑම ප්‍රචාරක දැන්වීමක, ලිපි ශීර්ෂයක, නාම පුවරුවක, විස්තර පත්‍රිකාවක හෝ වෙනත් ප්‍රකාශයක, ස්වකීය නාමයෙන් පසුව, අවස්ථාවෝචිත පරිදි, තමා

රක්ෂණකරුවකු ද රක්ෂණ නියෝජිතයකු ද නැතහොත් තැරැව්කරුවකු ද යන වග සඳහන් කිරීම, ඒ සෑම රක්ෂණකරුවකුගේ, රක්ෂණ නියෝජිතයකුගේ සහ තැරැව්කරුවකුගේ ම යුතුකම විය යුතු ය.

(4) මේ වගන්තියේ කාර්ය සඳහා "ප්‍රචාරක දැන්වීම" යන්නෙන්, තැනැත්තන්ට රක්ෂණ ගිවිසුම්වලට ඇතුළත් වන ලෙස ආරාධනය කරන හෝ ඇතුළත් වන ලෙස අර්පණය කරන ලියවිල්ලක් අදහස් වන අතර, ඒ ගිවිසුම්වලට ඇතුළත් වීමෙහි ලා හෝ ඇතුළත් වීමට අර්පණය කිරීමෙහි ලා තැනැත්තන් කෙළින් ම හෝ අන්‍යාකාරයකින් යොමු කිරීම අදහස් කොටගත් තොරතුරු ඇතුළත් යම් ලියවිල්ලක් ද ඊට ඇතුළත් වේ.

රක්ෂණකරුවන්ගේ හෝ තැරැව් කරුවන්ගේ වෙනත් ව්‍යාපාර සම්බන්ධතා.

100. කිසිම රක්ෂණකරුවකු හෝ තැරැව්කරුවකු විසින් මණ්ඩලයේ පූර්ව ලිඛිත අනුමතය නොමැතිව, රක්ෂණකරුවකු හෝ මේ පනත යටතේ මණ්ඩලයෙන් ලියාපදිංචි කිරීමක් ඒ රක්ෂණකරු හෝ තැරැව්කරු විසින් ලබාගෙන ඇත්තේ යම් රක්ෂණ ව්‍යාපාරයක් සම්බන්ධයෙන් ද ඒ රක්ෂණ ව්‍යාපාරය නොවන, වෙනත් යම් රක්ෂණ ව්‍යාපාරයක් කර ගෙන යනු නොලැබිය යුතු ය.

විදේශීය රක්ෂණ.

101. (1) ප්‍රතිරක්ෂණ ව්‍යාපාරයට අදාළව හැර, මණ්ඩලයේ පූර්ව ලිඛිත අනුමතය නොමැතිව ශ්‍රී ලංකාවේ කිසිම තැනැත්තකු විසින්, මේ පනත යටතේ ලියාපදිංචි කර නොමැති රක්ෂණකරුවකු සමග කෙළින් ම හෝ අන්‍යාකාරයකින් යම් රක්ෂණ ව්‍යාපාරයක් සම්බන්ධයෙන් කටයුතු කරනු නොලැබිය යුතු ය.

(2) රක්ෂණ කර්මාන්තය සම්බන්ධයෙන් වූ රජයේ ප්‍රතිපත්තිය සහ ජාතික යහපත සැලකිල්ලට ගැනීමෙන් පමණක්, මණ්ඩලය විසින් (1) වන උපවගන්තියේ කාර්යය සඳහා ලිඛිත අනුමතය දෙනු ලැබිය හැකි ය.

රක්ෂණ ව්‍යාපාරය පැවරීමට හා ඒකාබද්ධ කිරීමට අදාළ සාමාන්‍ය විධිවිධාන.

102. (1) රක්ෂණ ව්‍යාපාරය පැවරීමට හා ඒකාබද්ධ කිරීමට අදාළ සියලු ගනුදෙනු දිසා අධිකරණයක් විසින් අනුමත කරනු ලැබිය යුතු අතර, එවැනි අනුමතයක් සඳහා ඉල්ලුම් කිරීමේ දී ඒ පැවරීම හා ඒකාබද්ධ කිරීම පිළිබඳව මණ්ඩලයේ නිරීක්ෂණවල පිටපතක් ද අධිකරණය වෙත එහි පරීක්ෂා කිරීම සඳහා ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියෙහි සඳහන් පරිදි මණ්ඩලය විසින් එහි නිරීක්ෂණ කිරීමේ දී, ස්වාධීන ජීව ගණකයකු විසින් පෙන්වා දෙනු ලබන පරිදි ඒ පැවරීමේ හෝ ඒකාබද්ධ කිරීමේ ප්‍රතිඵලය මණ්ඩලය විසින් සැලකිල්ලට ගනු ලැබිය හැකි අතර, අවශ්‍ය වන විටක, ඒ නිරීක්ෂණයේ කාර්යය සඳහා යෝජිත පැවරීමට හා ඒකාබද්ධ කිරීමට අදාළ වැඩිදුර තොරතුරු හෝ ලේඛන කිසිවක් ඉදිරිපත් කරන ලෙස, මණ්ඩලය විසින් ඉල්ලා සිටිනු ලැබිය හැකි ය.

(3) මණ්ඩලයේ නිරීක්ෂණ, නිකුත් කරන ලද උපදේශනවලට හා පවරා ගැනීම්වලට හා ඒකාබද්ධ කිරීම්වලට අදාළව 1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත යටතේ සාදන ලද නියෝගවලට අනුකූලව කරනු ලැබිය යුතු ය.

**103.** (1) මේ වගන්තියෙහි "අරමුදල" යනුවෙන් සඳහන් කරනු ලබන "රක්ෂණ ඔප්පු දරන්නන්ගේ ආරක්ෂක අරමුදල" යනුවෙන් හඳුන්වනු ලබන අරමුදලක් මණ්ඩලය විසින් පිහිටුවනු ලැබිය යුතු අතර, ඒ අරමුදලට, මේ පනතේ 7 වන වගන්තිය යටතේ පනවා අය කරනු ලබන සෙස් බද්දෙන් උපචිත වන මුදල් බැර කරනු ලැබිය යුතු ය. රක්ෂණ ඔප්පු දරන්නන්ගේ ආරක්ෂක අරමුදල.

(2) අරමුදලේ බැරට ඇති මුදල්, රක්ෂණ ඔප්පු දරන්නන්ගේ පොදු ආරක්ෂාව අරභයා ද, තත් කාර්යය සඳහා සාදන ලද රීති මගින් මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන වෙනත් යම් නිශ්චිත කාර්යයක් සඳහා උපයෝගී කර ගනු ලැබිය යුතු ය.

(3) (2) වන උපවගන්තිය යටතේ සඳහන් කාර්ය අතුරෙන් කවර හෝ කාර්යයක් සඳහා වහා අවශ්‍ය නොවන මුදල් කිසිවක්, යහපත් ඵල ප්‍රයෝජනයක් ලැබෙන හා ආයෝජන ආරක්ෂා වන යම් විචක්ෂණ ආකාරයකින් මණ්ඩලය විසින් ආයෝජනය කරනු ලැබිය යුතු ය.

**104.** මේ පනත යටතේ වූ යම් වරදක් පුද්ගල මණ්ඩලයක් විසින් සිදු කරනු ලබන අවස්ථාවක, ඒ පුද්ගල මණ්ඩලයේ සෑම අධ්‍යක්ෂවරයකු ම, කළමනාකරුවකු ම හෝ ලේකම්වරයකු ම ඒ වරදට වරදකරු විය යුතු ය. : පුද්ගල මණ්ඩල විසින් සිදු කරනු ලබන වැරදි.

එසේ වුව ද, ඒ වරද සිදු කරන ලද්දේ තමාගේ දැනුම නොමැතිව බව හෝ ඒ වරද සිදු කිරීම වැළැක්වීමෙහි ලා තමා නිසි සියලු උද්යෝගයෙන් ක්‍රියා කළ බව ඒ පුද්ගල මණ්ඩලයේ අධ්‍යක්ෂවරයා, කළමනාකරු හෝ ලේකම්වරයා විසින් ඔප්පු කරනු ලැබුවහොත් ඔහු හෝ ඇය ඒ වරදට වරදකරු ලෙස සලකනු නොලැබිය යුතු ය.

රීති.

**105.** (1) රීති මගින් නිශ්චිතව සඳහන් කළ යුතු යයි මේ පනතින් නියම කර ඇති කාරණා සම්බන්ධයෙන් හෝ රීති සෑදීමට බලය දී ඇති කාරණා සම්බන්ධයෙන් රීති සෑදීමට මණ්ඩලයට බලය තිබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ සාදන ලද සෑම රීතියක් ම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු අතර, ඒ රීති එසේ පළ කරන ලද දිනයෙහි හෝ ඒ රීතිවල නිශ්චිතව සඳහන් කරනු ලබන යම් පසු දිනයක හෝ ක්‍රියාත්මක විය යුතු ය.

වාර්ෂික වාර්තාව.

**106.** සෑම මුදල් වර්ෂයක ම අවසානයේ දී මණ්ඩලය විසින්, වර්ෂය තුළ මණ්ඩලයේ කටයුතු පිළිබඳ වාර්තාවක් අමාත්‍යවරයාගේ අනුමතය සඳහා අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. ඒ වාර්තාව අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබූ විට, පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

මෝටර් රථ වාහන පනතේ කාර්ය සඳහා, ඇතැම් රක්ෂණකරුවන් බලය ලත් රක්ෂණකරුවන් ලෙස සලකනු ලැබිය යුතු බව සහ කම්කරු වන්දි ආඥාපනතේ 45(1) වන වගන්තිය යටතේ ඒ රක්ෂණකරුවන්ට බලපත්‍ර ප්‍රදානය කර ඇති ලෙස සලකනු ලැබිය යුතු බව.

**107.** (1) මෝටර් වාහන රක්ෂණ ව්‍යාපාරය කර ගෙන යාම පිණිස මේ පනතේ විධිවිධාන යටතේ ලියාපදිංචි කර ඇති යම් රක්ෂණකරුවකු මෝටර් වාහන පනතේ VI වන කොටසේ කාර්ය සඳහා "බලයලත් රක්ෂණකරුවකු" ලෙස සලකනු ලැබිය යුතු ය.

(2) සේවා යෝජකයන්ගේ වගකීම් රක්ෂණ ව්‍යාපාරය කර ගෙන යාම පිණිස මේ පනතේ විධිවිධාන යටතේ ලියාපදිංචි කර ඇති යම් රක්ෂණකරුවකුට කම්කරු වන්දි ආඥාපනත යටතේ සේවා යෝජකයන් විසින් දරනු ලැබිය හැකි සේවකයන් සඳහා වූ වගකීම් වලට එරෙහිව රක්ෂණය භාර ගැනීම සඳහා ඒ ආඥාපනතේ 45 වන වගන්තියේ (1) වන උපවගන්තියේ විධිවිධාන යටතේ බලපත්‍රයක් ප්‍රදානය කර ඇතැයි සලකනු ලැබිය යුතු ය.

108. (1) අවස්ථාවෝචිත පරිදි, මණ්ඩලයේ යම් සාමාජිකයකු, නිලධරයකු හෝ සේවකයකු විසින් මේ පනත යටතේ හෝ මේ පනතේ විධිවිධාන යටතේ සාදන ලද යම් නීතියක් හෝ නියෝගයක් යටතේ හෝ මණ්ඩලයේ විධානය මත සද්භාවයෙන් කරන ලද හෝ කරන ලදැයි කියනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන්, ඒ සාමාජිකයාට, නිලධරයාට හෝ සේවකයාට විරුද්ධව කිසිම සිවිල් හෝ අපරාධ නඩුවක් පවරනු නොලැබිය යුතු ය. — මණ්ඩලයේ සාමාජිකයන් ආරක්ෂා කිරීම.

(2) මණ්ඩලය විසින් හෝ මණ්ඩලයට විරුද්ධව හෝ ඉදිරිපත් කරන ලද යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී මණ්ඩලය විසින් දරන ලද වියදම් කිසිවක් හෝ යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී මණ්ඩලය විසින් ගෙවන ලද හෝ මණ්ඩලයට ලැබුණු නඩු ගාස්තු කිසිවක් මණ්ඩලයේ අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

(3) මේ පනත යටතේ හෝ මණ්ඩලයේ විධානය මත, (1) වන උපවගන්තියෙහි සඳහන් එවැනි යම් තැනැත්තකු විසින් කරන ලද හෝ කරන ලදැයි කියනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන්, යම් අධිකරණයක් ඉදිරියෙහි ඒ තැනැත්තාට විරුද්ධව ඉදිරිපත් කරන ලද යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී ඒ තැනැත්තා විසින් දරන ලද වියදම් කිසිවක්, ඒ ක්‍රියාව සද්භාවයෙන් කරන ලදැයි අධිකරණය විසින් තීරණය කරනු ලබන්නේ නම්, ඒ වියදම් ඒ තැනැත්තා විසින් ඒ සිවිල් හෝ අපරාධ නඩුවේ දී අය කර ගෙන ඇත්නම් මිස, මණ්ඩලයේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

109. මණ්ඩලයට විරුද්ධව ඉදිරිපත් කරන ලද යම් නඩුවක දී මණ්ඩලයේ සාමාජිකයකුට විරුද්ධව පෞද්ගලිකව හෝ ඔහුගේ දේපළට විරුද්ධව හෝ කිසිම රිට් ආඥාවක් නිකුත් කරනු නොලැබිය යුතු ය. — පෞද්ගලිකව හෝ දේපළ වලට විරුද්ධව හෝ කිසිම රිට් ආඥාවක් නිකුත් නොකළ යුතු බව.

110. මණ්ඩලය, අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ පනතේ විධිවිධාන ඒ අනුව තේරුම් ගනු ලැබිය යුතු ය. — මණ්ඩලය උපලේඛනගත ආයතනයක් විය යුතු බව.

111. මණ්ඩලයේ සියලු නිලධරයන් හා සේවකයන්, දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව හා එහි කාර්ය සඳහා රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු ය. — මණ්ඩලයේ නිලධරයන් හා සේවකයන් රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු බව.

නියෝග.

**112.** (1) නියමිත යයි මේ පනතින් නියම කර ඇති සියලු කාරණා සම්බන්ධයෙන් හෝ නියෝග සෑදීමට මේ පනත යටතේ නියම කර ඇති හෝ බලය දී ඇති සියලු කාරණා සම්බන්ධයෙන්, අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) අමාත්‍යවරයා විසින් සාදන ලද සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු අතර, ඒ නියෝගය එසේ පළ කරන ලද දිනයෙහි හෝ එහි නිශ්චිතව සඳහන් යම් පසු දිනයක හෝ ක්‍රියාත්මක විය යුතු ය.

(3) අමාත්‍යවරයා විසින් සාදන ලද සෑම නියෝගයක් ම, එහි ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබීමෙන් පසු හැකි පහසු ඉක්මණින් අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. පාර්ලිමේන්තුව විසින් එසේ අනුමත කරනු නොලැබූ සෑම නියෝගයක් ම එහි අනනුමතයේ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු නමුත් ඒ යටතේ කලින් කරන ලද කිසිවකට ඉන් හානියක් නොවිය යුතු ය.

(4) යම් නියෝගයක් එසේ පරිච්ඡින්න කරන ලදැයි සලකනු ලබන දිනය පිළිබඳ නිවේදනය, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු ය.

ඉවත් කිරීම් හා අත්හැරීම්.

**113.** (1) 1962 අංක 25 දරන රක්ෂණ පාලන පනත මෙයින් ඉවත් කරනු ලැබේ.

(2) එසේ කී පනත ඉවත් කිරීම නොතකා --

(අ) ඉවත් කරන ලද පනත යටතේ යම් පන්තියක රක්ෂණ ව්‍යාපාරයක් කර ගෙන යාමට ලියාපදිංචි කර ඇති සෑම සමාගමක් ම, ඒ පන්තියේ රක්ෂණ ව්‍යාපාරය කර ගෙන යාමට මේ පනතේ විධිවිධාන යටතේ ලියාපදිංචි කර ඇති සමාගමක් ලෙස සලකනු ලැබිය යුතු ය ;

(ආ) ඉවත් කරන ලද පනත යටතේ රක්ෂණ තැරැව්කරුවකු වශයෙන් ව්‍යාපාරය කර ගෙන යාමට ලියාපදිංචි කර ඇති සෑම තැනැත්තකු ම, රක්ෂණ තැරැව්කරුවකු වශයෙන් මේ පනතේ විධිවිධාන යටතේ ලියාපදිංචි කර ඇති තැනැත්තකු ලෙස සලකනු ලැබිය යුතු ය ;

(ඈ) නියමිත දිනයේ දී වලංගුව බලපවත්නා, ඉවත් කරන ලද පනත යටතේ සාදන ලද සෑම නියෝගයක් ම, හෝ රීතියක් ම සහ නිකුත් කරන ලද සෑම විධානයක් ම, ඒ නියෝගය, රීතිය හෝ විධානය මේ පනතේ විධිවිධාන හා අනනුකූල නොවන තාක් දුරට මේ පනත යටතේ සාදන ලද නියෝගයක් හෝ රීතියක් නැතහොත් නිකුත් කරන ලද විධානයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, මේ පනත යටතේ සාදනු ලබන නියෝග හෝ රීති හෝ විධාන මගින් සංශෝධනය කිරීම හෝ පරිච්ඡින්න කිරීම කළ හැකි ය ;

(ඉ) ඉවත් කරන ලද පනත යටතේ රක්ෂණ පාලකවරයා විසින් හෝ ඔහුට විරුද්ධව පවරා ඇති හා නියමිත දිනයේ දී මුල් අවස්ථා වූ හෝ අභියාචන වූ හෝ යම් අධිකරණයක විනිශ්චයට භාජනයව පවත්නා සෑම නඩුවක් ම, නඩු පැවරීමක් ම හෝ නඩු කටයුත්තක් ම, මණ්ඩලය විසින් හෝ මණ්ඩලයට විරුද්ධව පවරන ලද නඩුවක්, නඩු පැවරීමක් හෝ නඩු කටයුත්තක් ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ සෑම නඩුවක්, නඩු පැවරීමක් හෝ නඩු කටයුත්තක් ම අවසානය තෙක් කර ගෙන ගොස් ඒ අනුව ක්‍රියාවෙහි යොදවනු ලැබිය හැකි ය.

(ඊ) යම් නඩුවක දී, කාරණයක දී, නඩු කටයුත්තක දී හෝ දෙයක දී යම් අධිකරණයක් හෝ විනිශ්චයාධිකාරයක් හෝ වෙනත් මණ්ඩලයක් විසින් රක්ෂණ පාලකවරයාගේ වාසියට හෝ ඔහුට විරුද්ධව ඇතුළත් කරන ලද හෝ කරන ලද සහ නියමිත දිනයේ දී ඉටුකර නොමැතිව පවත්නා යම් තීන්දු ප්‍රකාශයක්, ආඥාවක් හෝ තීරණයක් නියමිත දිනයේ සිට බලපැවැත්වෙන පරිදි, මණ්ඩලයේ වාසියට හෝ මණ්ඩලයට විරුද්ධව ඇතුළත් කරන ලද හෝ කරන ලද තීන්දු ප්‍රකාශයක්, ආඥාවක් හෝ තීරණයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

(3) (2) වන උපවගන්තිය යටතේ රක්ෂණකරුවකු ලෙස සලකනු ලබන යම් රක්ෂණකරුවකු, ජීවිත රක්ෂණ ව්‍යාපාරය කිරීම පිණිස ඉවත් කරන ලද පනත යටතේ ලියාපදිංචි කර ඇති හා ඒ ලියාපදිංචි කරන ලද දිනයේ සිට ඒ ව්‍යාපාරය අවුරුදු තුනක කාලයක් නියමිත දිනය වන විට සම්පූර්ණ කර නොමැති අවස්ථාවක, ඒ ව්‍යාපාරය සම්බන්ධයෙන් රක්ෂණකරුගේ වත්කම්

හා බැරකම් පිළිබඳ තක්සේරු කිරීමක ද ඇතුළුව, ඒ ව්‍යාපාරයේ මූල්‍ය තත්ත්වය පිළිබඳව අවුරුදු තුනක කාලයක් සම්පූර්ණ වන තෙක් යටත් පිරිසෙයින් අවුරුද්දකට එක් වරක් හෝ රක්ෂණකරු විසින්, ජීව ගණකයකු මගින් විමර්ශනයක් කරවීමට සලස්වනු ලැබිය යුතු ය. රක්ෂණකරුගේ, රක්ෂණ ඔප්පු දරන්නාගේ වර්තමාන හා අනිශ්චිත බැරකම් සපුරාලීමට සංචිත ප්‍රමාණවත් වන්නේ ද යන වග, ජීව ගණක විසින් සහතික කරනු ලැබිය යුතු ය.

අර්ථ නිරූපණය.

114. (1) මේ පනතෙහි, පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, -

"ජීව ගණක" යන්නෙන් -

(අ) එංගලන්තයේ ජීව ගණක ආයතනයේ හෝ ස්කොට්ලන්තයේ ජීව ගණකයන්ගේ පීඨයේ අධි සාමාජිකයකු හෝ මණ්ඩලය විසින් අනුමත කරන ලද වෙනත් යම් වෘත්තීය ජීව ගණක ආයතනයක අධි සාමාජිකයකු ; හෝ

(ආ) අදාළ ජීව ගණක කාරණාවල දී අවුරුදු දහයකට නොඅඩු පසු සුදුසුකම් පළපුරුද්දක් ඇති, (අ) ඡේදයෙහි සඳහන් කවර හෝ වෘත්තිය ජීව ගණක ආයතනයක ආශ්‍රිත සාමාජිකයකු,

අදහස් වේ ;

" තැරැව්කරු" යන්නෙන්, මේ පනතේ විධිවිධාන යටතේ ලියාපදිංචි කර ඇත්තා වූ ද, තැරැව් ගාස්තුවක් හෝ කොමිස් මුදලක් මගින් ගෙවීමක් අපේක්ෂාවෙන්, රක්ෂණකරුවකු හෝ ප්‍රතිරක්ෂණකරුවකු සමග රක්ෂණකරුවකු, රක්ෂණ ඔප්පු දරන්නකු හෝ රක්ෂණය කිරීම හෝ ප්‍රතිරක්ෂණය කිරීම සඳහා වූ යෝජකයකු සඳහා හා වෙනුවෙන් රක්ෂණ ව්‍යාපාරය කර ගෙන යාම පිණිස අතරමැදියකු වශයෙන් ක්‍රියා කරනු ලබන්නා වූ ද, රක්ෂණ තැරැව්කරුවකු අදහස් වේ ;

"සහතික කරන ලද" යන්න, එය රක්ෂණකරුවකු විසින් හෝ වෙනුවෙන් සපයන ලෙස නියම කර ඇති යම් ප්‍රකාශයක්, ගිණුමක් හෝ වාර වාර්තාවක් නැතහොත් ලේඛනයක යම් පිටපතක් හෝ එහි පරිවර්තනයක් සම්බන්ධයෙන්

යෙදෙන විට, එවැනි ප්‍රකාශයක්, ගිණුමක් හෝ වාර්තාවක් සැබෑ හා නිවැරදි බවට හෝ ඒ පිටපත සත්‍ය පිටපතක් බව හෝ පරිවර්තනය නිවැරදි පරිවර්තනයක් බවට, අවස්ථාවෝචිත පරිදි, රක්ෂණකරු හෝ තක් කාර්යය සඳහා බලය දෙනු ලැබූ රක්ෂණකරුගේ ප්‍රධාන නිලධරයා හෝ විසින් පිටසන් කර ඇති සහතිකයක් ඉන් අදහස් වේ ;

"දරන ලද එහෙත් වාර්තා නොකරන ලද හිමිකම් පෑම්" යන්නෙන්, මුදල් වර්ෂයක් තුළ දී රක්ෂණකරුවකු විසින් නිකුත් කරන ලද යම් රක්ෂණ ඔප්පුවක් හෝ ඔප්පු යටතේ දරන ලද එහෙත් දැනුම් දී නොමැති හිමිකම් පෑම් අදහස් වේ ;

"ගෙවීම් හිඟ තබා ඇති හිමිකම් පෑම්" යන්නෙන්, රක්ෂිත විසින් දැනුම් දී ඇති හා රක්ෂණ ඔප්පුවක් හෝ ඔප්පු යටතේ රක්ෂණකරු වගකිව යුතු වන එහෙත් බේරුම් කර නොමැති සියලු හිමිකම් පෑම් අදහස් වේ ;

"රක්ෂණ ව්‍යාපාර පන්ති" යන්නෙන්, සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය හා දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරය අදහස් වේ ;

"ආණ්ඩුව සහතික වන සුරැකුම් පත්" යන්නට, ණය මුදල මත වූ පොළිය ද සමග ණය මුදල ආපසු ගෙවීම, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් සහතික වන ලද, ඒ ණය මුදල සම්බන්ධයෙන් වූ යම් ඇපයක් ඇතුළත් වේ ;

"ආණ්ඩුවේ සුරැකුම් පත්" යන්නෙන්, නියමිත දිනයට පෙර හෝ පසුව හෝ ලබා ගන්නා ලද යම් ණය මුදලක් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනුවෙන් නිකුත් කරන ලද (භාණ්ඩාගාර බිල් පත් ද ඇතුළුව) පොරොන්දු නෝට්ටු, ස්කන්ධ, භාරක බැඳුම්කර හා වෙනත් යම් සුරැකුම්පත් අදහස් වන නමුත්, ඊට මුදල් නෝට්ටු ඇතුළත් නොවේ ;

"දළ වාරිකය" යන්නෙන්, වට්ටම්, ආපසු ගෙවීම් හා ප්‍රතිදාන අඩු කිරීමෙන් පසුව එහෙත් ඉඩ දෙන ලද ප්‍රතිරක්ෂණ සඳහා රක්ෂණකරුවකු විසින් ගෙවන ලද හෝ ගෙවිය යුතු වාරික කිසිවක් අඩු කිරීමට පෙර වූ වාරිකය අදහස් වේ ;

"රක්ෂණ නියෝජිත" යන්නෙන්, මේ පනතේ විධිවිධාන යටතේ රක්ෂණකරුවකු හෝ තැරැව්කරුවකු සමග රක්ෂණ නියෝජිතයකු වශයෙන් ලියාපදිංචි කර ඇති හා කොමිස් මුදලක් සැලකිල්ලට ගෙන, අවස්ථාවෝචිත පරිදි, ඒ රක්ෂණකරු හෝ තැරැව්කරු සඳහා රක්ෂණ ව්‍යාපාර අයැද සිටින හෝ ලබා ගන්නා පුද්ගලයකු අදහස් වේ ;

"රක්ෂණ ව්‍යාපාරය" යන්නෙන්, –

(අ) දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරය, එනම්, මරණය හෝ මනුෂ්‍ය ජීවිතයට බලපාන යම් අවිනිශ්චිත සිද්ධියක් හෝ සිදුවූ විට මුදල් ගෙවීම සහතික කෙරෙන ගිවිසුම් ද ඇතුළුව, මනුෂ්‍ය ජීවිත පිළිබඳ රක්ෂණ ගිවිසුම්වලට සහ මනුෂ්‍ය ජීවිතය මත රඳා සිටිමින් යම් කාලපරිච්ඡේදයක් සඳහා වාරික ගෙවීමට යටත් ගිවිසුම්වලට එළඹීමේ හෝ එවැනි ගිවිසුම් පවත්වා ගෙන යාමේ හෝ ව්‍යාපාරය අදහස් වන අතර, එවැනි ගිවිසුම්වලින් පහත දැක්වෙන අනුපන්ති සමන්විත වන ලෙස සහ එවැනි ගිවිසුම්වලට ඒ අනුපන්ති ඇතුළත් වන ලෙස සලකනු ලැබිය යුතු ය :–

(i) ජීවිත රක්ෂණය - මනුෂ්‍ය ජීවිතය මත රඳා පවත්නා රක්ෂණ ගිවිසුම් ;

(ii) සම්බන්ධිත දීර්ඝ කාලීන - සුචියකට අනුව හෝ කවර හෝ විස්තරයකට අයත් වත්කම්වල වටිනාකම නැතහොත් ඒ වත්කම්වලින් ලැබෙන ආදායම අනුව, සම්පූර්ණ ප්‍රතිලාභ හෝ ප්‍රතිලාභ වලින් කොටසක් හෝ යම් ගිවිසුම් යටතේ නිශ්චය කරනු ලැබේ ද එවැනි ගිවිසුම් ;

(iii) වාර්ෂික - මනුෂ්‍ය ජීවිතය මත රඳා පිහිටා වාර්ෂික ප්‍රදානය කිරීම සඳහා වූ ගිවිසුම් ;

(iv) අබලතා සහ බහුවිද හානිපූරණය සඳහා ද, හදිසි අනතුරු සහ රෝගී භාවය සඳහා ද ප්‍රතිලාභ ප්‍රදානය කරනු ලබන බව යම් ගිවිසුමක නිශ්චිතව සඳහන් කොට ඇත්නම්, එවැනි ගිවිසුම් ; එහෙත් (i), (ii), (iii), (v)

සහ (vi) අනුජේදවල ඇතුළත් යම් වර්ගයකට ප්‍රධාන වශයෙන් හෝ සම්පූර්ණයෙන් හෝ අයත් වන රක්ෂණ ව්‍යාපාරික කටයුතු එයට ඇතුළත් නොවේ ;

(v) නිත්‍ය සෞඛ්‍ය :- හදිසි අනතුරුවලින් හෝ රෝගී භාවයෙන් හෝ ඇතිවන අබලතාව සඳහා, අවුරුදු පහකට වැඩි කාලයක් බලාත්මක වන්නා වූ ද, රක්ෂණකරු විසින් අවලංගු කරනු නොලැබිය හැකි වූ ද, යම් නිශ්චිත ප්‍රතිලාභ සඳහා විධිවිධාන සලස්වන රක්ෂණ ගිවිසුම් ;

(vi) ප්‍රාග්ධන නිදහස් කිරීමේ ගිවිසුම් ; සහ

(vii) විශ්‍රාම රක්ෂණ ඔප්පු - පුද්ගලයන් සඳහා විශ්‍රාම පූර්ව සහ පශ්චාත් විශ්‍රාම ප්‍රතිලාභ සඳහා විධිවිධාන සලස්වන රක්ෂණ ගිවිසුම් ;

(ආ) "දීර්ඝ කාලීන ව්‍යාපාර" යන්නෙහි අර්ථ කථනයට ඇතුළත් නොවන්නා වූ ද, පහත දැක්වෙන අනු පන්ති වලින් සමන්විත වන ලෙස හා ඒ අනු පන්ති ඇතුළත් වන ලෙස සලකනු ලබන්නා වූ ද, රක්ෂණ ව්‍යාපාර අදහස් කෙරෙන සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය :–

(i) "සමුද්‍රීය, ගුවන් හෝ සංක්‍රමණ රක්ෂණ ඔප්පුව" යන්නෙන්, පහත දැක්වෙන ආකාරයේ රක්ෂණ ඔප්පුව අදහස් වේ :–

(අ) යාත්‍රා හෝ, යාත්‍රාවල නැතහොත් ගුවන් යානාවල යන්ත්‍රෝපකරණ, ආම්පන්න හෝ ගෘහභාණ්ඩ හෝ උපකරණ සඳහා වූ රක්ෂණ ඔප්පුවක් ;

(ආ) යාත්‍රාවල පටවා ඇති භාණ්ඩ, වෙළෙඳ ද්‍රව්‍ය නැතහොත් කවර හෝ විස්තරයකට අයත් දේපළ සඳහා වූ රක්ෂණ ඔප්පුවක් ;

(ඇ) යාත්‍රාවල ඇති නැව් බඩු සඳහා වූ හෝ, යාත්‍රාවලට අයත් හෝ ඒවාට අදාළ හෝ වෙනත් යම් සම්බන්ධතාවක් සඳහා වූ රක්ෂණ ඔප්පුවක් ;

(ඈ) තෘතීය පාර්ශ්ව අවදානම් ද ඇතුළුව, යාත්‍රා පාවිච්චියේ දී නැතහොත් ඒ සම්බන්ධයෙන් උද්ගත වන අලාභ වලට එරෙහිව වූ රක්ෂණ ඔප්පුවක් ;

(ඉ) සංක්‍රමණය ආරම්භයේ සිට රක්ෂණයෙන් ආවරණය කරන ලද අවසාන ගමනාන්තය දක්වා රක්ෂණය කරන ලද සංක්‍රමණයට ආනුෂංගික අවදානම් ද ඇතුළුව, (සංතරණය මුහුදෙන් වුව ද, අභ්‍යන්තරික ජල මාර්ගයකින් වුව ද, ගොඩබිමෙන් වුව ද, ගුවනින් වුව ද, කොටසක් ඉන් එක් ආකාරයකින් සහ කොටසක් ඉන් යම් වෙනත් ආකාරයකින් වුව ද) සංතරණ අවදානම් වලට එරෙහිව රක්ෂණය මගින් ආවරණය කිරීමේ ගිවිසුම්; එහෙත් මෝටර් වාහන රක්ෂණ ව්‍යාපාරය සම්බන්ධයෙන් වූ අවදානම් එයට ඇතුළත් නොවේ ; නැතහොත්

(ඊ) මේ අර්ථ නිරූපණයේ ඉහත දැක්වුණු ඡේදවල සඳහන් එවැනි යම් ව්‍යාපාරයකට සම්බන්ධ හෝ ආනුෂංගික, සිරිත් පරිදි භාර ගනු ලැබූ රක්ෂණය මගින් ආවරණය කරන ලද අවදානම් කිසිවකට එරෙහිව වූ ගිවිසුම් ;

(ii) ගිනි රක්ෂණ ව්‍යාපාරය- එනම්, වෙනත් යම් පන්තියක රක්ෂණ ව්‍යාපාරයකට ආනුෂංගිකව නොවන, ගිනි ගැනීම්වලට එරෙහිව ගිනි රක්ෂණ ඔප්පුවලින් රක්ෂණය කරනු ලැබූ අවදානම්වලට සිරිත් පරිදි

ඇතුළත් කරනු ලබන, ගින්නෙන් හෝ වෙනත් සිදුවීම් නිසා හෝ සිදුවන අලාභවලට එරෙහිව වූ හෝ ඊට ආනුෂංගික වූ රක්ෂණ ව්‍යාපාර ;

(iii) මෝටර් වාහන රක්ෂණ ව්‍යාපාරය - එනම්, තෘතිය පාර්ශ්ව අවදානම් ද ඇතුළුව, මෝටර් වාහන නැතිවීමට හෝ මෝටර් වාහන පාවිච්චියේ දී නැතහොත් ඒ සම්බන්ධයෙන් උද්ගත වන අලාභවලට එරෙහිව වූ රක්ෂණ ගිවිසුම්වලට එළඹීමේ ව්‍යාපාරය ;

(iv) සේවා යෝජකයන්ගේ වගකීම පිළිබඳ රක්ෂණ ව්‍යාපාරය - එනම්, සේවා යෝජකයන්ගේ සේවා නියුක්තියෙහි යොදවා සිටින කම්කරුවන්ට වන්දි හෝ අලාභ හෝ ගෙවීම් සම්බන්ධයෙන් සේවා යෝජකයන්ගේ වගකීමට එරෙහිව සේවා යෝජකයන් රක්ෂණ කෙරෙන ඔප්පු නිකුත් කිරීම හෝ ඒ ඔප්පු යටතේ වගකීම භාර ගැනීම ;

(v) විවිධ රක්ෂණ ව්‍යාපාරය, පෞද්ගලික හදිසි අනතුරු රක්ෂණය, විශ්වාසය සහතික කිරීමේ රක්ෂණය, සොරකම් කිරීම්වලට එරෙහි රක්ෂණය, මාර්ගස්ථ මුදල් පිළිබඳ රක්ෂණය, සේප්පුවෙහි ඇති මුදල් පිළිබඳ රක්ෂණය, සියලු අවදානම්වලට එරෙහිව කොන්ත්‍රාත්කරුවන් පිළිබඳ රක්ෂණය, සියලු අවදානම්වලට එරෙහිව ඉදි කිරීම් පිළිබඳ රක්ෂණය, විද්‍යුත්/ පරිගණක රක්ෂණය, බොයිලේරු රක්ෂණය සහ යන්ත්‍රෝපකරණ අක්‍රිය වීම පිළිබඳ රක්ෂණය යන රක්ෂණ ව්‍යාපාර එයට ඇතුළත් වන නමුත් (i), (ii), (iii), සහ (iv) වන අනුඡේදවල ඇතුළත් වන්නා වූ ද, දීර්ඝ කාලීන ස්වභාවයක කොන්ත්‍රාත් හා සම්බන්ධිත "දීර්ඝ කාලීන ව්‍යාපාර" යන්නෙහි අර්ථ කථනයට ඇතුළත් වන්නා වූ ද, යම් වර්ගයකට හෝ වර්ගවලට ප්‍රධාන වශයෙන් හෝ සම්පූර්ණයෙන් ම හෝ අයත් වන්නා වූ ද රක්ෂණ ව්‍යාපාරය ඇතුළත් නොවේ ;

"රක්ෂණකරුවකු" යන්නෙන්, මේ පනතේ විධිවිධාන යටතේ ශ්‍රී ලංකාවෙහි රක්ෂණ ව්‍යාපාරය කර ගෙන යාමට ලියාපදිංචි කරන ලද සමාගමක් අදහස් වන අතර, 113 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ ලියාපදිංචි කරන ලදැයි සලකනු ලබන සමාගමක් ද ඊට ඇතුළත් වේ ;

"බලපත්‍රලත් වාණිජ බැංකුව" යන්නෙන්, 1988 අංක 30 දරන බැංකු පනතේ අර්ථානුකූල වූ බලපත්‍රලත් වාණිජ බැංකුවක් අදහස් වේ ;

" පළාත් පාලන ආයතන ඇපය"යන්නෙන්, තත් කාලයේ බලපවත්නා නීතියට අනුකූලව, ශ්‍රී ලංකාවේ යම් පළාත් පාලන ආයතනයක් විසින් නිකුත් කරනු ලබන යම් ඇපයක් අදහස් වේ ;

"ගෙවීම හිග තබා ඇති ශුද්ධ හිමිකම් පෑම්" යන්නෙන්, රක්ෂිත විසින් දැනුම් දී ඇති සහ රක්ෂණ ඔප්පුවක් හෝ ඔප්පු යටතේ රක්ෂණකරු වගකිව යුතු වන එහෙත් බේරුම් කර නොමැති, හිමිකම් පෑම් වලින් ප්‍රතිරක්ෂණ අය කර ගැනීම් අඩු කිරීමෙන් පසුව වූ සියලු හිමිකම් පෑම් අදහස් වේ ;

"ශුද්ධ වාරිකය" යන්නෙන්, දළ වාරිකයෙන්, ඉඩ දෙන ලද ප්‍රතිරක්ෂණය සඳහා රක්ෂණකරු විසින් ගෙවන ලද හෝ ගෙවිය යුතු යම් වාරිකයක් අඩු කිරීමෙන් පසුව, ඒ දළ වාරිකයෙන් ඉතිරි මුදල අදහස් වේ ;

"ශුද්ධ උපයනු නොලැබූ වාරිකය" යන්නෙන්, රක්ෂණකරුවකු ගේ යම් මුදල් වර්ෂයක් අවසානයේ දී, ඒ මුදල් වර්ෂය අවසානයට පෙර ඇතුළත් වන ලද රක්ෂණ ගිවිසුමක් යටතේ, ඒ මුදල් වර්ෂය අවසන් වීමෙන් පසුව, ඒ රක්ෂණකරු විසින් දැරීමට ඇති අවදානම් සම්බන්ධයෙන් වූ වාරිකවලින් වෙන් කර ඇති මුදල අදහස් වේ ;

"සහභාගි රක්ෂණ ඔප්පු" යන්නෙන්, රක්ෂණකරුවකු විසින් නිකුත් කරන ලද්දා වූ ද, රක්ෂණ ඔප්පු වලින් උද්ගත වන අතිරික්තයේ කොටසකට නිරන්තරයෙන් ම හිමිකම් ලබන්නා වූ ද යම් රක්ෂණ ඔප්පු අදහස් වේ ;

"රක්ෂණ ඔප්පුව" යන්නට,

(අ) එය, දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරයක් හා සම්බන්ධව යෙදෙන විට, මනුෂ්‍ය ජීවිත මත වාර්ෂිකයක් ගෙවීම සඳහා වූ ගිවිසුමක් දැක්වෙන සාධන පත්‍රයක් ඇතුළත් වේ ;

(ආ) එය, බැඳුම්කර ආයෝජන ව්‍යාපාරයක් හා සම්බන්ධව යෙදෙන විට, රක්ෂණකරු සමග වූ ගිවිසුමක් දැක්වෙන බැඳුම්කරයක්, සහතිකයක්, ලදුපතක් හෝ වෙනත් සාධන පත්‍රයක් ඇතුළත් වේ ; තව ද

(ඇ) එය, වෙනත් රක්ෂණ ව්‍යාපාර පන්ති හා සම්බන්ධව යෙදෙන විට, දැනටමත් උපචිත වී ඇති පවත්නා වගකීමක් තත් කාලයෙහි ඇත්තේ නැතහොත් යම් වගකීමක් උපචිත විය හැකි වන්නේ යම් සාධන පත්‍රයක් යටතේ ද ඒ සාධන පත්‍රය ඇතුළත් වේ ;

"රක්ෂණ ඔප්පු දරන්නා" යන්නෙන්, රක්ෂණකරු සමග ගිවිසුම අත් කර ගැනීම අරහයා තත් කාලයෙහි රක්ෂණ ඔප්පුවෙහි නීත්‍යනුකූල දරන්නා වන තැනැත්තා අදහස් වේ ;

"සමාගම් රෙජිස්ට්‍රාර්වරයා" යන්නෙන්, 1982 අංක 17 දරන සමාගම් පනතේ 423 වන වගන්තිය යටතේ සමාගම් රෙජිස්ට්‍රාර්වරයා වශයෙන් ක්‍රියා කිරීමට නමින් හෝ ධුරයෙන් පත් කරන ලද තැනැත්තා අදහස් වන අතර, ඒ වගන්තිය යටතේ පත් කරන ලද යම් නියෝජ්‍ය ලේකම්වරයකු හෝ සහකාර ලේකම්වරයකු ඊට ඇතුළත් වේ ;

"ප්‍රතිරක්ෂණය" යන්නෙන්, යම් රක්ෂණ ගිවිසුමක් හෝ රක්ෂණ ඔප්පුවක් යටතේ දරන ලද රක්ෂණකරුවකුගේ වගකීම, ප්‍රතිරක්ෂණකරුවකු වෙත පැවරීම අදහස් වේ ;

"ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව" යන්නෙන්, 1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතින් පිහිටුවන ලද ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව අදහස් වේ ;

"තාක්ෂණික සංචිතය" යන්නට, කල් තැබූ අත්කර ගැනීමේ වියදම් කිසිවක් අඩුකොට, ශුද්ධ උපයනු නොලැබූ වාරිකය, ඉකුත් වී නොමැති අවදානම් සඳහා සලකන ලද ප්‍රතිපාදන, ගෙවීම් ශිඝ තබා ඇති ශුද්ධ හිමිකම් පෑම්, දරන ලද එහෙත් වාර්තා නොකරන ලද සංචිත හිමිකම් පෑම්, සහ අනිශ්චිත සංචිත කිසිවක් ඇතුළත් වේ ; සහ

"ඉකුත් වී නොමැති අවදානම්" යන්නෙන්, රක්ෂණකරුවකුගේ යම් මුදල් වර්ෂයක් අවසානයේ දී, ඒ මුදල් වර්ෂය අවසානයට පෙර ඇතුළත් වන ලද රක්ෂණ ගිවිසුමක් යටතේ, ඒ මුදල් වර්ෂය අවසන් වීමෙන් පසුව, ඒ රක්ෂණකරු විසින් දැරීමට ඇති අවදානම් සම්බන්ධයෙන් (ශුද්ධ උපයනු නොලැබූ වාරිකවලට අමතරව) වෙන් කර ඇති මුදල අදහස් වේ ;

(2) යම් තැනැත්තකු විසින් -

(අ) තත්කාලයෙහි ශ්‍රී ලංකාවේ සිටින තැනැත්තකුට හෝ තැනැත්තකු සමග යම් පන්තියක රක්ෂණ ව්‍යාපාර ඔප්පුවක් නිකුත් කළහොත් හෝ ඒ තැනැත්තකු සමග රක්ෂණ ගිවිසුමක් යටතේ වගකීම භාරගතහොත් ; හෝ

(ආ) වාචිකව වුව ද, ලිඛිතව වුව ද ඒ යම් තැනැත්තකුට යම් රක්ෂණ ඔප්පුවක් නිකුත් කිරීමට හෝ රක්ෂණ ගිවිසුමක් යටතේ වගකීම භාර ගැනීමට, කෙළින් ම ඒ යම් තැනැත්තකු වෙත හෝ යම් දැන්වීමක්, පොතක්, පත්‍රිකාවක් හෝ වෙනත් කවර හෝ ලේඛනයක් පළ කිරීමෙන්, සම්ප්‍රේෂණය කිරීමෙන් හෝ සංසරණය කිරීමෙන් පොදුවේ යම් තැනැත්තකු වෙත හෝ අර්පණය කළහොත් ; හෝ

(ඇ) ඉහත කී පරිදි එවැනි යම් අර්පණයක් කිරීම සඳහා වෙනත් යම් තැනැත්තකුට, යම් පාරිශ්‍රමිකයක් ගෙවනු ලැබුව ද නොලැබුව ද නැතහොත් පාරිශ්‍රමිකයක් ගෙවිය යුතු ව වුව ද නො එසේව වුව ද සේවයෙහි නියුක්ත කරනු ලැබුවහොත්, ඒ යොදවනු ලැබුවහොත් හෝ වෙනත් යම් ආකාරයකින් වෙනත් යම් තැනැත්තා ලවා සිදු කළහොත් හෝ ඔහු දිරි ගන්වනු ලැබුවහොත්,

ඒ තැනැත්තා, මේ පනතේ කාර්ය සඳහා ඒ පන්තියේ රක්ෂණ ව්‍යාපාරය කර ගෙන යන බව හෝ රක්ෂණ ව්‍යාපාර ගනුදෙනු කර ගෙන යන බව සලකනු ලැබිය යුතු ය.

**115.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

උපලේඛනය [4(3) වන උපවගන්තිය]

**මණ්ඩලයේ පත් කළ සාමාජිකයන්ට අදාළ විධිවිධාන**

1. යම් තැනැත්තකු-

(අ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු, පළාත් සභා මන්ත්‍රීවරයකු හෝ යම් පළාත් පාලන ආයතනයක සභිකයකු වේ නම්, හෝ එවැනි මන්ත්‍රීවරයකු හෝ සභිකයකු බවට පත් වන්නේ නම් ; හෝ

(ආ) ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවේ නම් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසියකුව සිටීම අවසන් වන්නේ නම් ; හෝ

(ඇ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක බලපවත්නා යම් නීතියක් යටතේ සිහිවිකල් තැනැත්තකු බවට තීරණය කරනු ලැබ සිටී නම් හෝ ප්‍රකාශයට පත් කරනු ලැබ සිටී නම් ; හෝ

(ඈ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක යම් අධිකරණයක් විසින් නියම කරන ලද සිර දඬුවමක් විඳිමින් සිටී නම් හෝ විඳ ඇත්නම්

ඒ තැනැත්තා මණ්ඩලයේ පත් කළ සාමාජිකයකු වශයෙන් පත් කරනු ලැබීමට හෝ මණ්ඩලයේ පත් කළ සාමාජිකයකු වශයෙන් දිගට ම කටයුතු කරගෙන යාමට නුසුදුස්සකු වන්නේ ය.

2. මණ්ඩලයේ සෑම පත් කළ සාමාජිකයකු ම, ඔහු මියයාමෙන්, ධුරයෙන් ඉල්ලා අස්වීමෙන් හෝ ඉවත් කරනු ලැබීමෙන් කලින් ධුරය හිස් කරන්නේ නම් මිස, තමා පත් කරන ලද දිනයේ සිට අවුරුදු තුනක කාලයක් ධුරය දැරිය යුතු අතර, ඔහු ධුරයෙන් ඉවත් කරනු ලැබ ඇත්නම් මිස, නැවත පත් කරනු ලැබීමට සුදුස්සකු වන්නේ ය :

එසේ වුවද, මියයාමෙන්, ධුරයෙන් ඉල්ලා අස්වීමෙන් හෝ ඉවත් කරනු ලැබීමෙන් ධුරය හිස් කරන සාමාජිකයකු වෙනුවට පත් කරන ලද සාමාජිකයකු, ඔහු අනුප්‍රාප්ත වන සාමාජිකයාගේ ධුර කාලයෙන් ඉකුත් නොවී ඇති ධුර කාලය සඳහා ධුරය දැරිය යුතු ය.

3. ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයන් මගින්, අමාත්‍යවරයා විසින්, මණ්ඩලයේ පත් කළ සාමාජිකයකු ස්වකීය කාර්ය ඉටු කිරීමෙහි ලා විෂමාචාරය නැතහොත් වංචා කිරීම හෝ වංක භාවය හා සම්බන්ධ වරදක් පිළිබඳව ඒ සාමාජිකයා වරදකරු කරනු ලැබ ඇති අවස්ථාවක, ඒ සාමාජිකයා ධුරයෙන් ඉවත් කරනු ලැබිය යුතු ය. ධුරයෙන් ඉවත් කරනු ලැබූ පත් කළ සාමාජිකයකු, ඒ නියමය ගැසට් පත්‍රයෙහි පළ කරන ලද දිනයෙහි හා එදිනට පසුව ධුරය දැරීම අවසන් විය යුතු ය.

4. මණ්ඩලයේ පත් කළ සාමාජිකයකු විසින්, ධුරයෙන් ඉල්ලා අස්වන බවට අමාත්‍යවරයා අමතා යවනු ලබන ලිපියක් මගින් ස්වකීය ධුරයෙන් කවර හෝ විටක ඉල්ලා අස්විය හැකි අතර, ඒ ඉල්ලා අස්වීම අමාත්‍යවරයා විසින් ලිඛිතව භාර ගනු ලැබීමේ දී බලාත්මක විය යුතු ය.

5. මියයාමෙන්, ධුරයෙන් ඉල්ලා අස්වීමෙන් හෝ ඉවත් කරනු ලැබීමෙන් මණ්ඩලයේ පත් කළ සාමාජිකයකු විසින් ධුරය හිස් කරන අවස්ථාවක, අමාත්‍යවරයා විසින්, 4 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඇ) ඡේදයේ විධිවිධාන සැලකිල්ලට ගෙන, ඒ සාමාජිකයාට අනුප්‍රාප්ත වීම සඳහා වෙනත් යම් තැනැත්තකු පත් කරනු ලැබිය හැකි ය. ඒ සාමාජිකයා වෙනුවට එසේ පත් කරනු ලබන යම් සාමාජිකයකු, ඔහු අනුප්‍රාප්ත වන සාමාජිකයාගේ ධුර කාලයෙන් ඉකුත් නොවී ඇති කාලය තුළ ධුරය දැරිය යුතු ය.

6. රෝගාතුර වීම, අබලතාවට පත්වීම හෝ මාස තුනකට නොඅඩු කාලයක් ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හේතුකොට ගෙන, මණ්ඩලයේ පත් කළ සාමාජිකයාට ස්වකීය ධුරයේ කාර්ය ඉටු කිරීමට තාවකාලිකව නොහැකි වන අවස්ථාවක, ඒ අබලතාව පිළිබඳව අමාත්‍යවරයා වෙත ලිඛිතව දැනුම් දීම ඒ සාමාජිකයාගේ යුතුකම වන්නේ ය. එවිට, 4 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඇ) ඡේදයෙහි විධිවිධාන සැලකිල්ලට ගෙන, අමාත්‍යවරයා විසින්, ඒ සාමාජිකයා වෙනුවෙන් ඒ කාලය තුළ ක්‍රියා කිරීම පිණිස වෙනත් යම් තැනැත්තකු පත් කරනු ලැබිය හැකි ය.

7. මණ්ඩලයේ සාමාජිකයන්ට අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන යම් පාරිශ්‍රමිකයක් මණ්ඩලයේ අරමුදලින් ගෙවනු ලැබිය හැකි ය.

8. (1) මණ්ඩලයේ සභාපතිවරයා පැමිණ සිටී නම්, මණ්ඩලයේ සෑම රැස්වීමකම මූලාසනය දැරිය යුතු ය. එවැනි යම් රැස්වීමකට සභාපතිවරයා පැමිණ නොමැති විටක ඒ රැස්වීමට පැමිණ සිටින සාමාජිකයන් විසින් ඔවුන් අතුරෙන් එක් සාමාජිකයකු, ඒ රැස්වීමේ මූලාසනය දැරීමට තෝරා පත් කර ගනු ලැබිය යුතු ය.

(2) මණ්ඩලයේ යම් රැස්වීමක් සඳහා ගණපූරණය සාමාජිකයන් පස් දෙනකු විය යුතු ය.

(3) මණ්ඩලයේ යම් රැස්වීමක මූලාසනය දරන තැනැත්තාට තමාගේ ඡන්දයට අතිරේකව තීරණ ඡන්දයක් ඇත්තේ ය.

(4) මේ ඡේදයේ විධිවිධානවලට යටත්ව, මණ්ඩලයේ රැස්වීම් හා ඒ රැස්වීම් වල දී කටයුතු කිරීම පිළිබඳ කාර්ය පටිපාටිය, මණ්ඩලය විසින් විධිමත් කර ගනු ලැබිය හැකි ය.

9. මණ්ඩලයේ කිසි ම ක්‍රියාවක්, තීරණයක් හෝ කටයුත්තක් මණ්ඩලයේ යම් පුරප්පාඩුවක් තිබීමේ හෝ එහි යම් සාමාජිකයකු පත් කිරීමෙහි ලා යම් දෝෂයක් තිබීමේ හේතුව නිසා ම පමණක් අවලංගු වන්නේ යයි සලකනු නොලැබිය යුතු ය.

10. (1) මණ්ඩලයේ මුද්‍රාව මණ්ඩලය විසින් නිශ්චය කොට නිර්මාණය කරනු ලැබිය හැකි අතර, එය මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන යම් ආකාරයකින් වෙනස් කරනු ලැබිය හැකි ය.

(2) මණ්ඩලයේ මුද්‍රාව, මණ්ඩලය විසින් කලින් කල තීරණය කරනු ලබන යම් තැනැත්තකුගේ භාරයේ විය යුතු ය.

(3) මණ්ඩලයේ මුද්‍රාව, මණ්ඩලයේ අනුමතය ඇතිව හා මණ්ඩලයේ සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිට දී හැර කිසිම සාධන පත්‍රයකට හෝ ලේඛනයකට තබනු නොලැබිය යුතු අතර, ඒ සාමාජිකයන් දෙදෙනා තමන් පැමිණ සිටි බවට සාක්ෂි වශයෙන් ඒ සාධන පත්‍රයට හෝ ලේඛනයට තම අත්සන් තබනු ලැබිය යුතු ය.

(4) මණ්ඩලයේ මුද්‍රාව තබා ඇති සාධන පත්‍ර හා ලේඛන පිළිබඳ රෙජිස්ටරයක් මණ්ඩලය විසින් පවත්වාගෙන යනු ලැබිය යුතු ය.

11. (1) රෝගාතුර වීම හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හේතුකොට ගෙන සභාපතිවරයාට ස්වකීය ධුරයේ කාර්ය ඉටු කිරීමට තාවකාලිකව නොහැකි වන්නේ නම්, ඔහු වෙනුවෙන් ක්‍රියා කිරීම පිණිස අමාත්‍යවරයා විසින් මණ්ඩලයේ වෙනත් සාමාජිකයකු පත් කරනු ලැබිය හැකි ය.

(2) අමාත්‍යවරයා විසින් කිසිම හේතුවක් නොදක්වා සභාපතිවරයාගේ පත් කිරීම අවසන් කරනු ලැබිය හැකි ය.

(3) සභාපතිවරයා විසින්, අමාත්‍යවරයා අමතා යවනු ලබන ලිපියක් මගින් කවර හෝ විටක සභාපති ධුරයෙන් ඉල්ලා අස්විය හැකි ය. ඒ ඉල්ලා අස්වීම, අමාත්‍යවරයා විසින් ලිඛිතව භාර ගනු ලැබීමේ දී, බලාත්මක විය යුතු ය.

(4) (2) වන හා (3) වන අනු ඡේදවල විධිවිධානවලට යටත්ව, සභාපතිවරයාගේ ධුර කාලය, මණ්ඩලයේ ඔහුගේ සාමාජිකත්ව කාලය විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.